## වසර 2500 පසු
## මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.

# සත්‍ය ධර්මය ඇවදි විය

(13 වන වෙළුම)

# බුද්ධ ඥාණය අචින්ත්‍යයි

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදයේ ප්‍රකාශනයකි.

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.


## බුද්ධ ඥාණය අචින්ත්‍යයි


බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම්
Email: buddothpado@gmail.com
Tel +94 703 518 747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2 884701

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com / www.buddothpado.lk

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

1. Buddothpado -
   https://youtube.com/@buddothpado

2. Buddothpado Aryanwahanse -
   https://youtube.com/@buddothpadaaryanwahanse

3. Buddothpado Unity -
   https://youtube.com/@BuddothpadoUnity

4. Buddothpado English -
   https://youtube.com/@weeejj

5. Buddothpado Tamil -
   https://youtube.com/@buddothpadotamil

6. Buddothpado Zoom Discussion -
   https://youtube.com/@Zoom-up2ik

7. Buddothpado Night Discussion -
   https://youtube.com/@BuddothpadoNightDiscussi-zj2bk

8. Buddothpado English Zoom Discussion -
   https://youtube.com/@BuddothpadoEnglishZoom

9. Buddothpado Radio Damma Discussion -
   https://youtube.com/@BuddothpadoRDD

10. Buddothpado TV Damma Desana -
    https://youtube.com/@BuddothpadoTVdammaDesana

## නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිලිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ) සත්‍යඥාණ අවබෝධය
2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)

    2.1 කෘත්‍යඥාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම

    2.2 කෘතක්ඥාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව (සත්‍යඥාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී**

   බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඥාණය = සත්‍යඥ්ඥාණය)

   - සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
   - සිත මායාවක් බව අවබෝධකරගැනීම සිත යනු අරමුණම බව දැනගැනීම
   - අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
   - ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම අරමුණම ආත්මය බව දැකීම
   - ශූන්‍යතා අවබෝධය
   - ත්‍රිවිද්‍යා දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්‍යාඥාණය)
     (සිත = අරමුණ = ආත්මය)

   1.1 කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසාදැන ගැනීම

   1.2 නැවත නැවත සද්ධර්මශ්‍රවනය

   1.3 යෝනිසෝමනසිකාරය

   1.4 ධම්මානුධම්ම ප්‍රතිපදාව
   **ශ්‍රාවකයා උට්ඨාන වීර්යෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.**

**බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල් කැටයක පමණ දෙයකි.**

- සක්කාය දිට්ඨි ප්‍රහානය මෙතැනදී සිදුවේ.
- ශ්‍රාවකයා ආර්‍ය භූමියට පිවිසේ.

2. අපරභාග ප්‍රතිපදාව

2.1. **කෘත්‍යඤාණය** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම - (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

2.1.1. **අරමුණෙහි සත්‍ය දැකීම**; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම(යථාභූත ඤාණය = යෝනිසෝ මනසිකාරය)

2.1.2. **අරමුණෙහි සත්‍ය දැක මිදීම**
අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

2.1.3. **ත්‍රි විද්‍යා ප්‍රායෝගිකව අත්දැකීම** (පුබ්බේනිවාසානුස්සති ඤාණය, චුතුපපාත ඤාණය, ආසවක්‍ෂය ඤාණය)

2.2. **කෘතඤාණය (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඤාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති**

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශූන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිර්ජීවෝ ශූන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක්

නැති තැන චේතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශුන්‍යත, අප්ප්‍රනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශුන්‍යතාවයි.

"නිස්සත්වෝ නිජ්ජීවෝ ශුන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤානස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙම ධර්ම දානය තුළින් ජනිත වන්නා වූ
පුණ්‍ය ශක්තිය මාගේ දෙමව්පියන්ට සහ
බිරිඳගේ දෙමපියන් ඇතුළු සංසාරගත සියලුම
ඥාති මිත්‍රාදීන්ට අනුමෝදන් වේවා.
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



කවරෙක් හෝ ආත්මභාවය
නැමැති පොළොවත්, සතර අපායත්
දෙව්ලොව සහිත වූ මේ
මිනිස් ලොවත් මනා කොට
දැනගන්නේද? දක්ෂ මාලාකාරයෙකු
මල් තෝරා රැස් කරන්නාක් මෙන්
සෘතවත් ආර්යය ශ්‍රාවකයා
සත්තිස් බෝධිපාක්ෂික ධර්මය
මනාව අවබෝධ කොට කෙලෙස්
මාරයා පරදවා ආර්යය භූමිය
ස්පර්ශ කර ‘භයානක සසර
ඕඝයක’ නිමාව සනිටුහන්
කරන්නාක් මෙන් සසරේ ගිනිගෙන
දැවෙන දුක් විඳින ලෝසතහට,
සියලු ස්කන්ධයන් මැඬ පැවැත්වූ
ඒ උතුම් මුනිබවට පත්වී
සදා අමරණීය වන්න
‘බුද්ධෝත්පාදයෙන් විවර වූ
ශ්‍රී සද්ධර්මය හේතුවේවා!”

# පටුන


01 ඔබ කවුද? ඔබ ගැන සත්‍යය
ඔබම දැකගන්න නුවණින් 13

02 සිතුවිලි සසරෙන් මිදී
සදා අමරණීය වන්න 43

03 මේ සිතේ සත්‍ය නොදන්නා තාක්,
දෑස් තිබුණත් ඔබ අන්ධයි 74

# 01

# ඔබ කවුද? ඔබ ගැන සත්‍යය ඔබම දැකගන්න නුවණින්

**උපාසිකාව:** ඔබ වහන්සේ දේශනා කළ නාම-රූප විග්‍රහය කිසිම තැනකින් අසන්න නොලැබුණු විශිෂ්ට පැහැදිලි කිරීමක් ආර්යයන් වහන්ස ඔබ වහන්සේ පැහැදිලි කළ විදියට පුද්ගලයෙක් හැදෙන විදිය, භව ගමන හැම දෙයක්ම කම්පන හරහාම සිද්ධ වෙන බවයි මට තේරුම් ගියේ. එතකොට ආර්යයන් වහන්ස අපේ විමුක්තියත් ඒ විදියටම නොනවතින චක්‍රය අපට අවසන් කරන්නත් පුළුවන් ඒ වගේම ස්ථානයකින් කියන එක තමයි මට තේරුම් ගියේ ආර්යයන් වහන්ස. මම හරිද? ආර්යයන් වහන්ස ඒ පිළිබඳව තවත් පැහැදිලි කිරීමක් තවදුරටත් ලබා ගන්න පුළුවන්ද ආර්යයන් වහන්ස?

**ආර්යයන් වහන්සේ:** පුළුවන්. දීර්ඝ පැහැදිලි කිරීමක් තියෙනවා. මෙතෙක් සමාජයට හෙළි නොකළ කාරණා තියෙනවා. සමහරවිට මේක නොවැටහෙන්න පුළුවන්. නාමීය රූපයක් කියන කොට, ඇත්තටම අපි නාමය කියන්නේ චිත්ත ස්වභාවය. එතන මේ 'පටිඝසම්පස්සයට අධිවචන සම්පස්සය' කියන තැන, ස්පර්ශය කියන තැන මේ වචන ගොඩක් විතරයි, මේක ප්‍රායෝගිකව අත්දකින කොට තමයි හොඳටම පේන්නේ. ඇස කියන ආයතනවල සෙන්සස්වල ක්‍රියේෂන් (Criyesion) එක මොකක්ද කියන එක හරියට හොඳින් නුවණින් දකින කෙනෙකුට විතරයි පේන්නේ. මේක සාමාන්‍ය මනුෂ්‍යයා හිතන මට්ටම අබිබවා යන මහා නුවණකට හසුවෙනවා මේ හැමදේම. විශාල විග්‍රහයක් තියෙනවා සාමාන්‍ය මනුෂ්‍යයා හිතන්නැති කාලයේ වැලිතලාවට සැඟව ගිය පරම සත්‍යය කියන එක විශාල පර්යායක් තියෙනවා කතා කරන්න.

ප්‍රායෝගිකව අත්දකින්නේ නැතිව කිසි කෙනෙකුට වැටහෙන්නේ නෑ කිව්වට. ප්‍රායෝගිකව අත්දකින දෙයක් මේ කියන්නේ. **නමුත් මේක අත්දකින්න බෑ. සාමාන්‍ය මනුස්සයෙකුට අභ්‍යන්තරයේ ඥානයන්** අවදි වෙලා තියෙන්න ඕන. 'ධම්ම චක්ඛුසයට' අසුවෙනවා. මහා නුවණකට මේ මුළු කාරණා හසුවන්නේ. එන්නේ කිරණයක් කිව්වට, කිරණයක් කියල එහෙම දේකුත් නැහැ. අපට ඇහෙන පෙනෙන දැනෙන දේ නෙමෙයි ඇත්ත කතාව.

අපේ මේ "ෆයිව් සෙන්සර්" ඇත්තටම දුර්වලයි. මනුස්සයා හිතන් හිටියට ඇස දියුණුයි, කන දියුණුයි කියල කිව්වට එහෙම නෙවෙයි, මනුස්සයො දුර්වලයි. මනුස්සයා දකින්නේ මායාවක්. මේක වෙනින් මානෙන කතාවක්. පාන්පිටිවල අංශු වගේ තියෙනවනේ, මේක උපමාවට ගන්නේ මේක දැකගන්න ඕන නිසා. පාන් පිටි ගොඩක් අපි ගත්තොත්, පාන් පිටිවල තියෙන හැම අංශුවක්ම සමානයි කියලා ගත්තොත්, මේ වාතය කියලා, තව උපමාවක් ගත්තොත් වායුගෝලය කියන්නේ පාන් පිටි අංශු. උදාහරණයක්. මේ පිටි ගෝනියක් වගේ කතාවක්. මේ වායුගෝලයේ මුකුත් නෑ නෙවෙයි. පිරිලා තියෙන්නේ පාන් පිටි අංශුවලින්, අංශුමය ස්වභාවයක්. විද්‍යාඥයන් "ඩාර්ක් මැටර්ස්" කියල කිව්වනේ විද්‍යාව පැත්තෙන්. මේ මුළු විශ්වයේම කතාව 'ඩාර්ක් මැටර්ස්' වලින් ගත්තත්, මේව උපකල්පන කිව්වට ඔබ පොළොවෙ පය ගහල ඇවිදිනවනේ. කොස් ගහ ගිනි තිබ්බොත් අළුවෙලා යනවනේ. ගිනි තිබ්බොත් මේ සේරම අළුවෙලා යනවනේ. මේවා උපමා නෙවේ. 'ප්‍රැක්ටිකල් ප්‍රායෝගික පැත්ත මේකෙ තියෙන්නේ. ඔබ මේක නුවණින් දකින කොට, ඔබ ප්‍රායෝග කව අත්දකින දේ ම තමයි මේක. ඔබ ප්‍රායෝගිකව අත්දකින කොට මේක පේන්න ගන්නව, නුවණට හසුවෙනවා ඔබේම අභ්‍යන්තරයේ ඔබට නොදැනෙන. අපි අහලා තියෙනවා අපේ ස්නායුවලින් ටිකයි අපි පාවිච්චි කරන්නේ 10%ක් විතර. කෝටි ගාණක නියුරෝන 90%ක් අවදි වෙලා නෑ. "**ධම්ම චක්ඛුසය" කියන්නේ අභිඥ්ඥා ඤාණ කියන්නේ මෙන්න මේ 90% අවදි වෙනවා.** ඔබ දන්නෑ ඔබ කොයිතරම් බොළඳ ද කියලා. 90% ද ලොකු 10% ද ලොකු. ඔබ ඔය සිතිවිල්ලෙන් කොච්චර හිතුවත් බොහොම පොඩ්ඩයි. **හැබැයි මේ ඥානයන් අවදි වුණොත් ඔබට දැනෙන දේ තමයි මේ එන්නේ, හිතන දේ නෙමෙයි. දැනෙන දේ කවදාවත් හිතන්න බෑ.**

හැබැයි දැනෙන දේ වචනවලට අරගෙන කියන්න පුළුවන්. ඔන්න ඤාණවල ස්වභාවය. ඒක දැනෙන එකක් හිතන එකක් නෙමේ. මේකෙ අති සියුම් කතාව තමයි අපි ගත්තොත් එහෙම දැන් ඔබේ අත පිච්චෙනවා. ඔබේ අත පිච්චෙන කොට එන වේදනාව ඔබ කොහොමද? කියන්නේ කාටවත්. පුළුවන්ද කියන්න මේකයි වේදනාව කියලා. එයාත් පිච්චෙන්නම ඕන නේද? ඔබට දැනෙන දේ දැනෙන්නෙ. දැන් ලුණු රහ කියන්නත් බෑනේ. **අභිඥේඥා ඤාණ මෙන්න මේ වගේ. දැනෙන දේ කියන්න වචන ගන්න බෑ, තේරුම් කරන්නත් බෑ.** හැබැයි දැන් ඔබ දන්නවා මොකක්ද වෙන්නේ කියලා. **අභිඥේඥා ඤාණවල අධිගත සමාධි විදර්ශනා සමාධි හොල්ලන්න බෑ. එය පරම සත්‍යයක්.** ලුණු වගේ දැනෙන එකක්. දැනුණාට පස්සේ කවුරු මොනව කිව්වත් වැඩක් නෑ. ඒක සත්‍යයක්. දැනෙන එක පොතේ ලියන්න පුළුවන්ද? ඔබට තණ්හාව පොතේ ලියන්න පුළුවන්ද? ඔබට නිවන පොතේ ලියන්න පුළුවන්ද? ඔබ බොළඳයි, ඔබ ඔක්කොම පොතෙන් හොයනවා. මේ විදර්ශනා සමාධි පොතෙන් හොයන්න බෑ. මාපිටක සම්පදාය පොතේ තිබ්බට පිළිගන්න බෑ, ඒකට හේතුව ඒක ලියන්න බෑ. **විදර්ශනායානියෙක් බිහිවෙලා මේ ග්‍රන්ථ ධුරයෙන් විදර්ශනා ධුරය මතු කරගෙන මෙය ප්‍රායෝගිකව අත්දැකල හෙළිකළොත් එදාට ගෞතම බුද්ධ ශාසනේ නැවත පිබිදෙනවා.** කාලයේ වැලිතලාවට සැඟව ගිය ඒ පරම සත්‍ය නැවත අවදි විය කිව්වේ මෙන්න මේකයි. මේක තමයි මේ මොහොතේ වෙන්නේ විදර්ශනායානිකයෙක් ගාම්භීර පරම සත්‍ය "ධම්ම අභිඥේඥාවෙන්" ලෝකෙට හෙළි කරනවා.

මේ සත්‍ය දේශනා කරනවා විතරයි, මේ සත්‍යය කුමක්ද? කියලා. මේ සේරම අභිඥේඥා දේශනා. අපි උපමාවක් පෙන්නුවේ මේ ඔක්කොම පාන් පිටි 'ඩාර්ක් මැටර්ස්' කියලා, ගැලැක්සියේ තියෙන්නේ එකම අංශු කියලා. මේ ඔක්කොම වායුගෝලයේ පාන් පිටි ගෝනියක් වගේ. මේක අංශු ගොඩක්. ඔබ හිතනවට වැඩිය ලොකු කතාවක් තියෙනවා. ඔබට තියෙන්නේ 'සෙන්සස්' 5යි. අපි දේශනා කළේ ඔබට ප්‍රකෝටි ගාණක 'සෙන්සස්' තියෙනවා කියලා සෙන්සස් 5කින් මොනව කරන්නද? මේ ප්‍රකෝටි ගාණක සෙන්සස් මොනවාද? මොනවද මේ 'සෙන්සස්' 5. කෙනා කෙනාගේ ස්වභාවයටයි සියල්ල සිද්ධ වෙන්නේ. මේක ඇතුළේ විශාල පර්යායක් තියෙනවා. ඒක මතු කරලා ගන්න බලමු. දේශනා වෙනව නම්

ඉතාම භාග්‍යයක්. ඔය නාම-රූප, **රූපය දැනෙන්නේ නාමයෙන් කියන එක, දැනෙන එකෙන් මේක විග්‍රහ වෙන්නේ කියල කියන එක. මේක අතිසියුම් ගැඹුරු ඥාණයකට අත්දැකීම් ඔස්සේ මතුවෙනව මිසක්, මේක කියන්න ක්‍රමයක් නෑ. නම් කරන දේ නාමයයි කියලා, නාමයට සියල්ල යටයි කියලා සූත්‍රවල තියෙනවා. එතකොට ඒක නම් කරන්න වෙන්නේ ශබ්දෙන්. ඒකට සියල්ල යටයි, ඒකයි ශබ්ද-වර්ණ කියලා කිව්වේ.** නිකන් නෙමෙයි.

ශබ්දයයි-වර්ණයයි එකතු වෙන එකකුත් නෙමෙයි, **මේ දැනෙන දේ "වේදනා සංඥා චේතනා ඵස්ස-මනසිකාර - "අයං වුච්චති නාමං වදේති" කිව්වේ ඇයිද කියන එකත් මේක ඇතුළේම තියෙනවා.** ඒක තමයි පුංචි දරුවට 'ෆෝන්' එක දුන්නම, පුංචි දරුවට දැනෙනව, **දැනෙන එක තමයි වේදනා- සංඥා.** එතනින් තමයි පුංචි දරුවට හඳුනා ගැනීම ඊගාවට එන්නේ. පේනව නෙමෙයි හිතනවා. හිතන්නේ දැනෙන එකෙන් තමයි. රූප්පනය පවා එහෙමයි, වර්ණ හැඩතල පවා එහෙමයි. කම්පනය වන 'ස්පාර්ක්' වන වේගෙට, කම්පනය වන වේගෙට මැවෙන්නේ. වේගෙට එන ආරෝපණේ, 'ආරෝපණ බලය' 'ස්පාර්ක්' එක. ඒකෙන් උපදින කරන්ට් එක වගේ බලය, ආරෝපණය. ආරෝපණය කියන්නේ අර චුම්බකයට යකඩ ඇලෙනව වගේ බලයක්, අර **'ස්පාර්ක්' වන වේගෙට එන 'කම්පන බලය තමයි 'සාස්‍රවීය' ස්වභාවය.** අපි දන්නවා ධර්මය තුළ තියෙනවා. **"සාස්‍රව", "ආස්‍රව", "ක්ෂීණාස්‍රව" කෙලෙස් හටගන්න හේතුවෙන්නේ ඔය කම්පන බලය.** මේ පාන් පිටි අංශු කියල අපි කිව්වේ, 'ඩාර්ක් මැටර්ස්' කියල විද්‍යාඥයෝ කියපු ඒවත් හොඳින් ගළපමු. මේ අංශු නිකන් එකක්වත් තියෙනවා නෙවෙයි, අපිට මේව පේන්නෑ. මේ අංශු සේරම විවිධාකාර විපරිණාම මේ අංශුවල සිද්ධ වෙනවා.

දැන් අපි ඇහුවොත් එහෙම සිරස කොහොමද? බලන්නේ. ටීවී චැනල් එකේ සිරස අල්ලන්න 'සර්කිට්' එකට එන්න ඕන. සර්කිට් එකට කොහොමද? එන්නේ. දැන් අපිට පේනවද එළියේ තියෙනව රේඩියෝ නාලිකා කොච්චර තියෙනවද? TV නාලිකා කොච්චර තියෙනවද? ෆෝන් Calls කොච්චර එනවද? ඔය hand phone එකට කොහෙන්ද සිග්නල් එන්නේ. ලංකාවේ හැම කෙනෙක් ළඟම phone තිබ්බොත් කෝටි දෙකක

phone තියෙනවා. කෝටි දෙකකට 'නම්බර්' තියෙන්න ඕන අංක, ඒ නම්බර් වලට සිග්නල් තියෙන්න ඕන. කොහේද ඕව තියෙන්නෙ. කොහේ හරි තියෙනවද? ඇයි සීමාව ඉවරද? හිතන්න බැරිද ඉන් එහාට. තරංග ගැන කියනවා. **කම්පන ගැන කියනවානම්, හැම වර්ණයක්ම කම්පනයක්. හැම ශබ්දයක්ම කම්පනයක්. හැම ගන්ධයක්ම සුවඳක්ම, රසක්ම, උණුසුමද, සීතලද සේරම තියෙන්නේ කම්පන. වේව්ස්වලින් තියනවා තරංගවලින් තියනවා හර්ට්ස් 20යි 20000 යි කියනව. ආලෝකය, වර්ණය, රශ්මිය සේරම නූතන විද්‍යාවේ තරංගවලින් කියනවා. මේව සංකල්ප නෙවෙයි. ඔබ ප්‍රායෝගිකව අත්දකිනදේ කියන්නේ මේ උපමා ඇතිව කියන්නේ මේ සිද්ධ වෙනදේ.**

ප්‍රකෝටි ගානක 'සෙන්සර්' තියෙනවා කියන්න හේතුවක් තියෙනවා. ඔය 'සෙන්සර්' එකෙන් කරන්නේ මොකක්ද? 'සෙන්සර්' එකෙන් කරන්නේ 'චක්ඛු විඤ්ඤාණය' තියනකොට, ඔය ප්‍රසාදය 'ස්පාර්ක්' වෙන වේගෙ ටනේ මැවෙන්නේ නාභිගත වෙනව. වීදුරු ඝනකයක් වීදුරු ප්‍රිස්මයක් හිරුඑළියට ඇල්ලුවම වර්ණ 7 ක් මැවෙනව වගේ පේනව වගේ, මේ නාභිගතවීම 'අක්ෂි කාචය' තුල සිද්ධවෙනවා යෂ්ටි සෙලවල කේතු සෙලවල. සමහර අයට රතුපාට පේන්නෑ, සමහර අයට කොලපාට පේන්නෑ. එහෙම වෙන්නේ කොහොමද? මේ නාභි ගතවන සකස්වන යෂ්ටි සෙලවල කේතු සෙලවල, අඩුව නේද මේ. මේක එළියේ තියෙනවද? එළියේ තියෙනව නම් එයාට රතුපාට පේන්නැති වෙන්නේ, එහෙනම් එයාට රතුපාට පේන්න ඕන. එයාගේ **ඇස මෙතන සකස්වෙන එකක්, එළියේ කොහේවත් තියෙනවද?** නෑනේ. එහෙනම් එයාට කොළපාට එළිය පේන්න ඕන. මොකද කොළපාට පේන්නැත්තේ එහෙනම් මෙතනින් සකස් වුන් නැත්නම් පේන්නෑනේ. එහෙනම් **මේ පේනව කියන එකක්වත් එළියේ තියෙනවද? අපිට බාහිර අත්දැකීමක් කවදාවත් ලැබිල නැහැ. මේ විඤ්ඤාණවල මැවෙන එකක් කොහේවත් තියෙනව නෙවෙයි. මෙන්න මෙතන තමයි සම්පූර්ණ පර්යාය සිද්ධවෙන තැන.**

එතකොට මෙතන මේ කම්පනය, අපි ගත්තොත් අපේ ආයතන 5 මෙතනින් ඉස්සෙල්ලා බලමු මෙතන මොකක්ද වෙන්නේ කියල. බැලුවම පෙනෙයි ඔබ දන්නව අභිඥ්ඥා දේශනා නම් අභිධර්මය ගැඹුරුතැන්

ප්‍රායෝගික පැත්තෙන් පෙන්නන්නේ. 'ශුද්ධාෂ්ඨකය' කියන්නේ මොකක්ද, වර්ණ ගන්ධ රස ඕජා පඨවි ආපෝ තේජෝ වායෝ. වර්ණ ගන්ධ රස ඕජා 4 යි, පඨවි ආපෝ තේජෝ වායෝ 4 යි 8යි. දැන් 'ශුද්ධාෂ්ඨකය කියන්නේ එක අංශුවයි. එක අංශුවේ මේ 8 ම තියෙනවා. එක අංශුව කියන්නේ පාන්පිටි ගොඩේ එක **අංශුවක් අපි ගත්තොත් ඒක නිකන් තියෙනව නෙවේ. 'වයිට්බ්‍රේට් වෙවී තියෙනව කියලයි කිව්වෙ. එක නිකන් තියෙනවා නෙමයි. මේ වායුගෝලේ මොකක්වත් නිකම් නෑ. එකක්වත් නිකන් නෑ අහුවෙලා තියෙන්නේ කම්පනයට.** මොකක්ද වෙන්නේ මෙතන. මේ ඇස කියන 'සෙන්සර්' එක මොකද කරල තියෙන්නේ එක ආකාරයට කම්පනය, එකම අංශුවයි තියෙන්නේ මුළු ගැලැක්සියේම මුළු විශ්වයේම තියෙන්නේ නූතන විද්‍යාඥයින්ගේ අදහසත් ඒකමයි. එකම අංශුවයි 'ඩාර්ක්ටැටර්ස්' කියල කිව්ව 'ඩාර්ක් එනජී කියල කිව්ව එක එක විදියට විග්‍රහ කරනව. මේ විග්‍රහ කරන්න ඕන නිසා මෙහෙම කිව්වට මේකෙ මෙහෙම දේකුත් නෑ. මේකෙ අදියරවලට යනව ගැඹුරින් ගැඹුරට. අපි පාන්පිටි කියල අංශුවලට ගත්තට එහෙම දේකුත් නෑ. කෙළවරට යනකොට තවත් වෙනස් වෙනවා. මෙතනින් කථානොකර ගැඹුරට යන්න බෑ. මෙතනින් කථා කරනව.

මේ බුදුන් වහන්සේ 'ශුද්ධාෂ්ඨකය' බෙදල බෙදල පෙන්නනවනේ කුඩාම ඒකකය 'ශුද්ධාෂ්ඨකය' කියල. ඒකනේ මේ පෙන්නන්නේ. එතකොට මේ ශුද්ධාෂ්ඨකය කියන්නෙ 'ශුද්ධ අෂ්ඨක අටක්.' වර්ණ, ගන්ධ, රස ඕජා, පඨවි, ආපෝ, තේජෝ, වායෝ අපිට තියෙන 'සෙන්සස්' ගැනයි කතා කරන්නේ. වර්ණය අපේ ඇහැට හසුවෙන්නේ, ශබ්දය කනට හසුවෙන්නේ, ගන්ධය නාසයට, රස දිවට ක්‍රියේට් වෙන එක, එතකොට හම. අපේ මේ හම හැදිල තියෙන්නේ මේක 'මයික්‍රො ටෙලස්කෝප්' එකකින් බැලුවොත් අර ලොකු කරල බලන එකකින් එහෙම බැලුවොත් මීවදය වගේ. හැම සෛලයක්ම 'සෙන්සර්' එකක්, මුළු හංකඩේම එහෙමයි. හංකඩේ 'සෙන්සර්' එක අපි කතා කරන්නේ උණුසුම සීතල තද ගතිය, මේ තමයි සෙන්සර් වෙන්නේ හමට. **ඇස, කන, නාසය, දිව, කය. මේ ටිකෙන් තමයි 'මන සෙන්සර් එක හැදෙන්නේ.'** මෙතන වෙන දේ බලමු. 'පඨවි, ආපෝ, තේජෝ, වායෝ' කියන්නේ 'උණුසුම, සීතල, තද ගතිය, හමට දැනෙන 'සෙන්සර්' එක. වර්ණ, ගන්ධ, රස, ඕජා කියන්නේ

පස්වෙනි එක. මොකක්ද අපට දැනෙන මේ අට. අපේ 'සෙන්සස්' ටිකයි. මේ එකම අංශුවේ ගැලැක්සියේ. එකම අංශුව කියන්නේ වෙනස් වෙන්නෑ පාන් පිටි ගොඩ වගේ. දැන් ඒ අංශුව උඩට යටට කම්පනය වෙන කියල හිතන්න. දැන් මේ එක 'සෙන්සර්' එකක උඩට යටට කම්පනය වන එක අහුවෙන්නේ. එක 'සෙන්සර්' එකක හම්බ වෙන්නේ **හරහට** කම්පනය වන එක. තව 'සෙන්සර්' එකක අහුවෙන්නේ **එක් එක් ආකාර**, ඒකයි කිව්වේ කම්පනය වන ආකාර ප්‍රකෝටි ගාණක ස්වභාවයක්. මේකේ ත්‍රිමාණ නෑ. ත්‍රිමාණවලට එහා දෙයක්.

ඇස ගත්තොත්, ඇස 'ඉන්ඩිකේට්' කරන්නේ අර උඩට යටට කම්පනය වන අංශු. එතකොට කන **'ඉන්ඩිකේට්' කරන්නේ එකම අංශුවේ හරහට කම්පනය** වන ඒවා. අපි කියන්නේ 'ශබ්දය.' සාමාන්‍යයෙන් ඔබ උපමාවකින් මේක දකින්න. මේ අංශුව කම්පනය වන රටාව. තව ආකාරයකට කම්පනය වන එක තමයි උණුසුම, සීතල, තද ගතිය, ගඳ, රස සේරම. මේ 'සෙන්සර්' **වලින් අල්ලන්නේ එක ආකාර. කම්පන සේරම අර 'සෙන්සර්' එකට අහුවෙනවා.** අනිත් ඒවගෙන් අඩු වැඩිවීම් තියෙනවා සිද්ධ වෙනවා. ඒකෙත් අර හරහට කිව්වට, හරහට අඩුවෙන් එනවා හරහට වැඩියෙන් එනවා. ඒකෙත් ආකාර කීපයක් විශාල පරාසයක් නුවණට හසුවේවි. **'කොන්ටම්' කියන්නෙත් තරංග කියන්නේ 'වේව්ස්' කියන්නේ කොහේවත් යන ඒව නෙමෙයි. මෙතන කම්පනය, මේ අංශුව මෙතන කම්පනය එච්චරයි. එකට එකක් සම්බන්ධ නිසා, එකකට එකක් හේත්තු වෙලා වගේ දිගටම කම්පන සිද්ධ වෙනවා. එක අංශුවයි කම්පනය වෙන්නේ. අංශුව කම්පනය වෙනවා. ඊගාව අංශුව කම්පනය වෙනව.** අපි වතුරට ගලක් දැම්මම වළලු හැදෙනවා. 'ස්වීම් පූල්' එකට පැන්නොත් හරි මැද්දෙ තියෙන ජල අංශු යනව නෙවෙයි. මැද්දෙ වළලු හැදිල කෙළවරේ ජල අංශු තමයි ඉස්සිල වදින්නේ. අංශු කොහේවත් ගියේ නැහැ. එතන එතන කම්පනය මේක මේ භෞතිකව අපිට දකින්නට ලැබෙන සිද්ධියක්. ඒ උපමාව ගත්තම හොඳට පේනව මෙන්න මේ වගේ 'සිස්ටම්' එකක් මෙතනත් වෙනවා. මේ 'සිස්ටම්' එක තමයි මුළු විශ්වයේම තියෙන්නේ මේ 'සිස්ටම්' එක. මේක ත්‍රිමාණ නැතුවව තව තව මානවලට යනව. වළලු කියන්නේ එක මානයක් නේ. මේකෙ කතාව ඉතාම ගැඹුරුයි. අපි මේ කතාව ගත්තේ **අපේ මේ සසර**

**ඕසයේ කතාව ඔක්කොම මේ කතාව ඇතුළෙ තියෙනව.** මේක ලිහන්නයි මේක ගත්තේ. මේක අභිඥ්ඥා දේශනයක්, ඉතාම ගැඹුරුයි. හැබැයි යනකොට යනකොට තේරෙයි හිතා ගන්න බැරි පර්යායකට යනව මේ කම්පන ස්වභාව.

එතකොට මේ 'ශුද්ධාෂ්ඨකය' කියන්නේ රශ්මිය, සීතල, තද ගතිය හංකඩේ හරි, 'සෙන්සර්' ටික කම්පනය. මෙතනින් ශබ්දය විදියට කම්පනය වන එක, වර්ණය විදියට කම්පනය වන එක. දැන් ලේ කැටි දරුවා ඉපදෙන කොට මේසේද පුටුවද ඇඳ ද කියලා මුකුත් දන්නෑනේ. නමුත් ඒ දරුවට කවුරුහරි ශබ්දයක් දානකොට අර ශබ්දේ, අපි කිව්වා ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනවා කියලා. එතකොට ඇහැට ආපු කම්පනය අර ආලෝක හැඩතලය එතන එළියේ නෙවෙයි. මේ එක කතාවක්වත් එළියේ නෑ. එළියේ කියල ගන්නත් එපා, තැනක් කියල ගන්නත් එපා. මේක හොඳින් දකින්න මෙතන වෙන්නේ මොකක්ද කියලා. මේක මෙතනම 'ක්‍රියේෂණ් එකක්. මේක දකින කොට තේරෙයි. එතකොට අර එක් ආකාරයකට කම්පනය අහුවෙනවා. ආලෝක හැඩතලේ. තව ආකාරයක කම්පනය, ශබ්දයක් දානවා. ශබ්දයක් දාන කොට අන්න තව ආකාරයකට කම්පනය, අන්න මේ කම්පනයයි අර කම්පනයයි විපරිණාම වෙනව. එතකොට මේ කම්පනයයි අර කම්පනයයි එකතු වෙලා දෙකම එකට එකතු වන කම්පනයක් හැදෙනවා. ඒ අංශුව මේ අංශුව දෙකම එකට එකතු වුණු කම්පන.

බලන්න **උඩට යන කම්පනයයි හරහට යන කම්පනයයි දෙකම එකට එකතු වුණ කම්පනයක් වුණොත් මොකද වෙන්නේ,** අන්න ශබ්ද තරංගයයි වර්ණ තරංගයයි එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනව කිව්වේ. **ඒ කම්පනය මොකක්ද?, අන්න පුටුව. එතනින් පස්සේ දිගටම පුටු කම්පනය වෙනව. ඊට පස්සේ පුටු තියෙනව. ඊට පස්සේ මේස, ඇඳ, අඹගහ, නාගහ, ඉර, හඳ, ලංකාව, ඇමරිකාව, අම්මා, තාත්තා ඔක්කෝම තියෙන්නේ ශබ්ද වර්ණ අර කම්පන එකතු වෙච්ච එක.** ඒ කම්පනය මේ කම්පනය එකතු වෙලා වෙන කම්පනයක් හැදුණා. හැබැයි මේකෙ මේ කම්පන දෙක විතරක් නෙවේ එකතු වෙන්නේ. මෙතන මේ 'සෙන්සස්' ටික සේරම අපි දන්නවා චිත්තානුපස්සනාවේදී අධ්‍යයනය

කරද්දී පංචායතනය එකතු වෙලා තමයි මනායතනය හැදෙන්නේ කියල. මේක වේගය වැඩිකමට තත්පරයට කෝටි වාරයක් වේගෙන් මේ කම්පන වේගය ගැන කතා කරනවා. අභිධර්මයේදී කියනවා 'චිත්තවීදි' කියලා. **චිත්තක්ෂණ කෝටි ගාණක් පහළ වෙලා තමයි ඒක හට ගන්නේ. ඔය තමයි සිතේ කතාව. ඕකෙ වේගය, කම්පන වේගය තමයි පෙන්නන්නේ. ඒක අධික වේගයක් ඉන්ද්‍රිය ගෝචර නෑ. ඒ කම්පනය අධික වේගයක්. අපි ගත්තොත් එහෙම ගහක් වුණත් පස් කැටයක් වුණත් ඒක අධික වේගයකට තමයි ඝනවෙලා තියෙන්නේ.** කම්පනය අධික වේගයක්. ඒ අධික වේගය තමයි පස්කැටේ තියෙන්නෙ. අපි ගත්තොත් එහෙම ඕක රත් කරොත් මොකද වෙන්නේ, කොස්ගහ කෑලි කෑලි කපල ගිනි තිබ්බොත් දුමක් වගේ නැතිවෙලා යනවා. කම්පනවල වෙනස විතරයි වෙන්නේ. වෙන එකක් නෑ මේකේ. මේක වායුවක් වගේ නැතිවෙලා යන්නේ කොහේද? **මේ කම්පනවල 'සිස්ටම්' එකක් විතරයි මේකෙ 'ක්‍රියේට්' වෙන්නේ.** වෙන එකක් නෑ.

අපට පේන 'මෙටීරියල් වර්ල්ඩ්' එක ගැන අපි කතා කරේ. මේ 'සිස්ටම්' එක නුවණට හසුවෙනව මොකක්ද මේ වෙන්නෙ කියන එක. දැන් මේ චිත්ත කම්පනය, **එතකොට චිත්ත කම්පනයට යටින් මේ දැනෙන එකක්, තියෙනව වගේ දැනෙන එකක්, තියෙනව වගේ දැනෙන එක ඉත්ථභාවයක් තියෙනවා.** මේ කම්පන දෙක එකතු වෙලා චිත්ත කම්පනයක් එනකොට ඒක විපරිණාම වෙනව, ඉත්ථභාවයකුත් එක්කල ඇවිල්ල තියෙන්නේ. දැන් අපි දන්නව 'ස්පීඩ්' එකෙන් 'ස්පාර්ක් එකේ වේගෙට ආලෝකය වගේ පේන එක. කොහේවත් තියෙන එකක් නෙමෙයි. ඇහැ ගලවල දැම්මොත් කළුවරයි. මේ 'සෙන්සර්' එක නැත්නම් නෑ. **'සෙන්සර්' එකටයි අහුවෙන්නේ. ඒකයි මේ ඇස 'සෙන්සර්' එකක් කියල කිව්වේ ප්‍රසාදයක්.** මෙන්න මේක බැලුවොත් එහෙම 'ස්පාර්ක්' වෙන වේගෙට තමයි ආලෝක හැඩතලේ තියෙනව වගේ දැනේනනේ. තියෙනව වගේ දැනෙන එකත් එක කම්පනයක්. ඒ ආලෝක හැඩතලේ තියෙනව වගේ දැනෙන එකක් එනව. ඒක තමයි විඤ්ඤාණයේ කතාව කිව්වේ. චක්ඛු විඤ්ඤාණය කිව්වේ. ඒක තමයි මේ **ස්කන්ධ විග්‍රහයෙන් පෙන්නුවේ මේක රුප්පනයෙන් කම්පනයෙන්, ඒක තමයි රූපේ රුප්පනය කම්පනය, ඒකමයි වේදනාව දැනීම, ඒකමයි සංඥාව නිරූපණය, ඒකමයි සංඛාරා**

**කිව්වේ වේගෙටයි. සංඛාර නැතුව විඤ්ඤාණයක් නෑ. වේගයක් නැතුව දෙයක් වගේ දැනෙන් නෑ. ඔක්කොම ස්කන්ධය තියෙන්නේ වේගෙට. ස්කන්ධය කියන්නේ වේගය.** ඒකට දෙයක් වගේ දැනෙනව. දෙයක් වගේ දැනෙන එක, එක ආකාරයකට කම්පනය වන වේගෙනේ. දෙයක් වගේ දැනෙන එක, ඒක ඒකනෙවේ. ඒක වෙන කම්පනයක්.

මෙතන ආරෝපණය හැදෙනවා කියන්නේ **ප්‍රාසවීය ස්වභාවය**, මෙතන ආරෝපණයකුත් එනව. මේ ආරෝපණය තමයි මෙතන බලයක් වගේ, ඒක තමයි මේ විඤ්ඤාණය ගැන කතා කරන්නේ. **චක්ඛු විඤ්ඤාණය කියන්නේ ඒක පේනව වගේ දැනෙන එක.** හැබැයි ඒකට එකතු වෙලා නෑ ශබ්ද මුකුත්, ඒත් දැනීමක් තියෙනවා. එක මොහොතේ අර කම්පනවලට සේරම එකට එකතු වෙන එක නිසා තමයි. ඒ ස්වභාවයෙන්ම එනව. කැලේ හිටියත් 'ටාසන්' වගේ හූ කියන ඒව හරි අර ශබ්ද වර්ණත් එක්ක එකතු වෙනව. ඒක මොකක්ද කියන එක අදාළ නෑ. මොකක්ද අර පැත්තේ කම්පනය වෙන්නේ අර ඒ කම්පනයයි මේ කම්පනයයි එකතු වෙනව. ශබ්ද වර්ණ විතරක් නොවෙයි ගඳ සුවඳ පවා ඕකෙ එකතු වෙලා තියෙන්නේ. උණුසුම, සීතල, තද ගතිය පවා තියෙනවා. අම්මා නැති වුණාට පස්සේ අම්මගෙ සුවඳෙනුත් අම්මගෙ රූපේ මැවෙනවා. ශබ්ද එනකොටත් අම්මගෙ රූපේ මැවෙනවා. රූපේ මැවෙන කොටත් අම්මා කියන ශබ්දය එනවා. අපි නොහිතුවට **මේ 'සෙන්සර්' ඒ මොහොතේ අර දිට්ඨ සුත මුත කියල බුදුන් වහන්සේ පෙන්නුව. මේකෙ දිට්ඨ සුත ප්‍රධානයි කියල පෙන්නුව. හැබැයි මේකෙ මුකුත් නැතුව නෙවෙයි සේරම එකට එනව.** අර දෙක ප්‍රකට නැත්නම් අපි හිතමු අන්ධ කෙනෙක් කියල, බීරි කෙනෙක් කියල. ඒ දෙක නෑ අනිත් ඒවයින් එනව 'ඉත්ථභාවය' 'ඉත්ථ සංඥාව' ඉතාම සියුම් ඉතාම ගැඹුරුයි මේ කතාව.

ඒ කියන්නේ 'ඉත්ථභාවය, දෙයක් වගේ දැනෙන එක. එතන ආවේ වර්ණ හැඩතල අතන ආවේ ශබ්දය. එතනත් විඤ්ඤාණය දෙයක් වගේ දැනෙනව. 'සෝත විඤ්ඤාණය', චක්ඛු විඤ්ඤාණය, ඝාන විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය මේ 'සෙන්සර්' ගැනයි කතා කරන්නේ. ඔය කම්පනය වෙනින් එකක්, 'ඉත්ථභාවය', 'ඉත්ථ සංඥාව' **සංඥාව කියන්නේ මේ කම්පනය. සංඥාවමයි විඤ්ඤානය,**

**සංඥාවමයි ස්පාක් එක, සංඥාවමයි කම්පනය 'ඉත්ථ සංඥාව' නෙමෙයි, මේ දෙක එකතු වෙන කොට ඒක වෙන එකක්. දැන් ශබ්දෙත් නෙමෙයි වර්ණෙත් නෙමෙයි දෙයක් වගේ දැනෙන එක විඤ්ඤාණය, කරන්ට් එක වගේ ගතියක්.** මේක ප්‍රායෝගිකව අත්දකින එකක් මේක ඇතුළේම තියෙනව. මේ තමන්ටම අත්දකින්න ලැබෙන එකක්. මේකෙ දැනෙන ගතිය සිතුවිලිවලින් ආවේ නැති වුණාට මෙහෙම දෙයක් වෙනව, තමන්ට දැනෙන එක හොඳට සියුම් කරල ඥානෙට ගත්තොත් මේ ටික අසුවෙනව. ඒ දෙක එකට එකතු වෙලා එනකොට පුටුව දෙයක් වගේ දැනෙන එකක් එනව. **ඒකයි අපි කිව්වේ පුටුව දෙයක් වගේ දැනෙන එක වෙනයි, පුටුව දකින එක වෙනයි කියල. පුටුව දැකපු බවට සිහියක් තියෙනව, පුටුව දෙයක් වගේ දැනෙන එකටත් සිහියයි මේකෙ වෙනයි කියල. ඊට පස්සේ බලන්නකෝ පුටුව දෙයක් වගේ දැනෙන සංඥාව, ඒ සංඥාව අර දෙකම නෙවෙයි.**

මේ 'හේතුඵල' දහමේ හේතුව ඵලයට අයිති නෑ. කිරිවලින් ගිතෙල් හැදුවට ගිතෙල් කිරිවලට අයිති නෑ. කිරිවලින් චීස් හැදුවට, චීස් කිරි නොවේ. ඒක වෙනයි මේක වෙනයි. **හැම තිස්සෙම 'ඵලය' වෙනයි. මුලින් ආවේ ශබ්දයි වර්ණයි. දැන් එන්නේ 'ඉත්ථ සංඥාව' 'ඉති රූපං' කියන එක.** 'ඉත්ථ සංඥාව' එන්නේ, ඊට පස්සේ ආත්ම සංඥාව බවට පත්වෙනවා. **මේක දැන් පුටුව නෙවෙයි ආත්ම සංඥාව**. මේක දැන් දෙයක් වගේ දැනෙන ගතිය වෙනයි, දෙයක් වගේ දැනෙන තැන තමන් ඉන්නවා වගේ දැනෙන එක වෙනයි. ඉත්ථ සංඥාවමයි ආත්ම සංඥාව. **'ඉත්ථ' සංඥාවමයි 'ආත්ම සංඥාව' නිරූපණය. ඒකයි කිව්වේ එක් ආකාර අන් ආකාරයකට පත්වෙනව, 'ඉත්ථභාව', 'අඤ්ඤථාභාව' කිව්වේ ඔය නිසයි.** මේ විශාල පර්යායක් අතිසියුම්ව දේශනා කිරීමේ හැකියාව. බුදුන් වහන්සේ කියනව ඇට්ටේරිය වනය වගේ තිබ්බට, මේ අතට ගන්න කොළ ටික වගේ ටිකයි දේශනා කළේ කියලා. ඔබට නාමරූප කියන්නේ අතට ගත්ත කොළ ටික වගේ පොඩි කතාවක්. මේකෙ දැනෙන ගතිය, ආත්ම සංඥාව හැදෙන හැටිනේ පෙන්නන්න ගියේ. ආත්ම සංඥාව මොකක්ද, කොහේවත් තියෙන එකක් නෙමේ. **ශබ්දෙක මුකුත් තිබුණෙත් නෑ. වර්ණෙක මුකුත් තිබුණෙත් නෑ, ශබ්ද වර්ණ කියල දේකුත් නෑ ඒක කම්පනයක් විතරයි. ඒකයි 'රුප්පනය' කිව්වේ. 'රුප්පන්තියෝ ආයුසෝ**

**රූපං' කිව්වේ 'චත්තාරෝච මහා භූථානං' කියල කියන්න පුළුවන් මේ කම්පන ටික සේරම.** පඨවි, ආපෝ, තේජෝ, වායෝ වෙන කොහේද තියෙන්නේ. 'චත්තාරෝච මහා භූථානං' වුණාට 'රුප්පන්තියෝ ආයුසෝ රූපං' කියන කෑල්ල නැතුව, 'පසල්' එකේ කෑල්ලක් අඩු වුණාම කොහොමද? හදා ගන්නේ 'පසල්' එක.

'ඉති රූපං සමුදයෝ' වෙන්න නම් 'ඛජ්ජනීය වග්ගෙත්, 'මහා නිධාන සූත්‍ර, 'අභිසංකරණ සූත්‍ර' 'සංචේතනා සූත්‍ර' මේ සේරම එකට එකතු කරගන්න ඕන. සේරම ටික හොඳින් ගළප ගන්න ඕන. එතකොට ඒක පේන්න ගන්නව. හැබැයි මේක සූත්‍රයෙන් හොයන්න බෑ, ප්‍රායෝගික පැත්තෙන් තමයි මේක හසුවෙන්නේ. අසුවුණාට පස්සේ සූත්‍ර ටික පේන්න ගන්නව. **හැබැයි අපි අත් දකින දේ කියන එක තමයි, ඕකෙ ප්‍රත්‍යක්ෂය කියන්නේ.** එහෙම නැතුව පොතේ තියෙන ඒව කියන්න බෑ. නමුත් මේකෙ ප්‍රත්‍යක්ෂව දැකපු දෙය, පොතෙන් බලල කියනව. ඒක වෙනයි මේක වෙනයි. දැන් ඔතන ශබ්ද වර්ණ නෙමෙයි අපට දැනෙන්නේ, අපි ඉන්නව වගේ. දැන් පුංචි දරුව ඉපදෙන කොට, ඔබ වුණත් ඉපදෙන කොට ඔබට දැනුණෙ නෑ ඔබ ඉන්නව වගේ. ඒ සංඥාව තිබුණේ නෑ, ඒක පස්සේ 'ක්‍රියේට් වුණා. ඒකයි **ඇසේ උපතයි, උපත කිව්වේ** 'ස්කන්ධානානං පාතිභාවෝ -ආයතනානං පටිලාභෝ - අයං වුච්චති ජාති' කිය 'ජාති ධම්ම' සූත්‍රයේ පෙන්නුව කෙළින්ම ඇසේ උපතයි, උපත කියලා. අන්න 'චක්ඛුං නිච්චංවා' - 'අනිච්චං භන්තේ, එහෙනම් එය ආත්මයක් ද?, 'නෝ හේතං භන්තේ' කියල ඔය කතාව මුළු ධර්මය නිවනම තියෙන්නේ. **මේ ඇස විතරයි මෙතන තියෙන්නේ දකින්න 'චක්ඛුං නිච්චංවා' කියන තැන. මුළු පර්යායම දිහා හොඳින් අධ්‍යයනය කරන කොට හොඳින් පේන්න ගන්නවා. ප්‍රායෝගික පැත්ත හොඳට පේන්න ගන්නව. අන් ආකාරයකට කම්පනය වන එක ඔක්කොම වෙන ආකාරයකට කම්පනය වන එක.**

දැන් අපි ගත්තොත් එහෙම සුදු කොළයක තිතක් තියෙනව, මේ මුළු ධර්මයෙම තියෙනව කිව්වේ ඕක. හිස් කොළේ තිත කියලා, අපි කිව්වා මුළු 'ගැලැක්සියම' මේක වගේ අරගෙන තිතත් අංශුවක් වගේ අරගෙන ඊට පස්සේ ඒක කම්පනය වන එක - **හැබැයි මේ තිත මේ**

**අංශුවයි. මේ අංශුව කම්පනය වුණොත් එතනයි මෙතනයි අන්ත දෙකක් ඔබට පේනවනේ. එතනයි මෙතනයි කම්පනයක් තියෙනව නම් එතන පේනව, ඒ 'මජ්කෙධ සූත්‍රයට එන්නේ. "යො උභො අන්තේ විදිත්වාන - මජ්කෙධ මන්තාන ලිප්පති - තං බ්‍රෑහි මහාපුරුසෝ සේද සිබ්බනි මජ්කෙධා' කියන එක ඔය අංශුව තුළ මුළු ගැලැක්සියේම කතාව.** "බිග් බෑන්" එකට පෙර ස්වභාවය කිව්වේ ඔය 'මජ්කෙධ සූත්‍රයේ.' නාසා ආයතනය හොයනවා අඟහරු ග්‍රහයාගේ මිනිස්සු ඉන්නවද කියලා. තව ග්‍රහලෝකවල මිනිස්සුඉන්නවාද කියල හොයනවා. නාසා ආයතනය හොයන්නේ අපේ විඤ්ඤාණය, චක්ඛු විඤ්ඤාණය කියන්නේ එක ආකාරයක් විතරයි. ඔය කම්පන ආකාරයෙන් තමයි මේ ඔක්කොම බලන්න යන්නේ. එතකොට ඒ කම්පනය විතරයි අහුවෙලා තියෙන්නේ. දැන් කෝටි ප්‍රකෝටි ගාණක කම්පන වලින් එක කම්පනයයි අහුවෙන්නේ. තව කම්පනයක් ශබ්දය කිය එකෙන් අහුවෙයි. වෙන කම්පන මේ නාසා ආයතනයට හොයන්න බෑ. ඒකට හේතුව මේක ඉන්ද්‍රිය ගෝචර නෑ. බලන්න ඕන මිනිහෙක්. මිනිහෙක් බැලුවොත් මිනිහයට පෙන්නේ මේ ආයතන ටික විතරයි. මිනිහට පේන්නෑ ඉන් එහා. ඉන් එහා දකින්න ආයතන නෑ 'සෙන්සස් නෑ. ඒ නිසා මේ වගේ ආයතන 5ක් කොහේ හරි තියෙනවද කියලා හොයන්නේ.

මීට වැඩිය කම්පනවල, මීට වැඩිය පරාසයක් විශ්වය තුළ තියෙනව. දැන් සත්තු ගත්තොත් මීට වැඩිය 'සෙන්සස්' තියෙනවනේ. 'විකිරණ' සත්තුන්ට තියෙනව. ඔබේ මේ 'ඕරා' එක **මේ උණුසුමත් එක්කල ශරීර කූඩුවේ, ඔබට කේන්ති ගිය වෙලාවක ඔබේ 'ඕරා' එක වෙනස් වෙනව. කළුපාට වෙනව. 'ඕරා' එක ඔබේ ඇසට කනට නාසයට හමුවෙනවද? 'ඕරා' එක හසුවෙන් නෑ.** සත්තුන්ට මේක හසුවෙනවා. අපේ උරහිසේ කුරුල්ලා ඇවිල්ලා වහන කොට, අපි දන්නව මේ කුරුල්ලා අපේ 'ඕරා' එක දකිනව. කුරුල්ලා දන්නව කිසිම හානියක් නෑ කියලා. ඒක කුරුල්ලට හොඳටම විශ්වාසයි. නැත්නම් කුරුල්ලා ඇවිල්ලා වහන්නේ නෑ. කුරුල්ලෝ වර්ග ඉන්නවා 'ඕරා' එක 'ඉන්ඩිකේඩ්' කරන. කැලේක ඉඳල කැලේක ඔය වගේ අත්දැකීම් ලබපු කෙනෙක් විතරයි දන්නේ සමනලයෙක් වැහුවත් හේතුව. මේ 'ඕරා' එක පේන සත්තු ඉන්නව. **අපේ ඇඟේ 'ඕරා' එක අපේ 'මයින්ඩ්' එක සම්පූර්ණ කූල් කරලා 'හාට්බීට්' එක**

**තුනී කරලා, අපේ හෘද ස්වන්දන වේගය අඩු කරලා රුධිර සංසරණය අඩුවෙලා අපේ 'හීට්' එක අඩුවෙලා සම්පූර්ණයෙන්ම 'ඕරා' එක 'චේන්ජ්' වෙනව කළුපාට සුදුපාටට 'චේන්ජ්' වෙනව. මේක සත්තුන්ට අහුවෙනවා. අපේ සිතුවිලිවල ස්වභාවය ඊට වැඩිය හොඳට කියන්න පුළුවන්. 'ඕරා' එකෙන්. චිත්ත කම්පනය තුළ තියෙන ඒ ස්වභාවය 'ඕරා' එකෙන් පෙන්නුම් කරනව, ජේන්නේ නැති වුණාට.** තව පැති ගොඩක් තියෙනව. අපි මේ 'සෙන්සර්' ගැනයි කතා කළේ.

ඇයි 'න්‍යෂ්ටික' බලාගාර පිපිරෙනවට අකමැති. න්‍යෂ්ටික බලාගාර පිපිරුණොත්, ඒක පිපිරෙන්නේ 'න්‍යෂ්ටිය.' දැන් මේ සෙල කුඩා කරල බැලුවොත්, න්‍යෂ්ටිය වටේ ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන කැරකැවෙනවනේ. ඒකමනේ විශ්වයේ පින්තූරේ තියෙන්නේ. පෘථිවිය වගේ සූර්යයා වටේ බ්‍රහස්පති කැරකෙන විදියමයි. 'මයික්‍රෝ' එකෙන් බැලුවොත් එහෙම, න්‍යෂ්ටිය වටේ ඉලෙක්ට්‍රෝන ප්‍රොටෝන කැරකෙන එකමයි රූපේ තියෙන්නේ. එකම කම්පන ස්වභාවය එකම කතාවක් මේකෙ හැමතැනම තියෙන්නේ. වෙන රූප අඳින්න බෑ, 'ගැලැක්සි' එකයි. මේ එක අන්තරේ එකම කතාව දිගුව ගොඩක් නෑ, මේ තියෙන්නේ කම්පනයේ කතාවමයි. දැන් මේ න්‍යෂ්ටියක් පිපිරුවොත් මොකද වෙන්නේ අන්න පරමාණු බෝම්බෙ කියනව. පරමාණු බෝම්බෙන් මොකක්ද කරන්නේ, ඔබ හිතනවට වැඩිය දෙයක් සිද්ධ වෙනව. **ඔබේ තියෙන ඔය 'සෙන්සස්' ටික ඔබ හිතනවට වැඩිය විකෘති ස්වභාවයකට ගිහිල්ලා, ඔය** RNA, DNA **ඔය අනුස්වභාව සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා 'සෙන්සස්' වෙනත් විදියකට සකස් වෙනව. එතකොට 'ඩයිනෝසෝර්'ලගේ ස්වභාවේ, නැත්නම් මේ 'සෙන්සස්' 5ට වෙනස්වුණු සත්ත්ව ස්වභාව බිහිවෙනව. එතකොට ශුද්ධාෂ්ඨකය කියන කතාව 'කන්සෙප්ට්' එක ඇතුළෙන් කුඩුවෙනව.** එතකොට 'දසාෂ්ඨක' ගන්න වෙනව. 'විසි ආෂ්ඨක' ගන්න වෙනව. 'තිස්ආෂ්ඨක' ගන්න වෙනව. ඔබ ඒව අරන් නැතුව ඇති.

හැබැයි මේ න්‍යෂ්ටික බෝම්බයක් ගියොත්, මේ න්‍යෂ්ටිය පිපිරුණොත් ඔබ කතා කරන 'සෙන්සස් සිස්ටම්' සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා, **වෙනස් 'සෙන්සස්' හැදෙනව. එතකොට ඔබ කියයි මිනිස්සු විකෘති කියලා. මිනිස්සු විකෘති වෙලා නෙවෙයි, ඒ තමයි සොබාදහමේ**

**'නේචර්' එකේ ස්වභාවේ. සොබාදහම කියන්නේ කම්පන 'සිස්ටම්' එකට.** ඒ කම්පන 'සිස්ටම්' එකේ ස්වභාවයනේ, 'සෙන්සස්' වෙනස් වෙනව. අපි මේ මුළු 'ගැලැක්සියම' පාන් පිටි ගොඩ වගේ කිව්වට මේකෙ තියෙනවා සමතුලිතතාවක්, මේක බිඳ වැටෙන්නේ නෑ. මේක සමතුලිත වෙලා තියෙන්නේ. වතුර නිශ්චල ජලය සමතුලිතයිනෙ. හැබැයි නිශ්චල ජලයට ගලක් දැම්මොත් හෙල්ලෙනවනේ, ආයිමත් සමතුලිත වෙනවනේ. **මෙන්න මේ වගේ, පාන් පිටිගොඩ වගේ තියෙන මුළු කතාවම සමතුලිත වෙලා තියෙන්නේ. මේකේ එක අංශුවක් හෙල්ලුණොත් ඔක්කොටම බලපානව. ඒක තමයි 'දස දහසක් ලෝක ධාතුව කම්පා වෙනව කියන්නේ, ඔබ හිතනව වෛරස් වසංගත, කොරෝනා වසංගත, ලෝක යුද්ධ එන ඒව ඔය එකක්වත් භෞතික 'මෙටීරියල් වර්ල්ඩ්' එකේ එකක් නෙවෙයි.** මේක වෙනම කම්පන ස්වභාවයකින් වෙනම පර්යායකින් පැහැදිලි කරන්න පුළුවන්. මැරෙන ඒව අනිත් අය විනාශ කරන්න හිතෙන ඒව කිසිකෙනෙක් මේව කරනව නෙවේ. දෙයියෝ කරනව නෙවේ. කවුරුත් කරනව නෙවේ. **'සිස්ටම්' එකේ තියෙන 'නේචර්' එකේ තියෙන්නේ. කම්පන 'සිස්ටම්' එක ඇතුළෙ මේක අවබෝධ කළාට පස්සේ විශාල පර්යායක් ඔබට අවබෝධය වෙනවා. ඔබට ඊළඟට වෙන දේ පවා පේන්න ගන්නව.**

මේව පැත්තක තියල බුදුන් වහන්සේ නිවන් මගට ගත්ත ටික විතරක් ගමු, නිවනට අනුගත. දැන් අපි සුදු කොළේ 'තිත' තිබ්බ කිව්ව. එතන 'මජ්ඣෙ සූත්‍රය' පෙන්නුව. 'මජ්ඣෙ සූත්‍රය' පෙන්නල කිව්ව මුළු විශ්වයේ මුළු 'ගැලැක්සියේම' කතාව මේකෙ තියෙනව කියල. අන්ත දෙකක් තිබුණොත් මැද්දෙ ශක්තියක් උපදිනවා. මේ අන්ත දෙකක් කියන්නේ ඒ කියන්නෙ කම්පනයක්, කම්පනයක් තියෙනවා කියන්නේ බලයක් තියෙනව කියන එක. දැන් ඉලාස්ටික් එකක් ඇද්දොත් මොකද වෙන්නේ, අනිත් පැත්තට ආරෝපණ බලයක් එනවනේ. **මෙතනත් අංශුව එහාට මෙහාට කරපු ගමන්ම මෙතන බලයක් උපදිනවා. කම්පනය කියන්නේ බලයක් තව විදියකින් බැලුවොත්. මෙතන තියෙන බලය කියන්නේ මොකක්ද? මේ කම්පනය. ඔබට අවසානයේ ආවේ ශබ්දෙත් නොවේ වර්ණෙත් නෙවේ ආත්ම සංඥාව.** දැන් මීට ඉස්සර තවත් දෙයක් තියෙනව සැඟවිලා. දැන් හැම තිස්සෙම අපි දකින්නේ කම්පනයක්. වර්ණය කියන්නෙත් අංශු කම්පනය. එතකොට ශබ්දය, ඝන්ධය, රස,

උණුසුම, සීතල, තද ගතිය ඔක්කොම කම්පන. **කම්පනයෙන් එහා දෙයක් මේ එක 'සෙන්සර්' එකකටවත් අහුවෙන්නෑ.** කම්පනය කියන්නේ අංශුව හැම තිස්සෙම එහාට මෙහාට දෝලනය. අංශුව එහාට මෙහාට වුණාම මේ බලය අපට දැනෙන්නේ මේ කම්පනය. මේ කම්පනය නිසා බලයකුත් තියෙනව මේ මැද්දේ. මෙතන තව කතාවක් තියෙනවා.

**හැම තිස්සෙම කම්පනය නොවුණ ස්වභාවය මොකක්ද? කම්පනය නොවුණ ස්වභාවය අර අවකාශය වගේ සිහිය. කම්පනය ස්වභාවය තමයි එතෙන්ට එතෙන්ට ගියා නම්, ඒකේ නිරූපණය හැම තිස්සේම කම්පනය නොවුණ ස්වභාවයටයි අසුවන්නේ, ඒ කියන්නේ සිහියටයි.** කම්පනය කියන්නේ හැම තිස්සේම නිරූපණය, නිරූපණය හැම තිස්සෙම හසුවුණේ සිහියටයි. ඒකයි අපි පෙන්නුවේ සිහිය කියන්නේ කම්පනය නෙවෙයි. කම්පනය හැම තිස්සෙම සිතුවිලි. සිතුවිලිවලට එහා ගිය සිහියටයි සිතුවිලි අසුවෙන්නේ. **ඕනම එකක් කම්පනයක් දැනීමක් සිහියටයි අසුවෙන්නේ.** මොකක්ද මේ සිහිය කියන්නේ, සිහිය කියන්නේ අංශු කම්පන නොවුණ ස්වභාවය. අංශු කම්පන නොවන ස්වභාවයට අහුවෙනවා, අංශු කම්පන වෙච්ච ගමන් මහා නුවණට හසුවෙනවා. **කම්පනය වෙච්ච ගමන් අසුවෙනවා කම්පනය නොවුණ ස්වභාවය, සිහියට අසුවෙනවා කියන්නේ ඕකයි.** හොඳින් මේක නිරීක්ෂණය කරන්න. දැන් ආත්මය හැදෙන හැටි දැනගත්තා කම්පනයක් කියලා. ඒකත් 'ඉත්ථ සංඥාව' අන් ආකාරයකට 'ආත්ම සංඥාව.' ඒකම තමයි දැන් කම්පනය වෙන්නේ. ඔබ ඉන්න බව ඔබට දැනෙනව. දැනෙන්නේ කොහේටද? සිහියටයි. එතකොට ධර්මය දැක්කම මොකද වෙන්නේ, මේ ටික දකිනවා. මේ ටික දැක්කම මෙතන ආන්තයක් තියෙනවද? නෑ. එතකොට මොකද වුණේ, මේකෙ බලය වුණේ ධර්මය නොදැකීම අර අංශුව එහාට මෙහාට වෙනකොට බලයක් තිබුණ මැද්දෙ. ඒ බලය තියෙන තාක්කල් මේක දිගටම යනවා.

කම්පනය ගත්තොත් අපි කියනවා විඤ්ඤාණය, දෙයක් නිරූපණය කරන තැන අපි ගන්නව විඤ්ඤාණය කියලා. අපි ගත්තොත් එහෙම සතෙක්ගේ විඤ්ඤාණය මනුස්සයාගේ විඤ්ඤාණය ගත්තොත්, සතාටත් දැනෙනවනේ මනුස්සයටත් දැනෙනවනේ. බල්ලටත් දැනෙනවනේ. පූසටත්

දැනෙනවනේ වඳුරෙක් ගත්තත් දැනෙනවනේ. අභිඥ්ඥා දේශනාවල ඔබට මේක පැහැදිලි කළා. **මනුස්ස ස්වභාවය කම්පන ස්වභාවය උපමා කළා රතු පාටට. මනුස්ස ස්වභාවය, විඤ්ඤාණ ස්වභාවය සකස් වෙන ස්වභාවය රාග, ද්වේෂ, මෝහ වැඩිවන ස්වභාවය පෙන්නුවා මෙරූන් පාට කියලා. එතකොට රතුපාට මෙරූන් වෙනව. මෙරූන් කියන්නේ තිරිසන් ලෝකේ. එකම මනුස්ස සත්ත්වයාට වෙන දේ මේ කියන්නේ.** එතකොට මනුස්ස සත්වයාගේ විඤ්ඤාණ ස්වභාවය සකස් වෙන ස්වභාවය රතු පාටයි. ඒක නිසා මනුස්ස ස්වභාවය කියල ගන්නව. කම්පනය, මේ **පංච ඉන්ද්‍රියට කම්පනය වන ස්වභාවය තුළ තියෙන්නේ රතුපාට.** අපි මේ හඳුන ගන්න උපමාවක් ගන්නේ. **රාග, ද්වේෂ, මෝහ වැඩිවෙනවා කියන්නේ අර අංශු දෙක අතර තියෙන බලය වැඩිවෙනවා. බලය වැඩිවෙනවා කියන්නේ, කෙළින්ම තිරිසන් ලෝකේ.** 'මානීය මක්කටෝ-අතිමානීය කුක්කුරෝ' මානය වැඩිවෙලා වඳුරෙක් වෙනව තව ටිකක් වැඩිවෙලා බල්ලෙක් වෙනවා. බල්ලෙක්ගෙ තියෙන 'රාග, ද්වේෂ, මෝහ කම්පනය වැඩියි. වඳුරගෙ කම්පනය ඊට වැඩිය අඩුයි. **මනුස්ස ශරීරය තිබ්බට මේ 'රාග ද්වේෂ මෝහ' ස්වභාවය වෙනස් කියන්නේ, මනුස්ස ශරීර කූඩුව තිබ්බට විඤ්ඤාණ ධාතුව එක් ආකාර වුණාට ඒක විපරිණාම වෙනව. ඒ වෙලාවේ හුස්ම ගියොත් අන්ත ගති නිමිති කම්ම නිමිති කම්පන ස්වභාවය කොයිවිදියටද සකස් වෙලා තියෙන්නේ, ඒ විදියට තමයි මෙතන හුස්ම ගියා මෙතන ඉවරයි. මොකවත් යන්නෙ නෑ. කොහේවත් යන්නෑ කවුරුවත් යන්නෑ විඤ්ඤාණය යන්නෙත් නෑ.** විඤ්ඤාණය කියන්නේ එතන දැනෙන ස්වභාවයක් විතරයි.

හැබැයි මේ කම්පනයට, ඔබ මෙතන සිරස අල්ලනවා. යාපනේ 'සිරස' අල්ලනවා ඇමරිකාවේ 'සිරස' අල්ලනවා. ඇමරිකාවේ එතන ඒ 'සර්කිට්' එක තියෙනව නම්, ඒ 'සර්කිට්' එකේ **අර අංශු කම්පනය අල්ලන්න බැරිද?** එතකොට මොකද වෙන්නේ ඒකේ යනව නේද 'සිරස.' **'දෙරණ' සර්කිට් එක ඇල්ලුවොත් අර කම්පනය ඇල්ලුවා කියන්නේ 'සුසර' කරනවා අපි කියනවා 'ෆ්‍රීකොන්ස්' කරනවා ටියුන් කරනවා. එතකොට මොකද වෙන්නේ එතන එනවා 'දෙරණ', මෙතන 'සර්කිට්' එකක් තිබුණොත් මොකද වෙන්නේ. ඒ අංශුව කම්පනය හදා ගන්නව. ඒ කම්පන සංඛ්‍යාතය අල්ල ගන්න එක තමයි ටියුන් කරනව කියන්නේ.** ඒත්

'සිරස' යනවා යාපනේ 'සිරස' යනවා. ඔබ මෙතන හුස්ම ටික යනකොට ඔබේ මෙතන කම්පනය, කම්පන ස්වභාවය අනුව ඊට පස්සේ කොතන හරි කලෙලක ගත්තොත් වඳුරෙක්ගෙ හරි බල්ලෙක්ගෙ හරි කලලෙම සකස් වෙනව. එතන 'සෙන්සස්' ටික වැඩ කරනව. 'සෙන්සස්' ටික වැඩ කරන කොට එතනත් එනව 'ඉත්ථි සංඥාවක්.' ආත්ම සංඥාවක්. **ඒ සංඥාවේ 'රාග, ද්වේෂ, මෝහ' වැඩි සංඥාවේ ස්වභාවය, මෙතන මෙයා හුස්ම යනකොට වැඩි සංඥා ස්වභාවය නම් දෙක 'ටෙලිපති' වෙනව. ඒ කියන්නේ ඇමරිකාවේ 'සිරස' ඇල්ලුවා වගේ.** යාපනේ 'සිරස' ඇල්ලුවොත් එතන හදාගෙන එතන ඉන්න එකක්, මෙතන හදාගෙන මෙතන ඉන්න එක. තව තැනක හදාගෙන එතන ඉන්නව. **එතන එක අවසාන හුස්ම යනකොට මෙතන එක සමානයි, අතන එතන තිබුණු කම්පන සංඛ්‍යාතය සමානයි.** මෙතන තිබුණ කම්පන සංඛ්‍යාතය සමානයි කියන්නේ මොකක්ද? **අහසෙ විදුලි කොටන කොට මෙහේ ජනලේ හෙල්ලෙනව වගේ මෙතන හුස්ම යනකොට අන්න 'අතිමානීය කුක්කුරෝ' අන්න බල්ලෙක් වෙලා ඉපදෙනවා.**

කතා වස්තුවල අපට හම්බ වෙනවා තාත්තා හංගපු රත්තරන් ටික, බල්ල කතා කරනවා සිටුවරයාගේ කවේ අන්න රත්තරං හම්බ වෙනවා. බුදුන් වහන්සේ පුතාට කියනවනේ මේ සිටුතුමා කියලා. අන්තිමට ඔප්පු වෙනවා. ඇයි බල්ලා යනවා අන්න තාත්තා හංගපු නිධානේ ළඟට. සංඛ්‍යාත සමානවෙලා ඉපදුණ ආකාරය. දැනුත් තියෙනව පත්තරවල පෙර භවය කියනව කියල පොඩි ළමයි. ඔබ ඒව ගණන් ගන්නෙ නෑ. අපි මේ ටික සිද්ධ වෙන ආකාරය බලමු. අපි කිව්වා මේ 'රතුපාට' කම්පන සංඛ්‍යාතය මේක මනුස්ස ස්වභාවය, ඒක 'රාග, ද්වේෂ, මෝහ' වැඩිවෙන කොට 'මෙරූන්' වෙනව කිව්වා. මෙයාගේ හුස්ම ගියොත් **'මෙරූන් පාට'** තියෙන්නේ **තිරිසන් සතාගාව**. තවත් 'රාග, ද්වේෂ, මෝහ' වැඩි වුණොත් **'මෙරූන් පාට' 'දම්පාට'** වෙනවා. එතකොට **ප්‍රේත ලෝකේ.** තවත් 'රාග, ද්වේෂ, මෝහ' වැඩි වුණොත් **'දම්පාට', 'කළුපාට' පැත්තට බරවෙනවා, අසුර ලෝකේ.** තව ටිකක් 'රාග, ද්වේෂ, මෝහ' වැඩි වුණොත් 'ආනන්තරීය' පාප කර්ම ඒ පැත්තට මේක යන්නේ, එතකොට **'කළුපාට' නිරයේ.** වර්ණෙට සිද්ධ වෙන්නේ 'රතු' මනුස්ස ලෝකේ 'මෙරූන්' තිරිසන් ලෝකේ මේ උපමා කියන්නේ. **ඔබේ හුස්ම යන්න කලින්**

**ඔබ මෙතන සකස් වෙලා ඉවරයි.** ඒකයි කිව්වේ 'දුටුගැමුණු' රජ්ජුරුවෝ අන්තිම හුස්ම ටික යනකොට මෙහේ මැව්ලා ඉවරයි 'දිව්‍ය ලෝකේ' **විඤ්ඤාණ මායාව ඇතුලේ, 31 ධාතුව මේ ඇතුලේ කතාව තියෙන්නේ.** නිවනට උපනිශ්‍රය වෙන්න මේ ටික වැදගත්.

දැන් අපි ගත්තොත් එහෙම ඔය කම්පනය 'රාග, ද්වේෂ, මෝහ' අඩුවෙන පැත්ත, ධර්මය දකිනව අන්න අනිත් පැත්තට එනව. ආකාර කීපයක් තියෙනවා. අපි කිව්වා 'ඝන සංඥා' සුකුම වෙනව කියල. **'සංඥා' ඝනත්වය වැඩිවෙන එක තමයි 'රාග, ද්වේෂ, මෝහ' වැඩිවෙන එක. 'ඝන සංඥා' කියන්නේ එතකොට ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන වගේ කරන්ට් එක, 'රාග, ද්වේෂ, මෝහ' කෙලෙස් ගින්න. කෙලෙස් ගින්න ඒක තමයි 'ඝන සංඥාව.' ඒක එතකොට තුනීවෙනව කියන්නේ 'රාග, ද්වේෂ, මෝහ' කෙලෙස් ගින්න තුනී වෙනව.** එතකොට 'රතුපාට' **'තැඹිලි පාට'** වෙනව. 'ඝන සංඥා' සුකුම වෙනව. 'රාග, ද්වේෂ, මෝහ' තුනී වෙනව, එතකොට **'දිව්‍ය ලෝකේ.'** තව තවත් 'රාග, ද්වේෂ, මෝහ' තුනී වෙනව, එතකොට **'බ්‍රහ්ම ලෝකේ.'** තවත් 'රාග, ද්වේෂ, මෝහ' ගින්න තුනී වෙනව. එතකොට අපි කියනව බුදුන් වහන්සේ පෙන්නපු පර්යාය. මෙයා මේ ධර්මය දකිනව **දෙයක් නැති බව ලෝකයක් නැති බව දකිනව, එතකොට කොහොමත් මෙයාට ඇලීම අඩුවෙනවා ගින්න අඩුවෙනව කිසිම දේක හරයක් නැතිවෙනව කියනව 'සුද්ධාවාස' කියල.** මෙයා මෙතන මේ ටික දැනගත්තට පස්සෙ මෙතන ලෝකයක් නෑ. මෙතන කම්පනයක් විතරයි තියෙන්නේ බොරුවක් කියලා, **'අකොප්පා චේතෝ විමුක්තිය'** පැත්තට යන්නේ 'ලෝක සංඥා' **බැස ගන්නේ නෑ.** 'ලෝක සංඥා' බැස ගන්නෑ කියන්නේ, ලෝකයක් පනවන්න බෑ. එතකොට පෙන්නනව 'සුද්ධාවාස' කියල. මේ තියෙන තැනක් එහෙම හොයන්න යන්න එපා. තියෙන තැනක් හොයන්න එපා කියන්නේ 'මහා පරිනිබ්බාණ සූත්‍රයේ' ඔබ දන්නවා ඉඳිකටු සිදුර තරම් කුඩා සිදුරකින් කෝටි ගණන් දෙවිවරු ආවා කියලා. කෝටි ගණන් දෙවිවරු කොහොමද එකම සිදුරකින් එන්නේ, මේකෙ තියෙන්නේ 'කරන්ට්' එක වගේ මේක තියෙන තැනක් පනවන්න පුළුවන්ද? **ඉන්ද්‍රිය ගෝචර ද ඔබේ ඇසට අසුවෙනවාද?**

මේක අතිසියුම් කතාව ඒ 'සුද්ධ' ස්වභාවය දෙයක් නැති බව දැනෙන ස්වභාවය, බුදුන් වහන්සේ තමයි 'සුද්ධාවාස' පනවන්නේ. 'රාග,

ද්වේෂ, මෝහ' තුනී වෙන ස්වභාවය තුළ අපි සුදුපාට කියල කිව්වා. අපි කිව්වා ඒ උපමාවේ රතුපාට තැඹිලි පාට වුණා. තැඹිලි පාට කහ පාට වුණා බ්‍රහ්ම ලෝකේ, 'කහපාට' සුදුපාට වුණා 'සුද්ධාවාස' වුණා. **ඊට පස්සේ අවර්ණයි. පොඩ්ඩක්වත් මේ රාග, ද්වේෂ, මෝහ දැනෙන ස්වභාවය කම්පන ස්වභාවයේ නිරූපණයක්, කම්පනය නැතිවෙන තැන අන්න 'අරහත්.' කම්පනයක් තියෙන්න ඕන වර්ණයක් හරි තියෙන්නෙ. මේ උපමාවක් විතරයි. අන්න එතනයි නිවන තියෙන්නේ.** අපි බලමු නිවන කියන්නේ මොකක්ද කියල අපි ගත්තොත් කම්පනය නොවන 'අකොප්පා චේතෝ විමුක්තිය', **'අකොප්පා චේතෝ විමුක්තිය' කියන්නේ අකම්පිතයි කියන එක.** අංගුව කම්පනය වෙන එකයි, හැම තිස්සෙම අපි ලෝකයක් දකින එක. 'විනෙය්‍ය ලෝකේ අභිජ්ජා දෝමනස්සානං' කියන්නේ, එහෙම නම් දුකින් මිදෙන 'අභිජ්ජා දෝමනස්ස' වෙන්නේ 'විනෙය්‍ය ලෝකේ' ලෝකයක් නැති වෙනව. **'ලෝකේ නැතිවෙනව කියන්නේ කම්පනවලින් පෙන්නන වර්ණ, ශබ්ද, ලෝක ටික සේරම විනාශ වෙනව. තව විදියකින් කියනවා නම් කම්පනය නැතිවෙනවා.** කම්පනය නැතිවෙන්නේ කොහොමද? කම්පනයට මොකක්ද හේතුව 'මජ්ඣෙ' සූත්‍රයේ තියෙන්නේ **'යො උභො අන්තේ'** 'අන්ත දෙකක් තියෙනව නම් මැද ශක්තියක්. **'යො උභො අන්තේ විදිත්වාන - මජ්ඣෙ මන්තා නලිප්පති' අන්ත දෙකක් නැත්නම් කොන් දෙකක් නැත්නම් මැදක් නෑ කිව්ව ඇලෙන්න. 'තං බ්‍රෑහි මහා පුරුසෝ සේද සිබ්බනි මජ්ඣාගා' කිව්වා. මේ හිත දකී නම් ඔහු මහා පුරුසයෙක් කියලා කිව්වා.** අන්න මේ මොකක්ද? කියන්නේ කම්පනය නොවන ස්වභාවය.

ඒ කියන්නේ මෙතන අංගුව කම්පනය වෙන්නෑ කියන එක, **අංගුව කම්පනය වෙන්නෑ කියන්නේ ඔබ ඔබට අහිමි වන තැන. ඔබ කියන්නෙම කම්පනයක්.** ඔබ ඉන්නව කියල දැනෙන්නෙම කම්පනයක්. ඔබ ඔබට අහිමි වෙනව කියන්නෙම, කම්පනය ඔබට දැනෙන්නෑ. එහෙනම් කම්පනයක් නෑ කියන එක. මේකෙ අංගුවක් නෑ, අංගුව කියන එක බොරුවක් වෙනව මේක උපමාවක් විතරයි. මේකෙ **'කම්පනයයි අල්ලන්න තියෙන්නේ මේක නැති කරන්න.** මොකක්ද මේ අංගුව කම්පනය වන 'බලය' මෙන්න මෙතනයි තියෙන්නේ. 'අජ්ජෝසාය තිට්ඨති යාරූපේ නන්දි තදූපාදානං භවෝ' කියන, ඔබට දැනෙනව නේද? ඉන්නව වගේ

දැනෙනව නේද? ඒකම නේද 'රාග, ද්වේෂ, මෝහ' කියන්නේ. ඒකම නේද කම්පනය ඒකම නේද? කෙලෙස් කියන්නේ, එතකොට ඔබට මේ ඔබ ඉන්නව වගේ දැනෙන එකම නේද? මේ අංශුව කම්පනය වන ස්වභාවය. අංශුව කම්පනය ස්වභාවය, මේ බලය තියෙනකම්ම අංශුව කම්පනය වෙනවනේ මේ **බලය තියෙනකම්ම සසර ඕඝයට හසුවෙනවනේ. ඒ කියන්නේ 'භව ඕඝයක්' තියෙනවනේ.** 'භව නිරෝධයක්' නෑනේ. මොකද්ද මේ **'භව ඕඝය, දෙයක් කියල දැනෙන එකනේ.** දෙයක් කියල දැනෙනව කියන්නේ කම්පනයක් තියෙනව කියන එකනේ. කම්පනයක් තියෙනව කියන්නේ 'සසර ඕඝයක් තියෙනව කියන එකනේ. දැන් මේකෙ ඉවරයක් වෙන්නෑනේ. කම්පනය වෙනවනේ දිගටම.

ඔබේ 'රාග, ද්වේෂ, මෝහ' කෙලෙස් සංසිඳුන දවසටනේ මේක කම්පනය නොවන ස්වභාවයට පත්වෙන්නේ. මේක කරන්න බැහැනේ කිසිම සත්ත්වයෙකුට. කරන්න මනුස්ස භවයක් ලබන්නත් ඕන නේ. මොන සතාටද පුළුවන් මේක අවබෝධ කරලා මේ ස්වභාවය දැකලා මේක මෙහෙමයි කියලා, මේක නොවෙන්න හේතුව මොකක්ද? මනුෂ්‍යය සත්ත්වයාගේ සුවිශේෂී ස්වභාවය මෙන්න මේකයි මේක අවබෝධ කිරීමේ හැකියාව තියෙනවා. මේකෙ ප්‍රායෝගික පැත්තෙදි කතාව ඔබට ජේන කතාව නෙවෙයි. **මේ 'සසර ඕඝයම' නවත්තන්න යන්නේ. මේ කම්පනය කොහොමද ඔබ හඳුන ගන්නේ. මේ කම්පනයේ තියෙන 'බන්ධන බලය', කම්පනය තව ආකාරයකට බන්ධනය බලගැන්විලා තියෙනව. 'ආත්ම සංඥාව' තියෙනවා. 'ඉත්ථි සංඥාවෙන්' බලගැන්විලා, ඊට පස්සෙ 'ආත්ම සංඥාවට' ආවා.** දැන් මෙතන 'ආත්ම සංඥාව' කොහොමද තියෙන්නෙ? 'රාග, ද්වේෂ, මෝහ' කෙලෙස්, අර ආරෝපණ බලය තියෙන්නේ. ආරෝපණ බලය අපි කිව්වා 'නන්දිය' කියල. 'යාරූපේ නන්දි තදූපාදානං භවෝ' කියල. 'තණ්හාව නමැති තා මා දිටිමි' - 'තාට නිවසක් සෑදීමට නැවත ඉඩ නොදෙමි' එතකොට බුදුන් වහන්සේ **ගැහුවේ මොකටද? මේ බලයටයි ගැහුවේ. මේ බලය අපි, 'රාග, ද්වේෂ, මෝහ' කියල ගන්නව 'නන්දිය' කියල ගන්නව. 'තණ්හාව' කියල ගන්නව.** මේ සේරම දැක්කොත් මොකද වෙන්නේ, එතකම්ම මේ බලය හැදිල තියෙන්නෙත් මේකෙන්මයි. 'බලය' හැදුණොත් මෙතනමයි.

'බලය' හැදුණු එක, 'බලය' නැති කරගන්න වෙන්නේ කොහොමද? මේ **'බලය' හැදුණේ 'දෘෂ්ටියක්' ඇතුලේ, ඔය දෘෂ්ටිය තමයි 'සසර ඕඝය.'** එතකොට **බලය කුඩුවෙන්නේ, අවිද්‍යාවයි දෘෂ්ටිය. දෙයක් තියෙනව කියල දැනෙන, දැනීමමයි, දෘෂ්ටිය.'** ඒක තියෙනකම් බලය තියෙනව, ඉන්නව කියල **දැනෙන තාක් කල් 'බලය' තියෙනව.** 'දෘෂ්ටිය' ඔබ ඉන්නව කියල දැනෙන සංඥාවට උඩින් 'ලාටුවක්' හැදිල තියෙනව 'දෘෂ්ටිය' තුළත්, ඔබට මේ ශබ්ද වර්ණ එකතු වෙලානේ එන්නේ. ඒකෙන්ම ආපු එකක් තමයි 'දෘෂ්ටිය' එනව, **ඒ කියන්නේ 'සක්කාය දෘෂ්ටිය.'** මේක කුඩු කරන්න බෑ ඒක කුඩුවෙනකම්. මේ 'බලය' නැති කන එක 'ඔපරේෂන්' එකක් තමයි, නැත්නම් මේ බලය නැති කරන එකත් ඔබ හිතන තරම් ලේසි නෑ. පුදුම 'මාර යුද්ධයක්' තියෙනව මෙතන. ඒකට හේතුව තමයි මුළු 'ගැලැක්සියේම' තියෙන සේරම, අපි කියමු 'නේචර්' එක කියලා. **අපි කිව්වා 'වීදුරු පෙට්ටියක' බෝල ටිකක් දාලා එක බෝලයක් හෙලෙව්වොත් ඔක්කොටම දැනෙනව කියල.** ඔබ මේක නැති කරන්න ගියොත් මේ 'නේචර්' එකේ බලය තුළ අර විඤ්ඤාණ ස්වභාව තුළම, සංඥාවක් සකස් වෙනව මූව නැති කරන්න ඕන කියලා. ඒක එන්නේ, අර කම්පනයෙන් එන්නේ. **මේ කම්පන සේරම 'බැලන්ස්' වෙලා තියෙන්නේ.**

බුදුවරයෙක් ලේසියෙන් පහළ වෙන්නෑ, ඒකට මේ සේරම සකස් වෙන්න ඕන. ඒකයි **2500 වසරක් ගියතැන මේක නැවතත් සකස් වෙන්නේ. ඒ පර්යාය අනුව සකස් වෙලා තියෙන්නේ දැන් මේ මේකට සුදුසු වෙලාව.** දැන් මේක එළියට ඇවිල්ලා කියනව කියන්නේ, දැන් මේ මේකට සුදුසු වෙලාව. දැන් මේක එළියට ඇවිල්ලා කියනව කියන්නේ, අනිත් අයගේ විඤ්ඤාණ ස්වභාවය කියන්නේ කම්පන ස්වභාවය. ඒ කම්පන ස්වභාවයට සංඥාවක් සකස් වෙනව. 'නේචර්' එකෙන්. මේක කවුරුත් කරනව නෙවෙයි. **'සිස්ටම්' එකේ 'බැලැන්ස්' එක නැති වෙනවා.** 'සිස්ටම්' එකේ 'බැලන්ස්' එක තියෙන්නේ 'නේචර්' එක, නැවත නැවත මේක පැටව් හදල කෙළින්ම ළමයි හදල දෙන එක තමයි 'නේචර්' එක දීල තියෙන්නේ. **'නේචර්' එක කියන්නේ මේ කම්පනයමයි. මේ විදියේ කම්පන සේරගෙම විශාල බලයක් තියෙනව.** ඔබ හිතනවට වැඩිය. මේ කම්පන ටික සේරම **'බැලන්ස්' නොවුණු විඤ්ඤාණවල ස්වභාවය. මිනිස් විඤ්ඤාණවල ස්වභාවය විසයි 'නේචර්' එකට වැඩිය. ඒක විසයි, මේ**

**'නේචර්' එකට දරා ගන්න බෑ. ඒක වැඩි වුණොත් 'නේචර්' එක විසින්ම නැති කරනව සියලු මිනිස්සු.** 'නේචර්' එක නැති කරනව කියන්නේ, මිනිහෙක් නැති කරනව නෙමේ. කම්පන 'සිස්ටම්' එක අවුල් වෙනව, මේ කම්පන සිස්ටම් එක ඇතුළේ නව න්‍යායාත්මක බල සංඥා විශාල සංඛ්‍යාවක් තියෙනව ඔබට නොහිතෙන. ඒ සිස්ටම් එක තුළ, 'සිස්ටම්' එකෙන්ම 'ක්‍රියේට්' වෙන එකක්. **කවුරුත් කරන එකක් නෙවෙයි, ඒ 'සිස්ටම්' එක ඇතුළේ ඒකෙන්මයි ලෝක විනාශය සිද්ධ වෙන්නේ. ඒකට හේතුව මිනිස්සුන්ගේ විඤ්ඤාණ ස්වභාවය විසයි, මිනිස්සු දන්නැති වෙන්න පුළුවන්.**

ඒකයි අපි කිව්වේ, මේ විශාල පර්යායක්, මේක කියන්න සුදුසුද දන්නෑ. මේක යට සැඟවිලා තියෙනවා. මනුස්ස ජනගහනය කෝටි 800ක්. **ඒකයි කිව්වේ ගෙදර ඉන්නව කියල ඊට වැඩිය සත්තු, තිරිසන් ලෝකේ ඉපදීම අතිවිශාලයි.** මේ ඔක්කොම කම්පන තියෙන්නේ. මේ කම්පන හැම එකකම **'බල තුලනයක්'** තියෙනව, මේ **'බල තුලනය' බිඳ වැටෙනවා, බිඳ වැටුණොත් ලෝක විනාශය සිද්ධ වෙනව.** ඒක කවුරුත් කරනව නෙමේ. ඒ විඤ්ඤාණ සකස් වෙනව, ඒ විඤ්ඤාණවලට **'මැසේජ්' එක එනව.** ඒ 'මැසේජ්' එක **කවුරුත් දෙනව නෙමෙයි, 'නේචර්' එකෙන්ම කම්පන වලින්මයි එන්නෙ. රෑ එළිවෙලා, එළිවෙන කොට ගහන්න හිතෙනව ඔක්කොම කුඩු කරන්න හිතෙනව. මේ කවුරුත් කරනව නෙවේ. 'සිස්ටම්' එකෙන් 'බැලන්ස්' වෙව. මේකේ බුදු කෙනෙකුත් පහළ වෙන්නේ එහෙම.** ඒකට හේතුව මේ කම්පනය නවත්වන්න **'නේචර්' එක කැමති නෑ.** මේ කම්පනය වන එකමයි 'නේචර්' එක බලාපොරොත්තු වෙන්නේ. මේකට **ගහන්න නම් අනිවාර්යයෙන්ම 'මාර යුද්ධයක්' තියෙනව,** දුෂ්කර ක්‍රියා කරන්නම වෙනව. සම්පූර්ණයෙන්ම මේ කම්පනයට ගහන්න බෑ. ගහන්න නම් මේ කරන කෙනා මුලින්ම ගෞතම බුදුන් වහන්සේ හරි ගහන්න, **අවසානයේ මේක ආධ්‍යාත්මයේ තියෙන්නේ. ආධ්‍යාත්මෙට කම්පනය අසුවෙනවා. ඒක සම්පූර්ණයෙන්ම කුඩු කරල එතනම නැති කරාට පස්සේ 'නේචර්' එකට එයා නැති කරන්න බැරි වෙනව. එතන 'බුද්ධත්වයට' පත්වෙන්නේ.**

මේ ස්වභාවයේ විශාල අභියෝගයක් තියෙනව ඔබ නොහිතන. ඔබ නිවන් දකිනව නෙවෙයි. ඒකයි කිව්වේ මේක කවුරුත් කරන එකක් නෑ

කියල. සිතුවිල්ලට කරන්න පුළුවන් සීමාව පනිනව. ඊට පස්සේ **'නේචර්' එක බලය අතට ගන්නව.** ඊට පස්සේ ඔබ දන්නෑ ඔබට වෙන දේ. **'නේචර්' එක තමයි තීරණය කරන්නේ ඔබ නිවන් දක්කනවද නැද්ද කියලා.** ඔබ යන මග සේරම. ඔබ හිතනවද ඔබ කවුරුත් ඉපදිලා තියෙන්නේ අහම්බෙන් කියලා, නෑ. ඔබ දන්නවද ආර්යයන් වහන්සේ කියන්නේ කවුද? කියලා, නෑ. ඔබ දන්නවද? ආර්යයන් වහන්සේ නිහඬව ඉන්නේ ඇයි කියලා, නෑ. ඔබ දන්නවද? **'නේචර්' එක 'ලින්ක්' වුණේ කොහොමද කියලා. ඔබ දන්නවද ආර්යයන් වහන්සේ එක්ක විශාල පිරිසක් 'ලින්ක්' වෙලා ඉන්නව කියලා, ආර්යයන් වහන්සේගේ අතෙයි** 'Key' **එක තියෙන්නේ. ආර්යයන් වහන්සේ විනාශ වුණොත් ඔක්කොම අතරමං.** හැබැයි **'නේචර්' එකට මේ වෙලාවේ බලයක් නැතිවෙලා තියෙනව, 'නේචර්' එකට ආර්යයන් වහන්සේගේ බලය බිඳින්න බැරිවුණා.** ඒක නිසා 'නේචර්' එක අන්තිම මොහොත දීල තියෙන්නේ. මොකද 'නේචර්' එක දුර්වල වන තැනක් එනව බුදු කෙනෙක් පහළ වන, ඒ වෙලාව ඇවිල්ලා තියෙන්නේ දැන් යුගය ඇවිත්. **'ෆ්‍රීකොන්ස්' එක හරියටම 'බැලැන්ස්' වෙනව. හරියටම 'තථාගත සම්මා සම්බුදු වහන්සේගේ' ඒ වචන ඒ විදියටම** 'body' **එක හරහා ස්වරාලය හරහා ලෝකෙට විවර වෙනවා. ඒක කිසි කෙනෙකුට නවත්වන්න බෑ. 'ෆ්‍රීකොන්ස්' එක සමඟ 'ටැලිවෙලා' තියෙන්නේ 'අභිධර්ම' දේශනා ඒ විදියටම කිසි කෙනෙකුට වෙනස් කරන්න බැරි විදියට දශමස්ථානයට කියවෙනවා.** ඒකට හේතුව 'ෆ්‍රීකෝන්ස්' එක හරියටම 'නේචර්' එක 'ඉන්ඩිකේට්' (indicate) කරනව. හරියට බලය 'ඉන්ඩිකේට්' කරනව, බලය කොතනද හටගන්නේ ඒක නැතිවෙන හැටි කියනවා. කම්පනය වන හැටි කියනවා, කම්පනය නොවන හැටි කියනවා.

මුළු ගැලැක්සියම වුණත් කියන්න පුළුවන්. මේ 'නේචර්' එකේ තමයි 'මාර යුද්ධෙ' තියෙන්නේ. 'මාර යුද්ධෙ' තියෙන්නේ එළියේ කාත් එක්කවත් නෙමේ, **ඔබ ඔබව අත්හරින එකයි තියෙන්නේ මේක.** 'නේචර්' එක අත්හරින එකක් තියෙන්නේ, **'නේචර්' එකයි ඔබ කියන්නේ. ඔබේ කම්පනය 'නේචර්' එකටයි අයිති.** ඒ කම්පනය 'නේචර්' එකයි ඔබ කියන්නේ. ඔබේ කම්පනය 'නේචර්' එකටයි අයිති. ඒ කම්පනය 'නේචර්' එකයි **කරන්න දෙන් නැත්තේ. ඔබ 'නේචර්' එකට යටත්වෙලා ඉන්නේ, ඔබ 'නේචර්' එක කුඩු කරන්න ඕන.** ඔබට ඒක කරන්න බෑ, ආයි කියනව

ඔබට ඒක කරන්න බෑ. හැබැයි ඔබට ඒක කරන්න **'ෆ්‍රීකොන්ස්' එකක් ඔබට 'එජස්' කරනව ආර්යයන් වහන්සේ.** ඒ 'නේචර්' එකට අභියෝග යක් තියෙනව. 'නේචර්' එක ආර්යයන් වහන්සේව නැති කරන්න බලනව. කොහොමද ආර්යයන් වහන්සේ එක දවසක් ඉස්සරහට ඇවිල්ල වේදිකාවක කතා කළොත්, කාගේ හරි 'නේචර්' එකෙන් 'සෙන්ටර්' කරල දෙනව ඊළඟ 'නේචර්' එකෙන් ආර්යයන් වහන්සේ කුඩුවෙලා යන්න. 'ජේසුස් වහන්සේට ඇණ ගැහුවේ නිකන් නෙවෙයි. මිනිස්සුන්ගේ ඡන්දෙන් 'ජේසුස් වහන්සේට' ඇණ ගහන්නේ. මිනිස්සු 'නේචර්' එකට ලින්ක් වෙලා ඉන්නේ. මිනිසුන් මේ 'රහතන් වහන්සේ' නමක් කුඩු කරන්න හදන්නේ. සුදුසු නැති වෙලාවක බලෙන් මෙතෙන්ට එන්න බෑ, සුදුසු නැති බලයකට ගැළපෙන්නෑ. ඒක නිසා 'ජේසුස් වහන්සේ' ඇණ ගහල මැරුවා. ආර්යයන් වහන්සේට මෙය කරන්න හැකිවන්නේ නෑ 'නේචර්' එකට. ඒක වෙන්නෑ.

ආර්යයන් වහන්සේ මේක හොඳට 'ෆ්‍රීකොන්ස්' කරල හොඳට මේ දිහා බලල, මේ **දේශනා එකක්වත් 'නේචර්' එකට කුඩු කරන්න බෑ. 'නේචර්' එක විදගෙන ගිහිල්ලා කම්පන සේරම කම්පන ස්වභාව 'ඉන්ඩිකේට්' කරලා මේක මේ විදියට ප්‍රකාශ කරනකම් බලන් ඉන්නෑ එහෙනම්.** මීට කලින් කොරෝනා හැදුණු වෙලාවේ බැලුව ඒ වෙලාවේ 'කාලක්‍රියා' කරන්න ඒකට සම්පූර්ණයෙන්ම ගිහිල්ලා, නෑ ඒක වෙන්නේ. 'නේචර්' එක පරාදයි ආර්යයන් වහන්සේට මේක කරන්න 'නේචර්' එක ඉඩදීල තියෙනව. ඒකට හේතුව 'නේචර්' එක තීරණය කරල තියෙනව, 'නේචර්' එක කියන්නේ කම්පන සිස්ටම් එක. **කම්පන 'සිස්ටම්' එක 'බැලැන්ස්' වෙන්නේ බුදු කෙනෙක් පහළ වුණාම විතරයි.** නැත්නම් කම්පන 'සිස්ටම්' 'බැලැන්ස්' වෙන්නෑ. **ඒකට මෙසෙන්ජර් විදියට ආර්යයන් වහන්සේ 'ලින්ක්' වෙලා තියෙන්නේ. ඒක නිසා 'මෙසෙන්ජර්' එක හැමෝටම යනව.** කම්පන 'සිස්ටම්' එක මොකක්ද? 'ක්‍රියේට්' වෙන්නේ මොකක්ද? මේක කුඩුවෙන්නේ කොහොමද? ඔක්කොම කියතැහැකි. ඒක ප්‍රායෝගිකව කොහොමද ඔබට වෙන්නේ, ඒක වෙනවද, වෙන ආකාරය ඔක්කොම කියනව. **සේරම 'ලින්ක්' එක කුඩු කරලා දාතැහැකි. ඔබේ 'මහා භව ඕඝයේ' 'සසර ඕඝයේ' මේ ගෞතම බුද්ධ ශාසනයේ 'තථාගත' සම්මා සම්බුදුන් වහන්සේගේ, ගෞතම බුද්ධ ශාසනේ ඔබ අවසාන**

**මගඵලලාභීන්.** මේක කියන්න තවත් හේතුවක් තියෙනවා, ඔබ නිකන් ඉපදිලා නෑ, ඔබ අපි කවුරුත් සේරම **එකම කම්පන සංඛ්‍යාතයක කැරකි කැරකී ගිහිල්ලා, මේ වෙලාවේ ඔබට මෙතන 'ෆ්‍රීකොන්ස්' එක අහුවෙන්න ඕන. ඔබටම මේක අහුවෙනවා. ඔබට අහුවෙන්නේ ආර්යයන් වහන්සේ කරන 'ෆ්‍රීකොන්ස්' එක. ඒ තුළ කම්පනය නෑ.**

මේ දුර්ලභ අවස්ථාව ඔබට හමුවන්නේ නෑ, ඔබ ප්‍රපාතයෙන් වැටෙද්දී සුළැඟිල්ල දීල උඩට ගන්නව වගේ ආර්යයන් වහන්සේ ඔබව උඩට ගන්නේ. ශූන්‍ය කල්ප 7ක් ගැන කතා කරනවා. මේ එන 'මාර සංඥා' ඔබට සකස් වෙන එක පුදුමයක් නෙවෙයි. මේ සේරම විනාශ කරන්න මේ දේශනා ඇතුළටම ඇවිල්ලා ඒ දේශනාව විකෘති කරලා, එහෙම නැත්නම් ඒ දේශනා නැති කරලා **'නේචර්' එකෙන් ඔබ මෙහෙය වනවා ඔබ දන්නැති වුණාට. දෙනව වෙන වෙන සංඥා.** 'සුන්දරී පරිබ්‍රාජිකාව' මරල ජේතවනාරාමේ හැංගුවේ කවුරුවත් නෙමෙයි, බුදුන් වහන්සේට ගල් පෙරළන්නෙ කවුරුත් නෙවෙයි බුදුන් වහන්සේට දුනු ඊතල විදින්නේ කවුරුවත් නෙවෙයි, මේක දන්නව බුදුන් වහන්සේ. බුදුන් වහන්සේ දෙව්දත් පැවිදි කරන්නේ. මේ දෙව්දත්ගේ වැඩක් නෙවෙයි, දෙව්දත් කවදහරි 'පසේ බුදුවෙනව' කිව්වේ ඔය නිසයි. මේක 'නේචර්' එක. 'අංගුලිමාල' මිනීමැරුවා නෙවෙයි 'සිස්ටම්' එක. ඒ 'අංගුලිමාල' ක්‍රියේෂන් එකේ ගනුදෙනු කළ ආකාරය. අපි කිව්වා කෝටි ප්‍රකෝටි ගාණක කම්පන තියෙනව කියල. කෝටි ප්‍රකෝටි ගාණක 'සෙන්සස්' තියෙනව කියල. මේකෙ රේඛා ඇන්දොත් මේ රේඛා එකකට එකක් හැප්පෙනවා මොකක්ද මේ කියන්නේ, ඔබට වෙන සමහර දේවල් නිකන් වෙනව නෙවෙයි. මේ කම්පන එකකට එකක් ගැටීම් තියෙනවා. **ඔබ හිතනවට වැඩිය ඔබේ කතාව භයංකරයි.** ඔබට පුළුවන් තරම් හොඳට මේව අවබෝධ වෙනව.

ඔබ කිසිම දවසක ඔබගේ අතින් යුතුකම් හැම දෙයක්ම ඔබ හොඳින් බලන්න. බොහොම පරිස්සමින් බලන්න. ඒකයි කිව්වේ අන්ධ දෙමව්පියෝ අත්හරින්න එපා, අන්ධ දෙමව්පියෝ අතෑරීම ඔබේ නිවන වැහෙන්න හේතු වෙනව. ඒකට හේතුව ඔබ කරනව නෙවෙයි, මේ පර්යාය ඇතුළේ 'බැලන්ස්' එක ඔබේ නැතිවෙනව. මේ 'බැලන්ස්' එක

දීල තියෙන්නේ 'නේචර්' එකෙන්මයි, ඔබට ඒක තීරණය කරන්න බෑ. **ඔබ හිතල නිවන් දකින්නෙත් නෑ, ඔබට හිතල නිවන් දකින්නත් බෑ. ඔබ 'නේචර්' එක හඳුන ගන්න කම්පන ටික, ඔබේ කම්පනය අභ්‍යන්තර සිහියට හසුවෙනවා. ඔබේ අභ්‍යන්තර සිහියට අසුවෙනව කියන්නේ, ඔබේ අර කම්පන නොවන ස්වභාවය ඔබේ සිහියට හසුවෙනවා. ඒ කම්පන නොවන ස්වභාවය ඔබ ගාවම තියෙනවා, ඒ ස්වභාවය සිහිය විදියටම පවතිනවා.** ඒක 'සම්මා සතිය' වෙන්නේ කොහොමද 'සම්මා ඤාණා' වෙන්නේ කොහොමද? **'සම්මා ඤාණය' කියන්නේ ඔබ මෙන්න මෙතන කුඩු කරන තැන තියෙන බලය, අර සිහිය බවට පත්වෙනවා. ඒ බලය සිහිය බවට පත්වෙන කොට 'සම්මා ඤාණ' විමුක්ති සාරා බවට පත්වන්නේ එතැනින්.** ඒ බලය දර්ශනය ඔස්සේයි මතුවන්නේ මේ සත්‍ය දැකීම තුළ. අවිද්‍යාව ඔස්සේ බලය එන්නේ, අවිද්‍යාවට ගහන තරමටම ඔබ ඒ බලය කුඩු කරනවා. ඒ 'බලය' කුඩු කරනවා කියන්නේ, **මැද්දේ තියෙන බලය කුඩු කරන්නේ.** මැද්දේ තියෙන බලය කුඩුවෙන කොට, අවිද්‍යාව කුඩු වෙනව කියන්නේ ඔබට දෙයක් වගේ දැනෙන ගතිය කුඩු වෙනව. දෙයක් වගේ දැනෙන ගතිය කුඩු වෙනව කියන්නෙම ඔබ එතනම කම්පනය **නොවන ස්වභාවය බවට පත්වෙනවා.** ඒ කියන්නේ ඔබගේ **සිහිය ඥානය බවට පත්වෙලා** මේ සියල්ල දෙයක් නොවන සිහියක් බවට පත්වෙනව. **දෙයක් නොවන සිහියක් අවදිවෙලා** ඔබට හැමතැනම **දෙයක් නොවන ස්වභාවයක්** දැනෙන්න ගන්නව. ඒ දෙයක් නොවන ස්වභාවය **'අධිගත ඥාන දර්ශන සමාධිය'** ඤායස්ස අධිගමාය නිබ්බාණස්ස සච්ච කිරියාය.'

**මේක කරන්න බෑ විශාල ඍජු භාවයක් විශාල පෞරුෂයක් ඔබට ඕන. ඔබ ගහන්නේ මිනිහෙකුට නෙවෙයි සතෙකුට නෙවෙයි ගහන්නේ 'නේචර්' එකට කම්පනේට, පුළුවන් නම් ගහන්න සිතුවිලි හෙල්ලෙනව සිතුවිලි. 'වයිට්බ්‍රේඩ්' වෙනව සිතුවිලිවලට කරන්න පුළුවන් දෙයක් නෑ.** මහා මුනිවරු කඳු මුදුන්වල ඉඳල තියෙනව. ඒගොල්ලො දැක්කේ ඈත අනන්තය. ඒක මහා පුදුම 'ඤාණයක්' අසාමාන්‍යයයි මිනිස් සිත අබිබවා. අපි රෑ එළිවෙනකම් කඳු මුදුන්වල ඉඳගෙන, මේ මිනිස්සු නිදියන කොට මිනිස්සු දුකින් බේරගන්න ක්‍රමයක් හොයනව. මේකෙ විශාල පර්යායක් තියෙනව කියන්න. මේ තිස් එක් ලෝක ධාතුවම ඔබට කියතැහැකි

මැවෙන්නේ කොහොමද කියලා. ඔබට කිව්වේ **'එල්ලයිට්මන්ට්'** වෙනව කියන එකේ ඇත්ත කතාව. අපි කිව්වා **'චාතුර්මහාරාජිකයට'** මනුස්ස ලෝකේ දවස් 50ක් එක දවසයි. **'තාවතිංසයට** ඒ වගේ දෙගුණයක් දවස් 100ක් එක දවසක් කියල. **'යාමෙට'** දවස් 200ක් එක දවසයි කියල. **'තුසිතයට'** දවස් 400ක් එක දවසයි කියල. **'නිම්මාණරතියට'** දවස් 800ක් එක දවසයි කියල. **'පරනිම්මිත වසවර්තියට'** දවස් 1600ක් එක දවසයි කියල. මේ 'සදෙව් ලොව.'

අපි ගත්තා රූපාවචර බ්‍රහ්ම ලෝකවල **ප්‍රථම ධ්‍යාන ස්වභාවයෙන් පෙන්නව** 'බ්‍රහ්ම පාරිසජ්ජයට' 1600 ඒවා දෙකක්. මෙතන දෙගුණ තෙගුණ වන 'චාට්' එකක් ඔබ හෙව්වොත් ඔබට හම්බ වේවි. ඒකෙ එනව අසංඛ්‍ය කල්ප තුනෙන් එකයි. **'බ්‍රහ්ම පාරිසජ්ජයට'** 'මනුෂ්‍ය ලෝකේ' ආයුෂවලින් අසංඛ්‍ය කල්ප තුනෙන් එකක් එහේ එක දවසයි. මනුෂ්‍ය ආයුෂවලින් අසංඛ්‍ය කල්ප භාගයක් **'බ්‍රහ්ම පුරෝහිතයට'** එක දවසයි. මනුෂ්‍ය කල්පවලින් **'මහා බ්‍රහ්මයට'** කල්පයක් එක දවසයි. මනුෂ්‍ය ලෝක අසංඛ්‍ය කල්පයක්, ඒ කියන්නේ 'මහා බ්‍රහ්මයට එක දවසයි. මනුෂ්‍ය ලෝකේ ආයුෂවලින් කල්ප 02ක් **'පරිත්තාභයට'** එක දවසයි. මනුෂ්‍ය ලෝකේ ආයුෂවලින් කල්ප 04ක් **'අප්පමාණභයට'** එක දවසයි. **දෙවෙනි ධ්‍යාන 'ආභස්සරය'** ඒ කියන්නෙ කල්ප 08යි එක දවසයි. ඒ කියන්නේ මනුෂ්‍ය ආයුෂවලින් කල්පවලින් කියන්නේ **අපි ගත්ත තෘතීක ධ්‍යාන 'පරිත්ත සුභය'** එතකොට මහා කල්ප 16ක් එක දවසයි. එතකොට 'මහා කල්ප 32ක් **'අප්පමාණ සුභයට'** එක දවසයි. මහා කල්ප 64ක් **'සුභකින්නයට'** එක දවසයි. මහා කල්ප 500ක් **'වේහප්ඵලයට'** එක දවසයි. ඔබ දන්නවද **'අවිහය'** අපි මේ කතා කරන්නේ **'ශුද්ධාවාස' ගැන.** **'අවිහය'** මහා කල්ප 1000ක් එක දවසයි මේ මනුෂ්‍ය ලෝකේ මහා කල්ප 1000ක්. මනුෂ්‍ය ලෝකයේ මහා කල්ප 2000ක්. **'අතප්පයට'** එක දවසයි. මනුෂ්‍ය ලෝකේ මහා කල්ප 4000ක් **'සුදස්යට'** එක දවසයි. මනුෂ්‍ය ලෝකේ මහා කල්ප 8000ක් **'සුදස්සියට'** එක දවසයි. මනුෂ්‍ය ලෝකේ මහා කල්ප 16000ක් **'අකනිට්ඨාව'**ට එක දවසයි.

මනුෂ්‍ය ලෝකේ මහා කල්ප 20,000ක් 'ආකාසඤ්ඤායතනයට' එක දවසයි. මනුෂ්‍ය ලෝකේ මහා කල්ප 40,000ක් 'විඤ්ඤායතනයට' එක

දවසයි. මනුෂ්‍ය ලෝකේ මහා කල්ප 60,000ක් 'ආකිඤ්ඤායතනයට' එක දවසයි. මනුෂ්‍ය ලෝකේ මහා කල්ප 80,000ක් මේක ඔබට හිතා ගන්න පුළුවන් සංඛ්‍යාවක්ද? **'අසංඥතලයට'** එක දවසයි. **'එල්ලයිමන්ට්' කියන්නේ මහා කල්ප 80,000කට එහාට විශ්ව ශක්තියට 'ලින්ක්' වෙලා ඉන්න එක. ඒකද බුද්ධ, නෑ කම්පන ස්වභාවය කල්ප 80,000ට 60,000ට තියෙන්නේ කම්පනය ඉවර නෑ කම්පනය තියෙනවා කියන එකයි.** හැබැයි **කම්පනය නැති කරන එකයි 'බුද්ධ ස්වභාවය.' 'බුද්ධ' කිව්වේ ඒකයි. 'අබොප්පා චේතෝ විමුක්තිය'** එහෙනම් මේ 'එල්ලයිමන්ට්' වෙනව කියන්නේ මහා කල්ප 80,00 එහාට මේ විශ්වයේම පවතිනකම් 'අසංඥ තලයේ' විශ්වය තියෙනකම් පවතිනවා කියන එකද? එහෙනම් මේ 'බුද්ධ' කියන්නේ, නෑ 'බුද්ධ' කියන්නේ 'එල්ලයිමන්ට්' එකක් නෙමේ. **බුදුන් වහන්සේම කියනවා පහන නිවී ගියේය. තිරත් ඉවර නම්, තෙලුත් ඉවර නම් ගිය තැනක් කොයින්ද? ඕක එනව 'පොට්ඨපාද සූත්‍රයේ.'** 'පොට්ඨපාද අහනව මේක නැති කරන්නේ කොහොමද? කියලා. 'පොට්ඨපාදට' කියනව ඔබ ඉන්න ඔය ආත්ම දෘෂ්ටිය තියෙනකම් 'පොට්ඨපාද' ඔබට ඕක නිවැරදි කරන්න බෑ කියල. එහෙනම් මේ 'නිබ්බාණ' කියන එක කාටවත් ලබන්න බෑ, 'නිබ්බාණ' කියන එක ලබන්න 'අකම්පිත අබොප්පා චේතෝ විමුක්තියට' එන්න ඕන.

කම්පන නොවන ස්වභාවය කියන්නේ 'එල්ලයිමන්ට්' එකක් නෙවෙයි. කම්පනය වුණා, කම්පනය වුණ එකයි මේ කතාව. **ඒක කුඩුවීමයි විනෙය්‍යය ලෝකේ** අකම්පනය කියන්නේ 'එල්ලයිමන්ට්' එකක් නෙමේ එලයිමන්ට් ඒ කම්පන සදාකල් පවතිනවා. ඒක විශ්ව ශක්තියට එකතු වෙනව කියල වේදය තුළ පෙන්නුවේ 'එල්ලයිමන්ට්' එක. 'බුද්ධ' කියන්නේ 'අබොප්පා චේතෝ විමුක්තිය' ඒ කියන්නේ **'නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ' කියන ස්වභාවය.** ආත්ම දෘෂ්ටිය තුළයි 'එල්ලයිමන්ට්' තියෙන්නේ. 'අසංඥ තලේ' ඔබ හිටිය නම් ඔබට දැනෙයි, 'අසංඥ තලේ, නොදැනෙන ස්වභාවය තුළ 'ජීවිත ඉන්ද්‍රිය' රූපේ ආත්ම සංඥාව තියෙනව. නොදැනෙන ස්වභාවයයි ආත්ම සංඥාව. නොදැනෙන ස්වභාවයේම නොදැනෙන කෙනෙක් ඉන්න බව දැනෙන සංඥාවක් තියෙනව. ඒ විඤ්ඤාණංයාතන ස්වභාවේ දැනෙන ස්වභාවේ එකම ස්වභාව ආකාසඤ්ඤායතන, විඤ්ඤායතනය දැනෙන ස්වභාවය එනවා. දැනෙන එක, ස්වභාවය කොතනද ඊට පස්සේ

ආකිඤ්චඤ්ඤායතනයේ නොදැනෙන ස්වභාවයක් එනව. නොදැනෙන ස්වභාවයන් සම්පූර්ණ පරිවර්තනයකට ලක්වෙනව. ඒ ස්වභාවය තමයි ආත්ම ස්වභාවය. ඒක ඇතුළේ බැස ගත්ත ස්වභාවය 'අසංඥ තලේ' ඒ ස්වභාවයටම විතරයි අවබෝධ වෙන්නේ.

'බුද්ධ' වචනේ හොයාගෙන යනකොට හම්බ වුණේ 'දෘෂ්ටියට' ගහන හැටි. ආත්ම දෘෂ්ටියට ගහන හැටි. දෘෂ්ටිය හැදෙන හැටි දැක්කේ නැත්නම් ගහන්න බෑ ඒ කම්පනයට වදින්නේ. ඒක දැක්කම කම්පනයට **වදින තැන කම්පනය කුඩු වෙලා යන හැටි දැක්කා. එතකොට තේරුණා එදා 'අසංඥ තලේ' ඉන්න කොට කම්පනය තිබුණා, අද ඒ කම්පනය නෑ. ඒකයි කිව්වේ මේක අභ්‍යන්තර පරිවර්තනයක් ලෝකෙට හෙළි කරනව. ඔබට මේ කිව්ව දේ ඔබට මැවේවි. ඔබට ඒක 'එඩ්ඩ්‍රුස්' එක වගේ වේවි නිවනට. ඔබ නිවනට ළං වෙනවා.** සියලුදෙනාටම තෙරුවන් සරණයි.

# 02

# සිතුවිලි සසරෙන් මිදී සදා අමරණීය වන්න

**උපාසිකාව:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස, අවසරයි. දැන් මනුස්ස ආත්මයෙන් මිදිලා තිරිසන් ආත්මයකට ගිය 'සුභ මානවක' කතාව තුළ 'සුභමානවක' බල්ලාට කතා කරන එක සිතුවිලි කොහොමද බල්ලට දැනෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය බල්ලෙක් හදල තියෙනවද?

**උපාසිකාව:** බල්ලෝ නම් හදලා නෑ මං.

**ආර්යයන් වහන්සේ:** එහෙනම් බල්ලෙක් හදලා බලන්න. එතකොට තේරේවී ඔබතුමියට සත්තු ගැන තේරෙන්නෑ. ඔබතුමිය සතෙක් හදලා, කෑවද කියලා බලන්න. ඒක ඔබතුමියට තේරෙයිද? ඔබතුමිය හිතන එකක් නේද? මේ මේ සුරංගනා කතා නොවේ සාහිත්‍ය කතා නොවෙයි මේ. මේ කියන දහම් පණිවිඩේ ගන්න. හොඳ පණිවිඩයක් තියෙනවා. බුදුන් වහන්සේ දේශනා කරපු දේ අපිට ඒක හරිද? වැරදිද? ඇත්තද? බොරුද? වැඩක් නෑ. ධර්මය ගන්න ක්‍රමයක් තියෙනවා, මේක ප්‍රඥාවන්තයින්ගේ දහමක්.

දැන් **'සප්ත සූරියෝත්ගම' සූත්‍රයේ නේද? සූර්ය හතක්ම පායලා පෘථිවිය විනාස වෙනවයි කිව්වට මේක පංචමහා නදියම සිඳී ගියයි කියන කොට, කොහොමද? නදී ටික සිඳී ගියේ කියලා අහන්න එපා. ඒකෙන් කියන්නේ ඇස, කන, දිව, නාසය, ආයතන ටික, ඒ ආයතන පිනවන එක නවතින්නේ. දැන් ඕක දකින්න ඕන නේ.** ඔය සුරංගනා

කතාව නෙමෙයි නේද? එතකොට දකින්නේ අපේ සිත තුළ මැවෙන ලෝකය විනාස වන හැටි නේද? දකින්නේ. දැන් ඔතනින් දෙන පණිවුඩය මොකක්ද? ඔතනින් දෙන පණිවිඩේ බුදුන් වහන්සේ දෙන පණිවිඩය, ඒක බුදුන් වහන්සේ 'පානි' දිහා බලලා මේ සංස්කෘත භාෂාව නිර්මාතෘ මානෙ නිසා අංගවිකල වෙලා ඉපදුණා කියනවා නේ. 'පානි' සංස්කෘත භාෂාව දන්නවානේ. මාන්නය නිසා මන්ද බුද්ධික වෙලා උපදිනවානේ. එතකොට බුදුන් වහන්සේට වැරදිලා ද? ඔබතුමියගෙන් ඇසුවොත් ඔබතුමී දැක්කාද? පානි එතන ඉන්නවා දැක්කාද? සංස්කෘත භාෂාවේ නිර්මාතෘ කියලා දැක්කාද? ඔහොම කියනවා නම් ඔක්කොටම කියතැහැකි නිවනට උපනිශ්‍රය වන ඕන ප්‍රශ්නයක් අහන්න.

කර්ම භූමිය හේතුඵල දහම තුළ අදාළ නෑ, බුදුන් වහන්සේ දේශනා කරපු හේතුඵල දහම තුළ කර්ම භූමියට තැනක් නෑ. ඔය එකක්වත් මෙතන 'අනුසෝතයෙන් පටිසෝතයට' කතා කරන කොට, අනුසෝතය කියන්නේ 'නේචර්' එකට ඕන එක ගඟ ගලන අතට ගලනවා. පටිසෝතය කියන්නේ ඊට විරුද්ධ වෙන එක ඒ කියන්නේ මේ සිත, සිතුවිලි සිතට එකඟව කතා කරන එක සිතුවිලිවලට වහල්වෙලා කතා කරන එක, සිතුවිලි හරි කියලා කතා කරන එක. 'පටිසෝතය' නොවේ. විඤ්ඤාණ මායාවට නොරැවටීමයි 'පටිසෝතය.' එතකොට අපිට නිවන් මග කතා කරන කොට අපට දෙයක් හම්බ වෙන්නේ නෑ. **ශබ්ද වර්න විදියට එනකොට ඒ ශබ්දවලත්, වර්ණවලත් දෙයක් හම්බ වෙන්නේ නෑ. එහෙනම් අපි කතා කරන හැම වචනයකම දෙයක් නෑ. ඔක්කෝම සංඛාර, සංඛාර කියන්නේ වේගයට සකස් වෙන කම්පන විතරයි. එක වචනයක්වත් ගන්න දෙයක් නෑ. දැන් මේක දැක්කාහම මොකද වෙන්නේ, එතකොට හැමදේකටම තියෙන 'නිබ්බිදාව' එන්නේ විතරාගි, විතදෝසි, විතමෝහි ස්වභාවය එන්නේ.** මේ බුදුන් වහන්සේ කිව්වේ නැද්ද? 'විතදේසි වීතමෝහි' ස්වභාවය කියලා රහතුන් වහන්සේ ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ කිව්වේ නැද්ද? එතකොට බුදුන් වහන්සේ කිව්වේ නැද්ද මේක සවිඤ්ඤාණක මනසකට නෙවෙයි අවිඤ්ඤාණ මනසකටයි අසුවෙන්නේ කියලා. බුදුන් වහන්සේ දේශනා කළේ පටිසෝතයද, අනුසෝතයද බුදුන් වහන්සේ ඇත නැත අන්තවලින් මිදුණු දහමක් දේශනා කළේ නැද්ද? ආර්යයන් වහන්ස දෙන්නේ බුදුන් වහන්සේගේ ධර්මයයි. ධර්මය මෙනෙහි කරන්න නිවන්

මග මෙනෙහි කරන්න. ඔබතුමිය ඒ ගැන ප්‍රශ්නයක් අහන්න. අන්ධ වනය සුන්දරයි. ඔබතුමියට තේරුවන් සරණයි.

(පළමු සාකච්ඡාව මෙතැනින් අවසන්)

**උපාසිකාව:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස. මට ප්‍රායෝගික අත්දැකීමක් හෙළි කරන්නෙ. ආර්යයන් වහන්ස එක දෙයක්. මම ලස්සන මල් වවන්න කැමති කෙනෙක්. නමුත්, දැන් ළඟකදි දවසක් උණ පඳුරක් කපන්න උනා. වෙනද මම ඒකට බැස ගන්නව. එය කිසිම පැකිළීමක් නැතිවම දුකක් නැතුව මමත් උදව් වෙලා එය අයින් කරන එක සිද්ධ කළා. දැන් තේරෙනවා දැන් ටික ටික කෙලෙස් අඩුවන බව අකුසල් ක්ෂය වෙලා යන බව දැනෙනවා. ඒ මග හරිද කියලා නිවැරදිද කියලා දැන ගන්න කතා කළේ ආර්යයන් වහන්ස. මගේ අඩුපාඩු තියෙනවා නම් ඔබවහන්සේ කරුණාවෙන් පැහැදිලි කර දෙන්න.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමියට වැදගත් වෙන්නේ තමන්ගේ අභ්‍යන්තරයේ කෙලෙස් ස්වභාවයට යොමු වෙන්න ඕන, තමන්ගේම කෙළෙස් ටික ටික දියවන ස්වභාවයට තියෙන සිහිය තමයි, එතන තමයි ඇත්තටම 'පාත්' එක තියෙන්නේ. මාර්ගයට පිළිපන්නයි කියන්නේ. තමන්ගේම අභ්‍යන්තරේ තමන්ටම අසුවෙන්න ඕන තමන්ගෙම අභ්‍යන්තරේ කෙලෙස් ස්වභාවය. රාග, ද්වේෂ, මෝහ තමන්ගේම කෙලෙස් ස්වභාවය, තමන්ගෙම අභ්‍යන්තරේ කෙලෙස් දියවෙන ස්වභාවය, තමන්ටම නුවණට සිහියට අසුවෙන්න ඕන. එය හොඳින් දියවෙනවාද කියන ස්වභාවය සිහියට හසුවෙන්න ඕන. හැබැයි රාග, ද්වේෂ, මෝහ අභ්‍යන්තරේ කෙලෙස් ස්වභාවය දියවෙනවා කියන එක සිහියට හසුවෙනවා කියන්නේ, ඒ කමයි 'ආසවඛ්‍යා ඤාණය' හැබැයි සිහියට නුවණට හසුවෙන එකක් හැබැයි හිතන එකක් නොවේ. ඒක දැනෙනවා. ඒක කාටවත් කියන්න ඕන් නෑ. ඒක තමන්ට දැනෙනවා. ඉස්සර කේන්ති ගියා. දැන් කේන්ති යන්නෙ නෑ. ඒකේ අවස්ථා කීපයක් තියෙනවා. ඒවා දේශනාවලින් හඳුනා ගන්න ඕන. කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය. සද්ධර්ම ශ්‍රවණය තුළ ඒක හඳුන ගන්න පුළුවන්. ඒක තමයි ලේයර්ස් දේශනා ටික දාන්නේ ඒක වැදගත්. මේ ලේයර්ස් දේශනා ටික මේ ගාම්භීර දේශනා නිවනම පෙන්නනවා. ඒකේ 'නිවනමයි' පෙන්වන්නේ. එතකොට කෙනෙකුට

අභ්‍යන්තරේ සමහරවිට කෙනෙකුට ළමයෙකුට පහරක් ගහනවා වෙන්න පුළුවන්. සමහරවිට ළමයකුට ඉස්කෝලේ උගන්වන 'ටීචර් කෙනෙක්' වෙන්න පුළුවන්. සමහරවිට හයියෙන් කියනවාත් වෙන්න පුළුවන්. බුදුන් වහන්සේ තුච්ඡ පෝට්ල කිව්වා වාගේ. නමුත් අභ්‍යන්තරේට ඒක දෙයක් වෙලා නැතිවෙන්න පුළුවන්. තමන්ගේ ඒක 'රාග, ද්වේෂ, මෝහ සිතක්' නැතිවෙන්න පුළුවන්. එතකොට ශබ්දයක් විතරයි.

තමන්ගේ අභ්‍යන්තරේ සිහියට තමයි හසුවන්නේ මෙතන රාග සිතක් තිබ්බද, ද්වේෂ සිතක් තිබ්බද, මෝහ සිතක් තිබ්බද කියලා තමුන්ගේ අභ්‍යන්තර සිහියට හසුවෙනවා එහෙම කම්පනයක් නැති බව. නමුත් ඉතිං භාෂාවලුත් ශබ්දයක් තියෙන්නේ. මේවායේ ද්වේල් ලේයර්ස් දේශනාවල හොඳට පැහැදිලි කළා. ඉතින් මේ දෙයක් කියලා මේ අභ්‍යන්තර සිහියට තමයි මේක හසුවෙන්නේ. මේ 'අසවඛ්‍යයා ඤාණය' කියන එක හිතනවටත් වැඩිය සියුම්. මෙහෙම බලන කොට. ඒ කියන්නේ තමන්ගේ හැසිරීමෙන් කියන්නත් බෑ. ඒකයි අපි කිව්වේ දුකක් නොවන, දෙයක් නොවන දුකක් තියෙන්නේ. ඒක 'මනෝ සෙන්සර්' එක පැත්තෙන් හොඳටම තේරෙනවා සිතුවිල්ලක් ආවත් ඒක දෙයක් වෙන්නේ නැහැ. ධර්මය හොඳින් අධ්‍යයනය කරන කොට. ඒ කියන්නේ ධර්මය තුළ සුතමය ඥානය තුළ උපදිනවා. ඒ අවබෝධය ඇත්තටම මෙතන දෙයක් නැති බව මෙනෙහි වෙන්නත් ගන්නවා. නමුත් තමන්ට මුලින් හිතෙන්නේ දෙයක් බව පෘථග්ජන භූමියෙන්නේ පටන් ගත්තේ. මුලින් හිතෙනව හැම දෙයක්ම දෙයක් කියලා. පස්සෙ තමයි ටික ටිකම තේරෙන්නේ.

දිවට රසක් දැනුණාට එය දෙයක් වෙලා නෑ. දිවටනෙ දැනෙන්නේ මිරිස් සැර දෙයක් වෙලා නෑනේ. ඒක දැනෙනවා. ධර්මය දැනගන්න කොට තමා දැනගන්නේ. ඊට පස්සේ ගඳක් ආවත් ඒකත් දැනගන්නවා. ඒවාගේ තමයි හැම එකම දැනෙන්න ගන්නවා. සමහරවිට හූයි හූයි ගෑවට මිරිස් දැවිල්ලට දැඟලුවාට හිතින් කම්පනයක් නෑ. හිතින් නෑ කිසිම ගින්නක්. අර 'සෙන්සර්' එක නිසා තමයි, අර 'සෙන්සර්' එක වැඩ කරනවා. ඉතින් මේවා නුවණට හසුවෙනවා. සිහි නුවණට හසුවෙනවා. මෙතන මනා කොට පැහැදිලි කරනවා 'ඤාණයට' හසුවෙනවා කියන එක. ඔය හසුවෙන්නේ ඇත්තටම කිව්වොත් ඔබ හිතනවාට වඩා වටිනා

දෙයක් ඔය යට තියෙනවා සැඟවිලා. අපි දේශනා කරපු අභිඥ්ඥා දේශනා තුළ හොඳටම පැහැදිලි වුණා. හැමෝටම ඒක නැවත ඇසුවොත් හොඳයි. ඔබට ඒකෙ තේරෙනවා. මෙතන කම්පනය නෑ කියන්නේ ආරෝපණ බලයකුත් නෑ කියන එක. ඒක තමයි 'සිරස', 'දෙරණ' වගේ අහුවෙන එක. ඒක අහුවෙන්නේ ඒක තිබ්බොත් තමයි. ඒක නෑ කියන්නේ 'ඝන සංඥා සුකුම වෙනවා කියන්නේ, රාග, ද්වේෂ, මෝහ ගින්න නිවෙනවා කියන්නෙ එකම කතාවක් කියන එක හොඳට හොඳට තමන්ගේ නුවණට සිහියට අසුවෙන්න ඕන. එතන **'ධම්ම ධීති' ඥාණය වැඩෙනවා කියන්නේ බොජ්ඣංග වැඩෙනවා කියන්නේ, බෝධි අංග වැඩෙනවා කියන්නේ තමන්ගේ බුද්ධ ස්වභාවය කියන්නේ දෙයක් නොවන ස්වභාවය මතුවෙන්නේ. 'බුද්ධ ස්වභාවය' මතුවෙනවා කියන්නේ බෝධි ස්වභාවය දෙයක් නොවන ස්වභාවය. අර දෙයක් නොවන ස්වභාවයේ තියෙන අංග 'ධම්ම විජය සම්බොජ්ඣංග' කියන්නේ, ඒ කියන්නේ අර බෝධි අංග නුවණින් විමසන එක දැනෙන එක, ඒක සිහියට අසුවෙන එක. දෙයක් නොවෙන බව, දෙයක් වුණොත් ඒක මෙනෙහි වෙනවා කොහොමද දෙයක් උනේ කියලා.** ඒක කාගෙන්වත් ඇහැවේ නැතත් තමන්ටම උත්තරය හැදෙනවා. අභ්‍යන්තරයෙන් මතුවෙනවා. 'යථාභූත ඥාණය' ධර්ම අවබෝධය තියෙනවා නම්, ඒක ගළපා ගන්න විතරයි තියෙන්නේ. 'සිස්ටම්' එකෙන්ම ගැළපෙනවා.

ඒ කියන්නේ මේක ධර්මය ඇහුණට පස්සේ ඒක මෙනෙහි කරනවා නොවෙයි, මෙනෙහි වෙනවා, තේරෙනවා නිකම්ම දෙයක් නෑ කියලා. සමහරවිට පොඩ්ඩක් අභ්‍යන්තරයට දැනෙනවා අර 'දෙයක්' නෑ කියලා. මෙනෙහි වෙනකොට ඒකත් දියවෙනවා. ඒක තමයි මේ 'මාර යුද්දේ', ඇත්තටම දෙයක් කියලා දැනෙන එකමයි ආත්ම සංඥාව කියන්නේ. 'ආත්ම සංඥාව' කියන්නේ මම ඉන්නවා කියලා දැනෙන එකනේ. එතකොට මං ඉන්නවා වගේ දැනෙන එක තමා 'දෙයක්' වගේ දැනෙන එක. ඒකම තමයි ආත්ම සංඥාව. එතකොට දෙයක් නෑ කියලා මෙතන දෙයක් වෙලාද, නැද්ද කියලා දැනෙන එක තමයි 'ආසවඛ්‍යා ඥාණය' තව පැත්තකින් බැලුවොත් ඒකමයි ආත්ම සංඥාව. ඒ ඔක්කෝම එකම කතාවක් තමයි පෙන්වන්නේ.

ඒකමයි 'රාග, ද්වේෂ, මෝහ' සංසිඳෙනවා කියන්නේ. දැන් මෙන්න මේ මෙතනම අභ්‍යන්තර සිහිය ඒ කියන්නේ කරන එකක් නොවෙයි මේක මේක ඇත්තටම කරන ඒවාට තියෙන්නේ 'දුර්ලභං සද්ධර්ම ශ්‍රවණං දුර්ලභං මනුසත්තම්, දුර්ලභ ක්ෂණ සම්පත්තිං, මේ කරන ඒවාට තියෙන්නේ. ඇත්තටම සද්ධර්මස් ශ්‍රවණය ඉතා වැදගත් කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය 'ධම්මානුධම්ම පටිපදා' සෝතාපත්ති අංගවලත් මේ ටිකම තියෙනවා. ඕන කෙනෙක් දන්නවා. මේක සොයලා බැලුවොත්, මේකේ කොහෙවත් නෑ දුර්ලභං භාවනා කියලා.

පස්වග තවුසෝ කරපු සමතය නොවෙයි මේ විදර්ශනා භාවනාව කියන්නේ, මෙනෙහි කිරීම තුළ මිදීමක්. ඒකයි 'ඛණික සමාධියක්' වෙන්නේ. සමතය තුළ මොන දේ කළත් එක තැන හිත තියාගෙන හිටියත් වැඩක් නෑ. විපස්සනා ඛණික සමාධියට' විදර්ශනාවට එන්නම ඕන. සමත විපස්සනා සුගන්ධන් ගමන තියෙන්නේ. විදර්ශනාවට සමතය ඒ කියන්නේ පුංචි කෑල්ලක් ඒක මේකේ ලොකු කොටසක් නෙවේ. **මේකේ පළමුවැනි එකම තියෙන්නේ 'සත්‍ය ඥානයේ' සත්‍ය ඥානය කියන්නේම පූර්වභාග ප්‍රතිපදාව කියන්නෙම බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරපු මේ ධර්මය තුළ තියෙනවා, බාහිර ඇත්තක් නොවන බව සියල්ලම සිතුවිලි බව සිතම බව හැබැයි, සිතක් ඇත්තක් නොවන බව, එහෙනම් බාහිර දෙයක් නැති බව ශබ්ද වර්ණවලින් හැදෙන ඒවා බාහිර නැති බව, ඒක මායාවක් බව, එතකොට සිතෙත් එහෙම දෙයක් නැති බව. එහෙනම් බාහිරෙනුත් මිදෙනවා, සිතෙනුත් මිදෙනවා කියන්නේ, එන අරමුණ කොහේවත් පතිත වෙන්නෑ, 'විඤ්ඤාණං අනිදස්සනං' කියලා**. මේක දර්ශනය තුළ තියෙනවා. එතකොට එන අරමුණක 'දෙයක්' නැති බව 'අජ්ජෝසාය තිට්ඨති' බැස ගත්තොත් එතන 'පටිච්ච සමුප්පාද' ධර්මයම තියෙනවා. එහෙම වුණොත් 'සසර ඕඝය' හැදෙන හැටි, ගින්න හැදෙන හැටි, 'රාග, ද්වේෂ, මෝහ කෙලෙස් සකස් වන හැටි, ඒ සත්‍ය දකින කොට ඒක මිදෙන හැටි, මේ වාක්‍ය ටිකේ ඔක්කෝම තියෙනවා.

එතකොට ඔබතුමිය කියපු ටික හරි, ඔබතුමිය කියපුදේද මෙතන තියෙන්නේ, දන්නවාද? මේක ඔබතුමිය දැනගෙන හඳුනගෙන යනව කියන එක විතරයි මෙතන ඔබතුමියගේ ප්‍රශ්නයෙන් අපිට පේන්නේ.

ඒකට හේතුව ඔබතුමිය ප්‍රශ්නය අහන්නේ හඳුනාගෙන නැතුවද? නැත්නම් හඳුනගෙනද ස්ථිර කරගන්නද? එච්චරයි ඔය ප්‍රශ්නය තියෙන්නේ. නේද? ඒ කියන්නේ 'ආසවඛ්‍ය ඤාණය' අසුවෙනවාද? ඒ බව දන්නවා ඕනකම වැඩි වුණොත්, ඉක්මනට කරන්න පුළුවන් කියලා, දෙයක් නෑ. එතකොට දේවල් බවට පත්වෙලා දුකට තමයි පත්වෙන්නේ. දෙයක් බවට පත්වෙලා උපාදානය වෙලා, මේක ස්වාභාවිකම තමන්ට කරන්න පුළුවන් සත්‍ය මෙනෙහි වෙන එක. සද්ධර්මය ශ්‍රවණය කරන එක 'යෝනිසෝමනසිකාරය' ඔබතුමියට තෙරුවන් සරණයි.

(දෙවෙනි සාකච්ඡාව මෙතනින් අවසන්)

**උපාසිකාව:** තෙරුවන් සරණයි, ආර්යයන් වහන්ස. දැන් ආත්ම සංඥාව කියන එක, අපි දැන් අරමුණෝ බැසගන්නවා කියන එක සිහියට හසුවෙනවානේ. මොකද මං එක සැරය ඔබ වහන්සේට අත්දැකීමක් ප්‍රකාශ කළා. ඒ වෙලාවේ කිව්වා අරමුණෝ බැසගන්න බව දකින කොට මම ඉන්නවා දකිනවා කියලා, එවිට මම ඉන්නවා දකින්න විදියක් නෑ ඒක සිතුවිල්ලක් කියලා ඒක පැහැදිලියි. ආර්යයන් වහන්ස, එතන මම ඉන්න විදියක් නෑ. කම්පනය විතරමයි තියෙන්නේ. නමුත් ආර්යයන් වහන්ස මේ ආත්ම සංඥාව කියන එක අර බැසගන්නවා කියන තැන සිහියටම අහුවෙන දේමද, නැත්නම් ආත්මයම කියලා දැනෙනවාද? කියලා මට ගැටලුවක් තියෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඔව්. ඒක ඇත්ත. දැන් මේ වෙලාව බලන්න. නිකන් ඉන්න වෙලාවට බලන්න ඉන්නවා වාගේ දැනෙන්නේ නැද්ද කියලා. නිකන් ඉන්න වෙලාවට කිසිම හේතුවක් නැතුව කිසිම අරමුණක් ගැන කිසි කතාවක් නැතුව නිකන් බලන්න මෙනෙහි කරලා, ඉන්නවා වගේ දැනෙන්නේ නැද්ද කියලා.

**උපාසිකාව:** ඇත්තටම ආර්යයන් වහන්ස ඇස් දෙක පියාගෙන මෙනෙහි කරනවා. එවිට අවධානය යොමු වෙන කොට ඇස් දෙක පියාගෙන සිටියාට අර කය කියන හංකඩේ 'සෙන්සර්' එකයි 'මනෝ සෙන්සර්' එකයි හරි ප්‍රබලයි ආර්යයන් වහන්ස ඇස් දෙකත් පියාගෙන වැඩි ශබ්දත් ඇහෙන්නේ නැති තැනකදී, සෙන්සස්වල මොකුත්

එන්නේ නැති වෙලාවට අර හංකඩේ කියන 'සෙන්සර්' එක අපිට එක මොහොතකටවත් වහන්න බෑ ආර්යයන් වහන්ස ඒකට උෂ්ණය, සීතල හරි දැනෙනවා. ඒ වගේමයි මනෝ සෙන්සර් එකත් ආර්යයන් වහන්ස ඒ කියන්නේ සිතුවිලි එන එක වහන්න බෑනේ. එතන ඉත්තභාවය කියන එක හොඳට දැනෙනවා ආර්යයන් වහන්ස. එතනමයි මම කියන එක අවබෝධයි. නමුත් මට තේරෙන්නේ නැත්තේ මේක සිතිවිල්ලකින් ද එන්නේ නැත්නම් අරමුණේ බැසගන්න තැනදි. ඒකද? මේ මමමයි කියලා තේරෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමියට තියෙනවා ඔතන ලිහාගන්න ඕන තැන් ටිකක්. 'සෙන්සස්' තියෙනවා නේ. ඒ සෙන්සස්වල දැනෙන ස්වභාවය නොවෙයි මේ 'ඉත්ත භාවය' කියන්නේ. ඔය කියපු එක වැරදියි. සෙන්සස්වල දැනෙන ස්වභාවය ඒ 'සෙන්සස්'වල ස්වභාවය. දැවිල්ලක් අපි කෑවා කියලා සෙන්සර් එකට දැනෙන ස්වභාවය කොහොමද ඉත්ත භාවයක් වෙන්නේ. දැන් අපි හිතමු සුවඳක් දැනෙන එක සෙන්සර් එකනේ. ඒක. 'සෙන්සර්' එක කියලා නුවණට හසුවෙනවා නම් ඒක කොහොමද? ඉත්ථභාවය වෙන්නේ ඒක මේ කතාවේ තියෙනවාට වඩා සියුම්. මෙතන බිත්තිය කියලා අපි ගන්නවා, බිත්තිය දකින බවට සිහියක් තියෙනවා. හැබැයි මේක දෙයක් වෙලා නෑනේ. ඒක 'සෙන්සර්' එකනේ. එතකොට ඔය ආයතන හයම එහෙමයි. ඒක එක අදියරක් ඕක පිරිසිදුවට දකින්න. එතකොට බිත්තිය දකින බවට සිහියක් තියෙනවා. එතකොට එතන ඉත්ථ භාවයක් නෑ. සෙන්සර් එකනේ. එතකොට ශබ්දයක් ඇසුණු බවට සිහියක් තියෙනවා. මේ සෙන්සර් එකේ ඉත්ථ භාවයක් කතා කරන්න බෑ මේක පිරිසිදුව දකිනවා නම්. මේ යෝගාවචරයාගේ ස්වභාවය එක එක්කෙනාට වෙනස් වෙනවා. මේ හඳුනා ගැනීම ඔස්සේ අර 'ලේයර්ස්' දේශනා කරන කොටත් පෙන්නනවා.

ඒ කියන්නේ ගඳ සුවඳ ඒ වාගේම රස, ඒ වාගේම උණුසුම, සීතල, තද ගතිය මේ සෙන්සර් එකක් කියලා පොඩ්ඩක් හරි මෙනෙහි කළොත්, ඒ වගේම ඇවිදින කොටත් පිහිදාන කොටත් සෙන්සර් එකක් විදිහට මෙනෙහි කරල මේක කමටහනක් විදියට බලන්න. එතකොට පේන්නෙ නෑ කෙනෙක් දෙයක් එතකොට අහුවෙන්නේ නෑ. මේ සෙන්සර් එක

තමයි අහුවුණේ. මේ සෙන්සර් එක අහුවෙන කොට එතන 'ඕභාසය' තමයි මතුවෙන්නේ. ඒ කියන්නේ දෙයක් මොකුත් මතුවෙන්නේ නෑ, ඒක පනවන්න බැරි ස්වභාවයක් මතුවෙනවා. දෙයක් මොකුත් පනවන්න බැරි මේකෙ මෙනෙහි කිරීමක් තමයි තියෙන්නේ. 'සවිතක්ක' මේක 'අවිතක්ක' ස්වභාවයක් නොවෙයි. හැබැයි 'සවිතක්ක' ස්වභාවය මොකක්ද? දැන් 'කමටහනක්' තියෙනවා. ඒ කියන්නේම සතර ඉරියව්වේම මේක 'සෙන්සස්' විදියටම දකින්න මොකක් ආවත් 'සෙන්සර්' එකක්, ශබ්දයක් ඇසුණත් සෙන්සර් එකක්, සුවඳක් දැනුණත් සෙන්සර් එකක් රසක් දැනුණත්, උණුසුම සීතල දැනුණත් සිතුවිල්ලක් ආවත් 'සෙන්සර්' එකක්. දැන් මේක දකින යෝගාවචරයාට මේ ඔක්කෝම 'සෙන්සර්' එකක්. ඒ හැම එකකම කෙනෙක් දෙයක් නැති බව දැනෙන එකක්, හැබැයි ඒක විඤ්ඤාණ මායාවෙන් තමයි එන්නේ. මේක මේ නිවන් දකින 'ඔරිජිනල්' එක නොවේ. ඒක සවිතක්ක ස්වභාවයක්. ඒ කියන්නේ හිතන හින්දා එහෙම දැනෙන්නේ. දෙයක් නැති බව හිතනවා එයා. එතකොට විඤ්ඤාණ මායාවෙන් එනවා ශූන්‍යතාව. එතකොට එයා හිතනවා එයා දියුණුයි කියලා. මිදිලා කියලා හැබැයි එහෙම දෙයක් නෑ ඒකට හේතුව, ආයි ඊගාවට හිතපු නැති ගමන් බලන කොට ඇයි එයා එතකොට එතනට බැස ගන්නවා. අර කමටහනක් විදියට ඒක උත්සාහ කරන එක යහපතක් සිද්ධ වෙනවා. එතකොට හරි දේ පුරුදු වෙනවා. එතකොට මාර්ගයට එනවා. එතකොට එතනින් තමයි අවිතක්ක ස්වභාවය මතුවෙන්නේ. අවිතක්ක ස්වභාවය අවශ්‍යයි. ඒ නිසා මෙනෙහි කිරීම අවශ්‍යයි. ඒක 'යෝනිසෝමනසිකාරය' 'යථාභූත ඤාණය' කියන කොට, ඒක ඕන කෙනෙකුට තේරෙනවා සවිතක්ක ස්වභාවය තමයි, මාර්ගයේ ස්වභාවය කියලා තේරෙනවා. හැබැයි ඵල ස්වභාවය ඒක නොවෙයි.

එතකොට මේකෙ තියෙනවා තවත් ස්වභාවයක්. ඒ කියන්නේ අපේ 'ඔරිජිනල්' එක ඒක නෙවෙයි. ඒක සකස් කරගත්ත එකක්. මේකේ සැබෑම **ශූන්‍යතාවය, සේරම තියෙනවා අර මුකුත් නැති වෙලා නෙවෙයි, චේතෝ විමුක්තියක් ගැන කතා කරනවා චිත්ත විමුක්තියක් ගැන. ඒ කියන්නේ සේරම තියෙනවා කතා කරනවා. දැනෙනවා ඇහෙනවා සාමාන්‍ය විදියමයි. හැබැයි එකකටවත් බැසගෙන නෑ කියන්නේ 'සෙන්සස්'වල විදිය දැකලා මිදුණු ස්වභාවයමයි. දැන් මෙනෙහි කිරීමකුත් නැතිව කිසිම**

**දෙයක් නැතිව කිසිම දේක හරයකුත් නෑ. මොකුත් නැති ස්වභාවයක් දැනෙනවා. අන්න ඒ ස්වභාවය තමයි, 'අලමරිය ඤාණ දර්ශනය ස්වභාවය.' ඒ ස්වභාවය අවිතක්ක ස්වභාවයක් මෙනෙහි කිරීමක් නෑ.** කාලයක් තිස්සේ මෙනෙහි කරපු කෙනෙකුට මේ ස්වභාවය මතුවෙනවා, මේක දියුණු අවස්ථාවක්. මේක අනාගාමි භූමිය, මේ ලෝක සංඥා බැස ගන්නේ නැති ස්වභාවයක්. එතන අනාගාමි භූමිය ලෝක සංඥා බැස ගන්නේ නැති ස්වභාවයක්.

මේක ඇතුලේ තියෙනවා වෙනම පරියායක්. හැබැයි දැන් ඔය ස්වභාවයේ බැස ගත්තොත් එහෙම මෙතන, අපි හිතමු දැන් බැසගත්ත ස්වභාවය මොකක්ද කියලා බලමු. අර කෙනා පිරිහෙනවා කියලා අපි කිව්වානේ, මේක මෙනෙහි නොකරන අවස්ථාවක් ආවොත් එයා පිරිහෙයි කියලා අපි කිව්වානේ. එහෙමනම් එතන අවදානමක් තියෙනවානේ. ඒක ඔර්ජිනල් නෙවෙයිනේ. මේක මෙනෙහි කරන හින්දා මතුවෙනවා කිව්වේ, මෙනෙහි නොකරපු වෙලාවට ආයි අර හිටපු තැනටම වැටෙනවා කිව්වේ, ඒකයි බැහැ ගන්නවා කිව්වේ. **යෝගාවචර භූමිය වෙනයි, අර මිදුණු ස්වභාවය වෙනයි. මිදුණු ස්වභාවය මෙනෙහි කිරීමකින් තොරවම ඒ ස්වභාවය මතුවෙනවා. එතකොට එයාට මෙනෙහි කිරීමකින් තොරවම හැම මොහොතකම එයාට දෙයක් වෙලා දැනෙන්නේ නෑ කියන්නේ ඒක තමයි දියුණු අවස්ථාව. ඒක තමයි පංචඉන්ද්‍රියධර්ම පංච බල ධර්ම වෙන අවස්ථාව කියන්නේ ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා කියන කොට 'ශ්‍රද්ධා' කියන්නේ සත්‍ය දකිනවා, වීරිය කියන්නේ ඒකට ගන්න වීර්ය සතිය කියන්නේ සම්මා සතිය දෙයක් නොවන ස්වභාවය මතුවන සමාධිය, සම්මා සමාධි.** ශ්‍රද්ධා, වීර්ය සති, සමාධි ප්‍රඥා කියන්නේ මේකේ විඤ්ඤාණ මායාවට රැවටුණේ නෑ. පඤ්ඤාභාවේ තබ්බං විඤ්ඤාණං සවිනෙය්‍ය ශ්‍රද්ධා වීරිය සති සමාධි ප්‍රඥා කියන්නේ මේ අරමුණ මිදෙන හැටි තමයි. ඇත්තටම කිව්වොත් සත්තිස්බෝධිපාක්ෂික ධර්මම තියෙන්නේ මෙතනමයි මේ අරමුණේ දකින තැන තියෙන්නේ. ඔතනමයි සතර සම්‍යක් ප්‍රධාන වීර්ය ගත්තත් ඉන්ද්‍රිය ධර්ම බලධර්ම හැම එකක්ම තියෙන්නේ ඔතනමයි. බොජ්ඣංග ධර්මත් ඔතනමයි. මේකේ වෙන කතාවක් නෑ.

මේක දකින එක ලේසි නැති එක වෙන කතාවක්, දකින තැන ඔක්කොම කතා තියෙනවා. දැන් මෙන්න මෙතන බැසගත්තොත්, බැස ගත්තා කියලා සිහියටනේ අසුවෙන්නේ. දැන් බිත්තිය දැකලා බිත්තිය දැක්ක බවට සිහියක් තියෙනවානේ. බිත්තිය දෙයක් වෙලා, මේක පරණ බිත්තියක් මේකේ තීන්ත ගාන්න ඕන. හරියන්නේ නෑ කඩලා දාන්න ඕන, මේ 'මඤ්ඤද මානේ එන්නේ' කොහෙන්ද. අන්න එතන තියෙනවානේ 'සෝක පරිදේව,' ඒ කියන්නේ එතන තියෙනවානේ ඇලීමක් ගැටීමක් ඇතිවෙලා, ඒකට ඇලිලා නැත්නම් ඒකට තීන්ත ගාන්න යනවා. නැත්නම් ඒක ගැටිලා ඒක කඩන්න යනවා. එහෙනම් එතන 'රාග, ද්වේෂ, මෝහ' තියෙනවා. ඒ බිත්තියම තමයි මේ කතා කරේ. එතකොට බිත්තිය පළවෙනියටත් දැකපු බවට සිහිය තියෙනවා. ඒක නෙමෙයි මේ, ඒක ස්කන්ධ මට්ටම. හැබැයි ඊට පස්සේ 'වර්ණ පටිසංවේදී', බිත්තිය දැක්කා, 'වර්ණ රාගන' පටිසංවේදී' ඕක පරණ උනත් එකයි, අලුත් උනත් එකයි, තිබ්බත් එකයි, නැතත් එකයි. අහක බලාගෙන ගියා වගේ වැඩක්, අරය බිත්ති කඩන්න යනවා, තීන්ත ගාන්න යනවා. මෙයා ගාණක්වත් නැතුව ඉන්නවා සමහරවිට එකම ගෙදර අයියයි, මල්ලී වෙන්න පුළුවන්. අයිය ගාණක් නැතිව ඇඳට වෙලා ඉන්නවා කකුල් දෙක පද්ද පද්ද. මල්ලි ගිහිල්ලා බිත්තිය කඩනවා වෙන්න පුළුවන්. තේරුණාද? මේ කතාව. සැනසීමෙන් ඉන්නේ අයියද මල්ලිද? මල්ලි දාඩිය දගෙන වැඩ අම්මා කියනවා මල්ලි කොච්චර හොඳයිද? අයියාට ගාණක්වත් නෑ කියලා. ඕක තමයි නිවන් දකින එක්කෙනාට අහන්න වෙන්නේ. ඒකයි රහතන් වහන්සේ ගණන් ගන්නේ නැත්තේ.

ඇයි 'ජබ්බිසෝදන සූත්‍රයේ' 'න සංඝං ගජ්ජන්ති' කියන්නේ. ගලනයක් නෑ රහතන් වහන්සේට. ගණන් ගන්න දේකුත් නෑ වත්කමකුත් නෑ. 'අල්පේච්ඡතාව' කියන්නේ ඕකයි. එතකොට මිනිසුන් ගණන් ගන්නේ නෑ රහතන් වහන්සේ. මිනිසුන් ගණන් ගන්න, වත්කම් තියෙන්න ඕන, දේපළ තියෙන්න ඕන නේද? එතන ඉන්නවාද? රහතන් වහන්සේලා, ඒකයි 'ජබ්බිසෝදන සූත්‍රය' තියෙන්නේ අල්පේච්ඡතාව මිසක් මහෙච්ඡයාට නෙමෙයි. ඔබතුමිය අහපු ප්‍රශ්නය වැදගත්. මෙතන හසුවෙන්නේ නුවණටයි. මෙතන දෙයක් වෙනවාද? නැද්ද කියලා. හැබැයි මේකේ මෙහෙම දෙයක් තියෙනවා. මේක ඉතාම ගැඹුරුයි. ඒකයි 'ලේයර්ස්'

දේශනාවල තියෙන වටිනාකම. ඒ කියන්නේ ඔබතුමියට පුළුවන් බිත්තිය කඩන්න. බිත්තියේ තීන්ත ගාන්න. ඔබතුමියට පුළුවන් ඔය හැම එකක්ම දෙයක් නොවී කරන්න. ඒක මේ අවබෝධය තුළ සිද්ධ වෙනවා. ඊට පස්සේ මේ ධර්මය දකින්න. දෙයක් නැති බව දකිනවා. දෙයක් නැති බව කවුද දන්නේ කාටද දැනෙන්නේ, මේ අභ්‍යන්තර සිහියට දැනෙන්නේ. දෙයක් නැති බව අභ්‍යන්තර සිහියට දැනෙනවා කියන්නේ ඇත්තටම දෙයක් නැති බව දැනෙනවා. හැබැයි මේ බිත්තිය තීන්ත ගෑවොත් හොඳ බව දන්නවා. ඒක දැනුමක් විතරයි. ඒක දන්නවා හැබැයි දෙයක් වෙලා නෑ. ඒක ගෑවත් ඒකයි නැතත් එකයි. එයාට පුළුවන් නම් ඒකත් කරනවා. මේ ස්වභාවය අර ස්වභාවය ඒ දෙකම නොවේ. මේ ධර්මය අවබෝධ තුළ මේ ලේයර්ස් ටික පෙන්නුවේ ඕකයි. මෙතන අභ්‍යන්තර සිහියයි මේ කතාවේ තියෙන්නේ. 'සම්මා ඤාණ' කියන තැන 'ඤායස්ස අධිගමාය' කියන තැන. ඒ අභ්‍යන්තරේ සිහියට අසුවෙනවා කියන තැන. මේක හිතන එකක් නෙවෙයි. මේක කියන්නම බැරි එකනේ.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස උදාහරණයකුත් එනවා කියන්න. කෙනෙක් වෙන ස්වාමීන් වහන්සේ කෙනෙක්ගේ ධර්මය මට අහන්න සැලැස්සුවා. වෙනදා නම් මට එහෙම අහන්න වුවමනාවක් නෑ. ඇතුළෙන්ම එනවානේ 'බුද්ධෝත්පාදෝ' දේශනා අහල වෙන ඒවා අහන්න බෑ වගේ අර මමයා එනවානේ. නමුත් එතනදී දැන් මම ප්‍රතික්ෂේප කිරීමක් උනේ නෑ. දැන් මට සිහිය තියෙනවා. එතන මම පොඩි අකමැත්තක් තියෙනවා. අරක අහගෙන ඉන්නවා දැන් ඇතුලේ ලොකු කලබලයක් නෑ මගේ. ඊට පසුව මම බොහොම සන්සුන්ව මම ධර්මය ප්‍රායෝගිකව දකින ආකාරය කිව්වා, ධර්මය ප්‍රායෝගිකව දකින්න පුළුවන් දෙයක් කියලා කිව්වා. එයා ඒක පිළිගත්තා. මට අභ්‍යන්තරයෙන් මට සිහිය තියෙනවා. මට ඇතුළෙන් දැනෙනවා මම ඉන්නවා කියලා වෙනදා තරම් නෙවෙයි යම්කිසි ප්‍රමාණයකට දැනීමක් තියෙනවා ආර්යයන් වහන්ස අර සිහියත් එක්ක, මම දැන් ධර්මය දන්නවා මම තමයි සත්‍ය ධර්මය දන්නේ කියනවා වාගේ අභ්‍යන්තරයෙන් එනවා. එතකොට ආර්යයන් වහන්ස, ඒකද දැන් මේ ඔබවහන්සේ දේශනා කරන්නේ. අරමුණ දකින එකමයි මම කියන තැන.

**ආර්යයන් වහන්සේ:** දැන් ඔය අරමුණ දකින එක, දැන් අපි හිතමු මනාරම්මණයක් ගනිමු. මනසින් අරමුණු එනවා තමයි. වැරදියි කියලා හිතුවොත් ඒක ආරම්මණයක් තමයි. හොඳයි කියලා හිතුවොත් හොඳයි තමයි ආරම්මණයක් තමයි. එතකොට ඒක 'සෙන්සර්' එකක් විතරයි. එතන ඒක. දැන් මෙතන 'රමණීය වනපෙත සුන්දරයි කිව්වොත් ඒකත් සුන්දරයි තමයි. ලස්සනයි කිව්වොත් ලස්සනයි තමයි. කැතයි කියන්න බෑ නේ. දැනුම නැතිවෙලා නෑනේ. කවුරුහරි කිව්වොත් කැතයි කියලා කැතයි තමයි. දැන් කවුරුහරි කිව්වොත් මේ සින්දුව මිහිරියි කියලා. ඔව් මිහිරියි තමයි. ඝෝෂාව කියලා කිව්වොත් 'ඝෝෂාව තමයි. දැන් ඉතින් ප්‍රශ්නය කොහේද? තියෙන්නේ දැන් අභ්‍යන්තරේට මනෝ සෙන්සර් එකට. අත්දෙක තියාගෙන සමතය වඩන්න ගියොත් අතීතය මතක් වෙනවා තමයි, අනාගතෙත් එනවා එහෙම තමයි මනෝ 'සෙන්සර්' එක, තමන්ට ඒක නවත්වන්න පුළුවන්ද? දැන් මෙතන තියෙන්නේ මේකයි. දැන් මෙතන අභ්‍යන්තර සිහියට තමයි අසුවන්නේ මේකට ඇලිලාද? ගැටිලාද? රාග, ද්වේෂ, මෝහ තියෙනවද? කියලා රාග, ද්වේෂ, මෝහ නැත්නම් ගැටලුවකුත් නෑ.

**උපාසිකාව:** එතකොට ආර්යයන් වහන්ස 'රාග, ද්වේෂ, මෝහ' ඇතිවෙන්නේ නැහැ කියලා සිහියට අසුවෙනවා කියන්නේ එතන දෙයක් වෙලා නෑ කියලා.

**ආර්යයන් වහන්සේ:** එතකොට ඇලෙන්න හරි ගැටෙන්න හරි එතන දෙයක් තියෙන්න ඕන. මෙතන ඇවිල්ලලා අපි කතා කරන්නේ **'සබ්බ පාපස්ස අකරණං, කුසලස්ස උපසම්පදා' කුසලස්ස උපසම්පදාව සම්පූර්ණයෙන්ම සිහියටයි අසුවෙන්නේ, කුසලය කියන්නේ සිහිය. සිහියෙයි කිව්වාට මේ සාමාන්‍ය සිහිය නොවේ. සිහිය කියන්නෙ 'ඤායස්ස අධිගමාය' ඤාණයට අසුවෙන්නේ, 'සම්මා ඤාණ' කියන තැන** ඤාණෙට හසුවන්නේ මොකක්ද? මේකෙ බලය තියෙන්නේ දෙයක් තියෙනවා කියල දැනෙන තැනයි කියල. දෙයක් තියෙනවා කියලා දැනෙන්නේ නැත්නම් බලය නෑ කියලා කිව්වා. එතකොට එතන අංශු දෙකක කම්පනයක් පෙන්නන්න බෑ, එතන එක අංශු දෙකම එක වෙනව. එතන මෙතන නැතිවෙනවා. එතන මෙතන තියෙන්නේ දෙයක් විදියට කම්පන බලය.

කම්පන බලය කියන්නේ රාග, ද්වේෂ. මෙතන මේ බලය අභ්‍යන්තර සිහියට හසුවෙනවා. ඒක සිහියට හසුවෙනවා කියන්නේ, මාර්ගයට පිළිපන්නයි කියන එක. මාර්ගයට පිළිපන්නයි කියලා කියන්නේ එතන, එතන ඉඳලා එන සෑම අරමුණටම ආරෝපණය, චිත්තා රෝපණය තව විදියකින් කියනව නම් 'නන්දිය' තව විදියකින් 'අජ්ජෝසාය තිට්ඨති' බැස ගත්තේ නැත්නම් නන්දියක් නෑ. බැස ගත්ත නම් නන්දියක් තියෙනවා. එහෙමනම් රාග, ද්වේෂ, මෝහ තියෙනවා. ඇලෙනවා ගැටෙනවා. අපි අපේ අත්දැකීම හෙළිකිරීම කරනවා පමණයි. ඔබට ඒ අත්දැකීම ආපු දවසට තමයි. ඔබ මේක භාර ගන්නේ. එතකන් මේක බාර ගන්නේ නෑ. මෙතන තියෙනවා අති ගැඹුරු පැත්තක්. ඒ තමයි, ඔබ හඬනවා කියල හිතන්න. ඔබේ දරුවා නැති වෙලා කියලා හිතන්න. ඒත් ඔබ බැසගෙන නෑ. මේක මේ හරි පුදුම කතාවක් මේ කියන්නේ. මේ කියන්නේ ඇත්තටම මේක හිතන්න බෑ ඉස්සෙල්ලාම පළවෙනි කතාව. හිතන්න බැරි හිතන එකක්වත් මේකේ නෑ. මේකේ 'ඤාණයස්ස අධිගමාය' කියන එක සිතුවිලි සීමාව එහාට ගිහිල්ලා තියෙන්නේ.

ඒ කියන්නේ **මේ ධර්ම අවබෝධය තුළම මේක සිද්ධ වෙනවා. මේ ධර්ම අවබෝධ තුළම ශබ්ද, වර්ණවල කම්පනවල දෙයක් නැති බව ඒක මෙනෙහි වෙනවා. එතකොට අපිට දරුවෙක් කොහෙද ඉන්නේ. අපිට මහත්තයෙක් කොහෙද ඉන්නේ? අපිට ගෙවල් කොහෙද තියෙන්නේ. ඔබට හැබැයි පුරුද්දට එන්නේ නැද්ද, පුරුද්දට මේක එනවානේ. මේ හැම එකක්ම පුරුද්දක් නේද? එතකොට මේ අභිසංකරණය තුළ 'සබ්භූපදි' පටි නිස්සග්ගෝ කියන්නේ 'සබ්භූපදී' කියන්නේ උපදිගොඩ මේ කාලයක් තිස්සේ එකතු කරගත් ගොඩවල් අභිසංකරණයට ලක්වෙලා, සිස්ටම් එකෙන්ම ක්‍රියේට් වෙනවා.** මේක සිස්ටර්මැටිකලි වෙන්නේ. මේක හිතන එකක් දැන් මේක කියන්න වෙන්නේ මෙහෙම තමයි. අම්මා මැරුණා කිව්වාම දුකක් එන්නේ නැද්ද? ඒක සිස්ටම් එකෙන්ම එන්නේ නැද්ද? ඒ සිස්ටම් එකෙන්ම එනවානේ. හැබැයි ඇත්තටම ඔබේ මේ අභ්‍යන්තර පරිවර්තනය ඔබට කිසිම වෙලාවක හිතන්න බැරි එකක්. මේක හිතන්න බෑමයි කවදාවත්. ඔබ ඒක හිතුවොත් තේරෙයි ඒක හිතන්න බැරි බව. හැබැයි ඔබට දැනෙනවා එටබ ඒකත් දෙයක් වෙලා නෑ කියලා.

මේක අභ්‍යන්තර පරිවර්තනයකටයි දැනෙන්නේ. කවදාවක් මේක හිතන්න බෑ. ඒකත් කියන්න ඕනේ. මේක හැබැයි ඔබේ සිහියට හසුවෙනවා. ඔබ සමහරවිට හඬනවා බලන් ඉන්න කෙනාට සාමාන්‍ය විදියටම පේනවා. හැබැයි ඔබේ අභ්‍යන්තරය තුළ, ඇත්තටම ඔබට කිසි ගින්නක් නෑ. හැබැයි සිස්ටම් එක ඔබට පෙනෙන්නේම, බාහිරට පෙනෙන්නේම අර අර ආපු අභිසංකරණ සිස්ටම් එක ඇතුළේම දිගුවක් විදියට මේක අර සිස්ටම් එකම පේනවා. එළියට පේනවා මේ සිස්ටම් එකම පේනවා. හැබැයි ඔබේ අභ්‍යන්තරේට ඔබට සිහියට අසුවෙනවා. මේක සිහියට අසුවෙනවා. මේ මාර්ගය තුළ ඉතාම දියුණු මට්ටමට එනකොට ඒක සිහියට හසුවෙනවා. ඒක සිහියට හසුවෙන්නෑ කියලා කියනවා නම් එයා මේ මාර්ගයේ අභ්‍යන්තර පරිවර්තනයක් වෙලා නෑ. මේක කියන්න පුළුවන් වෙන්නේ අභ්‍යන්තර පරිවර්තනයක් තුළ, ඒ අත්දැකීම් ඇති කෙනෙකුට පමණයි එවැනි ස්වභාවයකට විතරයි කියන්න හැකිවන්නේ. නැත්නම් අපට පුළුවන් බොරුවට හරි කියන්න. ආ ඒක මෙහෙමයි, මෙහෙමයි කියන්න. ඒක හරියන්නේ නෑ. **ප්‍රත්‍යක්ෂතාවක් තුළ අභ්‍යන්තර පරිවර්තනයක් තුළ ඔබට මොන සංඥාව ආවත්, ඒ කියන්නේ මේ කතාව දිග ඇරිලා ඉවරයි. මේ එක තැනකවත් අභ්‍යන්තර සිහියට ඔබට මේ දෙයක් වෙලා නැති බව ඒක දැනෙනවා. ඒක දැනෙන හේතුවක් හොයන්නත් බෑ.** ඒක හරි පුදුම කතාවක්. ඒ කියන්නේ කාලයක් තිස්සේ ඔබ මේ සත්‍යමයි තමයි ඔබ පෙන්නන්නේ සිතට.

ඔබ මේ මාර්ගයේ යනකොට මේ ප්‍රතිපදාව තුළ එහෙම කිව්වාට එහෙම දේකුත් නෑ, මේක තියෙන්නේ අවබෝධ ඥාණය තුළයි. අවබෝධය තුළ එදිනෙදා සතර ඉරියව්වේම මේ කිසිම තැනක මේ සෙන්සස් ටිකම දකින්න ගන්න ගත්තාම හොඳට මේක ක්ලියර් වෙනවා. මේ මොන දේ සිද්ධ වුණත් මොන විදියට උනත්, මේ අභ්‍යන්තර සිහියට අසුවෙනවා. කම්පනය නැති ස්වභාවය අසුවෙනවා. මොන විදියට වුණත් ඒක අසුවෙනවා. මේ නිසා තමයි 'ලේයර්ස්' දේශනා දිග අරින්න හේතුව. සිංහල අවුරුදු වෙලාවේ තමයි 'මනෝසෙන්සර්' එක දිග හැරියේ. දෙයක් නොවන දුකක් තියෙනවා දෙයක් නොවන සතුටක් තියෙනවා කියන්න හේතුව ඕකයි. ඔබ බැලුවොත්, ඔබට දුක තියෙනවා. හැබැයි ඒ දුක ඔබේ අභ්‍යන්තරයට දෙයක් වෙලා නෑ. ඒක තමයි කිව්වේ දරුවා

මැරෙනවා දරුවාගේ ආදාහනය කරනවා. යාළුවෝ ඇවිල්ලා කියනවා අර විදියට කන්න දීපු ඔක්කෝම විස්තර කියන කොට එතකොට මෙයාට ඇඬෙනවා දුකක් එනවා. ඇත්තටම අභ්‍යන්තරයේ 'සෝක පරිදේව' තියෙන්න ඕන. ඊළඟ දවසේ උදේ යනවා වැඩට. එතකොට මෙයාට කිසි ගින්නක් නෑ. එතකොට අල්ලපු ගෙදරින් කියනවා අර බලන්නකෝ අර මනුස්සයා වැඩට යනවා කියලා. එයා දරුවා නැතිවෙලා අඬ අඬා හිටියේ. අන්න එයා අදට වැඩට ගියා, මේක කොහොමද වුණේ කියලා බලනවා. ඇත්තටම හිතක් පපුවක් නැද්ද කියලා. ඇත්තටම හිතක් පපුවක් නෑ තමයි. ඇයි 'සෝක පරිදේව' නෑ කියලා දැනෙනවා. මේක හරි පුදුම කතාවක් වෙනවා. හැබැයි මේක සත්‍ය කතාව, මේකෙ විඳවන්නේ නෑ ලතවෙන්නේ නෑ සෝක පරිදේව නෑ. හැබැයි ඒ මොහොතේ බැලුවොත් අර ස්වභාවයක් තියෙනවා.

හැබැයි මේකෙ අභ්‍යණ්තර පරිවර්තනයේ තවත් ටිකක් සියුම්ව පෙන්නන්න පුළුවන්. ඒක ඊටත් වැඩිය ගැඹුරුයි. ඇත්තටම කිව්වොත් මේ ආත්මයක් නැති බව දැනෙන, 'අනාත්ම සංඥාව' කවදාවත් හිතලා ගන්න බෑනේ. ඔය හිතලා කියන එකක්වත් හරියන්නේ නෑනේ. ඒ කියන්නේ ආත්මීය දැනීම කියන්නේ අසංඥ තලේත් තියෙනවා. දැන් මොකුත් නොදැනෙන ස්වභාවයට පත්වෙලා, ඒ නොදැනෙන ස්වභාවයම තමයි ආත්මීය ස්වභාවය බලන කොට. ඒකට හේතුව ඉන්නවා කියලා ආපු ඉත්තභාවය ඉන්නව කියන ඒ සංඥාව, අර 'සක්කාය දිට්ඨිය' ප්‍රහානය වෙලා නැත්නම් මොන දේ කළත් හරියන්නේ නෑ. එතනින් තමයි මේක කුඩු වෙන්නේ. ඒ අවබෝධය තුළ මේ සක්කාය දිට්ඨිය ප්‍රහානය තුළින් තමයි සම්පූර්ණ නිවන් මග තියෙන්නේ.

**මේ සම්පූර්ණ නිවන් මග තියෙන්නේ එක තැනකින් යටි නූල අසුවුණා වගේ තමයි සේරම යන්නේ. මේ 'සක්කාය දිට්ඨි ප්‍රහීනවීම' ඒ කියන්නේ මෙතන ආත්මය හැදෙන හැටි දකින්නම ඕන, ආත්මයක් හැදෙන හැටි දැක්කොත්, ආත්මයක් ඇත්තටම නැති බවමයි එතන අවබෝධ වෙන්නේ. ඒක නිතර මෙනෙහි වෙන්නත් ඕන. ඊට පස්සේ එයාට කොහොමත් එයා ආත්මය පරිහරණය කරන්නේ නෑ.** එයාට ආත්මයක් නෑ. එතකොට එයාගේ ආත්ම දෘෂ්ටිය බිඳ වැටෙනවා. දෘෂ්ටිය කියන්නේ සිතුවිල්ල.

සිතුවිල්ල කියන්නේ දැන් අපේ ලෝකය මොකක්ද? තියෙන්නේ අඹ ගස්, කොස් ගස්, කරපිංචා ගස් එහෙම නැත්නම් නේද? මේස, පුටු, ඇඳන්, යානවාහන, ගෙවල් දොරවල් මොනවාද අපේ ලෝකේ තියෙන්නේ. ඔය ඔක්කෝම ශබ්ද, වර්ණනේ. ගන්ධ රස පහසනේ. ඕවා කොහේවත් තියෙනවා නෙවෙයිනේ. ඔය ඔක්කෝම සිතුවිලිනේ. සිතුවිලි කොහේවත් හම්බ වෙන්නේ නෑනේ. අම්මා කිව්වත්, ශබ්ද වර්ණ විතරයි. ඇසින් කනින් උපදින්නේ අම්මා. දැන් තමන් කොහෙද ඉන්නේ. ඒකත් නාම-රූප නේ. නාම-රූප කියන්නේ ශබ්ද, වර්ණනේ, ඉතින් තමන් කවුද එතකොට කොහෙද ඉන්නේ තමන් දැන් උදේ සූම් එකේ එකපාරටම අම්මා කෙනෙක් අහපු ප්‍රශ්නයකට කීවානේ ඒ අම්මාගේ ස්වභාවයට ඒ උත්තරය තමයි හරියන්නේ. දැන් ඔබතුමිය කොහේද ඉන්නේ.

**උපාසිකාව:** මම කියල කෙනෙක් නෑනේ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔය ඔබතුමිය හිතනවානේ මෙතන කෙනෙක් නෑ කියලා. ඇයි මේක හිතන්නේ ඇයි මෙහෙම කියන්නේ. ඔබතුමිය කොහෙද ඉන්නේ? ඇයි ඔබතුමියට අභ්‍යන්තර පරිවර්තනයක් වෙලා නැත්තේ. අභ්‍යන්තර පරිවර්තනයක් කියන්නේ, තමන්ගේ අභ්‍යන්තරේ තමන් නැතිවෙන එකක් ඊට පස්සේ කතාවක්වත් නෑ. මොකක්ද දැන් කියන්න තියෙන්නේ. කෝ කතාව? කෝ දරුවා. කෝ තමන්, මට මම නැතිවෙන හැටි කියලා දේශනයක් දැම්මේ ඒ නිසයි. දැන් එතකොට අපි කියනවා නේ කතා කරනවා කියලා. දැන් ඔබතුමිය කොහේද ඉන්නේ? දැන් ඔබතුමිය මොකද කරන්නේ, ඊට පස්සේ කතා කරනවා. **දැන් හැම තිස්සේම ඔබතුමිය ඔබතුමියගේ පස්සෙන් ගියොත් හෙවණැල්ල වගේ ඔබතුමිය, ඔබතුමිය මක මක ගියොත් හැම තිස්සේම, ඉස්කෝලේ යනකොට ලියපුවා මකනවා වාගේ ගියොත් ඔබතුමිය, හැමතැනම ඔබතුමිය මකලා දැම්මොත්, එහෙම ඕක නේද කමටහන.** දැන් කලින් මැකුවේ මොකක්ද? 'සෙන්සස්' ටික දැක්කේ, කලින් දැක්කේ මේ ඔක්කෝම 'සෙන්සස්' විදියට දැක්කා. ඒ කමටහන ඒ විදියට දැක්කා.

එතනත් කෙනෙක් හිටියේ නෑ. 'සෙන්සස්' ටික විතරයි. ඒකෙ එතනත් මමයා හිටියේ නෑ 'සෙන්සස්' ටික විතරයි. ඒ උනාට වැඩ කළා, කවුද ඊට පස්සේ සෙන්සස් ටික වැඩ කරනවා. කෙනා නෑ. 'සෙන්සස්' ටිකවැඩ

කරනවා කෙනා නැතිව, සිතුවිලි ආවොත් ඒක මනෝ සෙන්සස් එක දුක ආවත් 'මනෝ සෙන්සර්' එක, අර ආපු දැනීමට 'මනෝ සෙන්සර්' එකේ දැනගැනීම ඒක අර 'සෙන්සර්' එකක් විතරයි. අර 'කාය විඤ්ඤාණයට' අර 'ආයතන විඤ්ඤාණයට', 'මනෝ විඤ්ඤාණයට' එච්චර තමයි. ආයි මේක 'මනෝ සෙන්සර්' එකක් එනවා, ඒ සිස්ටම් එකෙන්ම එනවා එතකොට 'මනෝ සෙන්සර්' එකෙන් කොහේද වතුර කියලා.' එතකොට අතපය යනවා කකුල් යනවා 'මනෝ සෙන්සර්' එකෙන් 'සිග්නල්' එක එනවා අරවා වැඩ කරනවා. සිස්ටම් එක 'රොබෝ' වගේ. කෙනෙක් කතාවක් නෑ ඕකේ. උදේට නැගිටලා රැකියාවට යන්නෙත් එහෙම තමයි. සෙන්සස් සිස්ටම් එකෙන් යන්නේ, අර රිමෝට් එකෙන් යනවා වාගේ වැඩක් වෙන්නේ.

මේක අවබෝධ උනාට පස්සේ 'රිමෝට්' එකෙන් යන්නේ බලනකොට තමන් යන්නේ නෑ කොහේවත්, ඒවා 'රොබෝ' වගේ දුවනවා. එච්චර තමයි. කෙනෙක් දුවන්නේ නෑ ඊට පස්සේ, 'සතිය තමයි අපේ ගෙදර' ඒ කියන්නේ සම්මා සතිය සම්මා සතිය කියන්නේ දෙයක් නොවන ස්වභාවය ගෙදර වෙලා. තමන් කොහේද ඉන්නේ 'එම්ටිනස්' එකේ. 'එම්ටිනස්' කියන්නේ ආත්මයක් නැති අනාත්ම සංඥාව කියන්නේ සංඥාවක් නොවෙයි, ආත්ම සංඥාව දියවී ගෙන යන එක විතරයි මේකේ න සඤ්ඤ සඤ්ඤී - න විසඤ්ඤ සඤ්ඤී - නො පි අසඤ්ඤී - න භූත සඤ්ඤී කියල පෙන්නුවට එතන සංඥා බලගැන්වෙන්නේ නෑ. සංඥා අභිසංකරණය වෙන්නේ නෑ. ඒ කියන්නේ අරකම්පනය නෑ. ඒ වුණාට සිස්ටම් එක ඒ විදියමයි, දැනෙන ඒවා එන ඒවා ඔක්කෝම ඒ විදියටම සිස්ටම් එක දුවනවා තමන් නෑ කියන්නේ ගින්නක් නෑ කියන්නේ එතකොට තමන් කොහේද ඉන්නේ. තමන් කම්පනය නොවන ස්වභාවයේ කියල, මේක සිස්ටම් එකෙන්ම ක්‍රියේට් එකක්. මේ සිහිය කිව්වේ කම්පනය නොවන එක. මේ සිහිය උඩ තමයි ඔක්කොම හැදෙන්නේ කියල කම්පන ඔක්කෝම පොඩ්ඩක් කම්පනය වුණොත් කම්පනය නොවන ස්වභාවයට නේද අහුවෙන්නේ කියල කිව්වා. ඊට පස්සේ තමන් කොහෙද ඉන්නේ කියලා බැලුවා. දැන් සිතුවිලි වලනේ ඉන්නේ, එතකොට කම්පනය ආත්ම ස්වභාවයේ දැන් 'අකොප්පා චේතෝ විමුක්තිය' තුළ තමන් කොහේද ඉන්නේ. කම්පනය නොවන ස්වභාය පනවන්න පුළුවන්ද? බෑ තමන්ට

තමන් අහිමියි. මට මම නැතිවෙලා තමන් කොහේද ඉන්නේ ඒ ස්වභාවයේ තමයි තමන් දන්නේ නැති උනාට 'ස්වභාව දමයට නොවන අවනත කිසිවෙක් නැහැ' කියලා කිව්වේ ස්වභා දහම කිව්වේත් මේ කම්පනය තමයි.

නමුත් මේකෙ තව පැත්තක් තියෙනවා. ස්වභාව දහම්මේ නිර්මාණයක්. ඇත්තටම ඔබ මේ ඉන්නේ හරියට බැලුවොත් එම්ටිනස් එකේ. එම්ටිනස් එක කියන්නේ කෙනෙක් පුද්ගලයෙක් නෙවේ අපි මේ සිතුවිල්ලක් කෙනෙක් ආත්මයක් කියලා අරගෙන, ඒක එහෙම එකක් නොවේ. එතනින් මේ ඔක්කෝම හැදෙන්නේ, ශූන්‍යයත පටිසංයුක්ත දේශනා කිව්වේ ඒ නිසයි, "නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ" කිව්වේ. **දැන් තමන්ගේ ගෙදර කොහේද? 'සතිය තමයි අපේ ගෙදර. මොන සතියද 'සම්මා සතිය' සම්මා සතිය කියන්නේ සම්මා දිට්ඨි ඔස්සේ දෙයක් නැති බව දකින දෙයක් නැති ස්වභාවය,** ඉන්න තැනක් නෑ. යන්න තැනක් නෑ, කරන්න දෙයක් නෑ, ඉන්න කෙනෙක් නෑ, මැරෙන්න කෙනෙක් නෑ. කතාවකුත් නෑ, වචනත් නෑ, මොකුත් නෑ. හැබැයි ඔක්කෝම තියෙනවා මොකක්ද වෙලා තියෙන්නේ ඉන්නවා කියල හිතපු සිතුවිලි ටික, දෙයක් කියලා ගත්ත සිතුවිලි ටික. නැති වුණා නම් නැති වුණේ ඉන්නවා කියලා හිතල තිබුණු සිතුවිලි ටික විතරයි. සිතුවිලි කියන්නේ කොහොමත් ශබ්ද වර්ණ, ඒකෙන් දෙයක් හදලා පෙන්නුවා මමෙයි කියලා. ඒ ඔක්කෝම ඉවරයි දැන්. දැන් නිවන් දකිනවා නේ.

දැන් ඔබතුමිය ගෙදර ඉන්නවා, ගෙදර තියෙනවා. 'එම්ටිනස්' එකක් නිකන් උපමාවක් කියන්නේ දැන් ගෙදර එම්ටිනස් එකට ප්‍රශ්නයක්ද? ගෙදර මිනිස්සු කෑගහන එක, දඟලන එක. මේ හූ කියන එක ළමයි සෙල්ලම් කරන එක, එම්ටිනස් එකට ප්‍රශ්නයක්ද? ගෙදර 'එම්ටිනස්' එක නම්, ගෙදර හිමියාට ප්‍රශ්නයක් නැත්නම් ගේ කඩාගෙන වැටුණත්, එම්ටිනස් එකට ප්‍රශ්නයක්ද? 'එම්ටිනස්' එකට එහෙම එකක් නෑ. ඒ අඛොප්පා චේතෝ විමුක්තිය' නේද? ඇත්තටම තමන්ගේ හරි ගෙදර කොහේද? 'නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ' කියන්නේ ගෙදරයි. අපි ගෙදර යනවා කියන්නේ, අපි ඔක්කෝම ඇවිල්ලා ඔක්කෝම කුලියට අරගෙන ඉන්නේ. දැන් මේ ශරීරය, ඒ වාගේ කුලියට ගත්තු සිතුවිලි

ටිකක්. බැඳ ගත්ත මහත්තයයි, දරුවෝ ටිකයි, මොකද මේ ආයි මේ මහත්තයා ඉන්නවයි. **කුලියට ගත්ත දරුවෝ ටිකකුයි, කුලියට ගත්ත මහත්තයෙකුයි, කුලියට ගත්ත ගෙදරකුයි, කුලියට ගත්ත වාහනයකුයි, කුලියට ගත්තු මේ සිතිවිලි ටික ඇත්තටම ගෙදර කොහේද? ඔක්කෝම කුලියටනේ අරන් තියෙන්නේ.** ඒත් ඒ නිසා තමයි 'අන්ධ වනය' හරි සුන්දරයි කිව්වේ. 'ප්‍රභාෂ්වරං චිත්තං' නේද? ඒ නිසා තමයි, අර උත්තරීතර හුදකලාව ඈත අනන්තය දක්වා පේන 'අනුත්තර ස්වභාවය' එතන සඳහන් වෙන්නේ.

'එම්ටිනස්' එක රසවිඳින්න දන්නවාද? එම්ටිනස් එකට කැමැත්තක් තියෙනවාද? ඒකට ඡන්දයක් තියෙනවාද? ඇයි නැත්තේ. මේක ඇතුලේ තියෙනවා වෙනස්ම පරියායක්. මේ ධර්මය දැක්කොත් තමයි ඒක පේන්න ගන්නේ. මේ අපි ආයතනවලින් දැකපු විචිත්‍රවත් ලෝකය නොවෙයි. ඒක පුස්සක්. ඒක හරියට කුලියට ගත්ත වාහනයක්. ඒක නොවේ ඇත්ත කතාව. ඇත්ත කතාව තමයි අර ඔක්කෝම 'වර්ණ' හැදෙන්නේ. 'අවර්ණ' අවර්ණ කියන්නේ පාටක්ද? ඒ තමයි ගෙදර, ඇයි ගෙදර යන්න අකමැති? ඔය සිංදු ඇහෙනවානේ ශබ්ද ඇහෙනවා නේ. ඔක්කෝම සද්ද ඒවා හැදෙන්නේ ඒවා නැති තැනකින්නේ. ඇයි ගෙදර යන්න අකමැති. මේ රස ගොඩක් දැනෙනවානේ. මොකුත් රසක් නැති තැනකින් නේද රසක් දැනෙන්නෙ, ඕන දැවිල්ලක් හරි. ඇයි ගෙදර යන්න අකමැති. ඔය සුවඳ ගොඩක් දැනෙනවානේ. ඔය මොන සුවඳ ආවත් ඒකට යටින් තියෙනවා නේ සුවඳක් නැති තැන. සුවඳ නැති තැනින් නේද පටන් ගන්නේ. ඇයි ගෙදර යන්න අකමැති ඔබ රැවටුණේ මොනවාටද? 'ඔබ යනු හදා ගත්ත දේමයි.'

එතකොට ඔබට ඔය ශරීරයට දැනෙන උණුසුම, සීතල ඔය ඔක්කෝම ටික ඔය සේරම ටික නැත්නම් මොකද වෙන්නේ? ඒ ශරීරයට දැනෙන 'සෙන්සස්' ටික සේරම පෙන්නන උණුසුම හරි සීතල හරි තද ගතිය හරි, ඔය අපි කියනවා නේ ඒ අර ශරීරයටනේ. අපි කියනවා නේ හොඳ කතාවක්, එයින් පහසක් තියෙනවාද? ශරීරයට දැනෙන පහස නැති තැන ඇයි අපි ගෙදර යන්නේ නැත්තේ. අපට ලොකු දුකක් ඇවිල්ලා, දරුවොත් නැති වෙලා. මහත්තයාත් නැතිවෙලා ඉන්න තැනක් නැති

වෙලා, ඔක්කෝම කඩාගෙන වැටිලා ගෙවලුත් කඩා වැටිලා සුනාමිය ආවා වාගේ ආවත්, අපි අපේ ගෙදර යනවා. එදාට අපි නිවනට ළඟයි. එහෙම නැද්ද? කුලියට ගත්ත වාහනත් ඔක්කෝම විකුණලා දාල දැම්මා වගේ නේද?

**උපාසිකාව:** එහෙම තමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** දැන් කොහේද යන්නේ ගෙදර නේද? ගෙදර කොහේද තියෙන්නේ. දැන් කවුරුහරි බෙල්ල කපන්න ආවොත් එහෙම "මම ලෑස්තියි ගෙදර යන්න." ඇයි ඒ මේක වැඩක් නෑ, මේක ගෙදර නෙවෙයිනේ. **අපි හිතන් ඉන්නේ කොහේ හරි ගිහින් ආවාම අපේ ගෙදර තමයි මේක කියලා, ගියාම හිතනවා ගෙදර ගියා කියලා. ඇත්තටම ගෙදර එහේද? නෑ. ඇත්ත ගෙදර කොහේද? ඊට පස්සේ මොන ගෙදර හිටියත් ඉන්නේ ගෙදර.ඇයි ඒ එම්ටිනස් එක 'භව නිරෝධෝ නිබ්බානෝ.'** දෙයක් කියල ගත්ත හැම කම්පනයක්ම ඇති තැන දැක්කේ නිවන නෙවෙයි, එහෙනම් හැම තැනම නිවන තිබුන් නැද්ද? හැමතැනම නිවන තියෙනවා. දරුවෝ ඉන්න තැන නිවන නැද්ද? දරුවා කියන්නේ නිවන නේ. මහත්තයා ඉන්න තැන නිවන නැද්ද? ඒ නිවන අම්මේ, අම්මා නිවන් දකිනවා කිව්වේ ඒ නිසයි.

මේ හැම පැත්තෙන්ම කමටහනයක් විදියට කතා කළානේ. දැන් බලන්න. හැම පැත්තෙන්ම කොහේටද මේ ගිහිල්ලා තියෙන්නේ. කම්පනය නොවන 'සෙන්සස්' ටික දැක්කාම කොහේටද ගියේ අන්තිමට මොකක්ද උනේ. අන්තිමට අබොප්පා චේතෝ විමුක්තිය' අන්න විමුක්තිය මොකක්ද විමුක්තිය ඔබ ඔය දකින කියන හැමදේකම විමුක්තිය මොකක්ද? 'විමුක්ති සාරා' කිව්වේ මොකක්ද? ඒ අනුත්තර ස්වභාවය මොකක්ද? මොන කතාවක්ද මේ කියන්නේ ඊට පස්සේ ඔබට විශ්වමය එකයි 'ගැලැක්සියත් එකයි විශ්වයත් එකයි. හිටියත් එකයි ඔක්කෝම එකයි. දැන් ඉතින් ඔබතුමියට කිසිදේක කතාවක් නෑ. අර 'බිග්බෑන්' කියන එකට පෙර අවස්ථාව අන්න ඔබතුමිය අත්දකිනවා. මේක 'බිග්බෑන්' එකට පෙර අවස්ථාවක් කිව්වේ හැබැයි නූතන විද්‍යාඥයෝ මෙහෙම කියන නිසා. බුදුන් වහන්සේ මේක පෙන්නුවා මේ මුළු විශ්වයමනේ නිර්මාණය පටන් ගන්නේ මෙතනින් කියල. මෙන්න මේ මුකුත් නැති ස්වභාවයක්නේ

අන්න ඒ බුද්ධ ස්වභාවය. අන්ත දෙකක් තියෙන තැන ඒකයි කිව්වේ. බුදුන් වහන්සේ 'යො උභෝ අන්තේ විදිත්වාන' ඒ අන්ත 2ක් තියෙනවා නම් මහමෙනි මැද බලයකුත් තියෙනවා. ඒකයි විඤ්ඤාණ ආකර්ෂණ බලය තියෙනවා කියන්නේ. මේක කොහේවත් තියෙන එකක් නෙවෙයි. විඤ්ඤාණ මායාවක් කිව්වේ. මේක සේරම මායාවක්නෙ.

ඔය එළියේ තියෙන කතාවක් නෙවෙයි මේ කතාව. එළිය අපිට අත්දකින්න බෑ. **'සෙන්සස්' ටික ගැලෙව්වාම එළියේ කතාවක් නෑ. දැන් නිවන් දකිනවා කියලා මොකක්ද කරන්න තියෙන්නේ. එළියෙන් මොනවත් නැති කරන එකක් නෙවෙයි, අපේම මේ 'ක්‍රියේෂන්' එක දකින එක**. අපි මේ සිතිවිලි යුද්ධයක ඉන්නේ. මාර යුද්දේ කියන්නේ මමත් එක්ක යන යුද්දේ ආත්ම යුද්දේ. 'අත්තානු දිට්ඨිං ඌහච්ච මච්චුරාජ න එස්සති' එහෙනම් ආත්ම දෘෂ්ටිය දෙයක් තියෙනවා. ඔක්කෝම දේවල් තියෙනවා කියන එකනේ ඒකමයි මම කියන්නේ ප්‍රතිබිම්බයනේ. ඒකනේ දැනෙන එක, ඒක තියෙනවා මේක බිත්තිය මට තියෙනවා මේ බිත්තිය මට පේනවා. දැන් මම ඉන්නේ කොහේද? දේකුත් නෑ. එතෙන්ට නේ යන්න ඕන. මේක ප්‍රායෝගික පැත්ත 'කෘත්‍ය ඥානය' කතා කළේ මේ 'සත්‍ය ඥානයේ අර ටික තමයි මෙතෙන්ට ගේන්නේ. ඒක මේකේ මතුවෙන්න ගන්න එකක්. ඒක ඊට පස්සේ එදිනෙදා කටයුතු කරන කොට වැඩ කරන කොට මේක තුළ මෙතෙන්ට ආපු කෙනාට ආයි මොනදේ කුඩු උනත් හිනාවෙන්න පුළුවන්. ඒ කියන්නේ රෝමය ගිනි ගනිද්දී වීනා වැයුවා කියන්නේ.

ඒ වාගේ මුළු ලෝකේම කුඩුවෙලා ගියත්, මුළු ලෝකයම කුඩු වුණත්, එයා සතුටු වෙනවා, ඒ මොකද එයා ඉන්න තැන නේ. ඔක්කෝම දැක්කානේ ඉන්න එයා විතරයි නේ ඉන්නේ. මොකක්ද එයා ඉන්නේ එයා නැති තැන. එයා ඒ බවට පරිවර්තනය වෙනවා. එයා එතකොට සුළඟ දිහා බලන් ඉන්නවා. ගස් සෙලවෙනවා බලා ඉන්නවා. එයාට ටික ටික ඒක දැනෙන්න ගන්නවා. ඒ මොකුත් දෙයක් වෙලා නෙවෙයි. එයා ඒ විදියට සිටියාට නිවන රස විඳින්නේ. නිවන් සුවේ රස විඳින්නේ, ඔන්න නිවන් සුවේ දැකගන්න. 'නිවන් සුවේ පාට නෑ' පාට පාට කතා නෑ. ඒ නිර්වාණ සුවේ අත්දකින්නේ. 'එයමයි ශාන්ත, එයමයි ප්‍රණීත, 'ඒතං ශාන්තං ඒ තං ප්‍රණීතං යදි දං සබ්බ සංඛාර සමතෝ."

සියලු සංස්කාර ධර්මයෝ සියලු වේගයට සකස් උණු දේ තමයි සංඛාර කියන්නේ ඒක තමයි සංඛාර පච්චයා විඤ්ඤාණ කියන්නේ. ඒකම තමයි සංඛාර කියන්නේ. ඒක හැබැයි අවබෝධයෙන් මේක වෙන්නේ. මේක මේ අත්දෙක තියන් කරන එකක් නොවෙයි. මේක වෙන්නේ අවබෝධයෙන් "සංඛිතේ නිබ්බිදාය" මහණෙනි අවබෝධ කළ යුතු දහමක් තියෙනවා නිවන් දකින්න. එහෙනම් 'පටිච්ච සමුප්පාද' ධර්මය 'පටිච්ච සමුප්පාද ධම්මේසු ධම්මං" ධර්මය කියන්නේ මොකක්ද? පටිච්ච සමුප්පාදය කියන්නේ මොකක්ද දෙයක් නැති බව ඇයි දෙයක් නැති බව කිව්වේ., ධර්මය කියන්නේ දෙයක් නොවන බව, දෙයක් තියෙනවා නම් එතන බෞද්ධයෙක් නොවේ. බෞද්ධ කියන්නේ දෙයක් නැති බව දකී නම් ඒ බෞද්ධයෙක්. භව නිරෝධ දකිනවා කියන්නේ. මේක ප්‍රායෝගික පැත්ත තව ළං කරලා දෙන්න වෙනවා, මේ කතාවේ මෙතන දෙන්නෙක් ඉන්නවද? දෙන්නෙක් නෑ. ඕනම මේ ලෝකේ ජනගහනය කෝටි 800ක් වුනත් මේ ලෝකේ ජනගහනය කෝටි 800ම ඔතෙන්ට නේද වැටෙන්නේ. එතන මොන රූපයද තියෙන්නේ එතන මොන නාමයද තියන්නේ. එහෙනම් ඔබ ඕනම කෙනෙක් නිවන් දැක්කොත් **ආර්යයන් වහන්සේයි ඔබ කියලා දෙන්නෙක් නෑ. එහෙනම් බුද්ධ ස්වභාවයේ දෙන්නෙක් නෑ. ආර්යයන් වහන්සේ මොකක්ද මේ කරන්න හදන්නේ සේරටම ගෙදර එන්න කියලා දෙනවා. යං ගෙදර කියලා. ඒ ගෙදර යන කිසි කෙනෙක් ආයි 'භවකතරේ කතා නෑ' 'භව ඕඝය නිවා ගන්නවා' තමුන් ගෙදර යන්න.** මේක නුවණින් හරි දැක්ක දවසට දකින කොට මේක ප්‍රායෝගිකව තමයි දකින්න ඕන. මෙතන 'කෘත්‍ය ඥානය' මෙන ලොකු දෙයක් තියෙනවා.

මේ ඔක්කෝම තියෙන්නේ 'සත්‍ය ඥානය මත' එතනින්මයි කුඩු වෙන්නේ. මේක ශබ්ද කියලා දේකුත් නෑ. වර්ණ කියලා දේකුත් නෑ. දරුවෝ කියලා දේකුත් නෑ. ගෙවල් කියලා දේකුත් නෑ. මම කියලා කෙනෙකුත් නෑ. මේක දකින කොට තමයි තේරෙන්නේ මේ සේරම කම්පනේ. මේක තවත් හොඳට තේරෙනවා. ශබ්දයක් ඇසුණොත් ලස්සන සිංදුවක් නේ හරි ලස්සනයි නේද? හරි මිහිරියි නේද? බලන්න කෝ සුවඳ, බලන්න කොච්චර රසයිද? දැන් කොච්චර සනීපයිද?

මේ ඔක්කෝම කම්පන නේද? ඕවායේ තියෙනවාද මිහිරි ඕවායේ තියෙනවාද ලස්සන, ඕවායේ තියෙනවාද සුවඳ, ඕවායේ තියෙනවාද

රස, ඕවායේ තියෙනවාද පහස, හිතට මොනවාද දැනෙන්නේ, හිතට මොනවාද දැනුණේ, හිත කියන්නේ මොකක්ද? කම්පනයක් විතරයි, ඔබ එහෙනම් ශබ්දයක් ආවොත් හැරිලා බලන්නේ කම්පනයක් නිසානේ, ලස්සනයි කිව්වේ එකපාරටම කම්පනයක් නේ. ඇයි සුවඳයි කියන්නේ. කම්පනයක් නේ? ඇයි රසයි කියන්නේ කම්පනයක් නේ. ඕවායේ රස සුවඳ, ගඳ, පහස නොවේ තියෙන්නේ කම්පනයක්. ඔබට ඔය කම්පනය දෙන්න පොඩ්ඩක් මාධ්‍යයක් විදියට භාවිත කරනවා ශබ්ද මාධ්‍යය වර්ණ මාධ්‍යය, ඒකත් මෙතනම හැදිලා මෙතනම කම්පනයක් දෙනවා. ඒක තමයි ඔබේ කරන්ට් එක. ඔබ ඕක තමයි, කරන්ට් එක තමා හදාග න්න දඟලන්නේ. හැම තිස්සේම කම්පනය සොයන්නේ, කම්පනය වෙන්න බලන්නේ.

කම්පනය ඔබ ආහාරය කරගෙන, අභිසංකරණ ආහාරයක් තියෙන්නේ. අභිසංකරණය, ඒක තමයි ප්‍රාණය ඒක තමයි ජීවත් වෙනවා කියන්නේ. ඒක තමයි වෙනසක් සොයන්නේ. නැත්නම් දවල් කාපුවා රෑට කන්න පුළුවන්ද? හැමදාම කාපුව කන්න පුළුවන්ද? මොකක්ද ඔය දිවට වෙලා තියෙන්නේ. ඇයි වෙනසක් සොයන්නේ ඇයි කම්පනයක් ඕනේ නේ. එතකොට එකම දේ කෑවොත් කලින් කම්පනය වෙලා තියෙනවා නේ. ඒක ආයි කම්පනය වෙලා වැඩක් නෑ නේ. ඇයි ඒ ඒක නෙවෙයිනේ ජීවත් වෙනවා කියන්නේ. අලුත් කම්පනයක් හොයනවා. මේක මහා පිස්සුවක් නේ.

ඇත්තට මිනිස්සු වැරදි කරනවාද? මම මේ ඔබෙන් අහන්නේ. ඔය මිනිස්සු නේචර් එක හැම තිස්සෙම ඊශාව එක හොයන එකනේ මීට වැඩිය හොඳ එක, මනුස්සයාට සල්ලි නැති වුණොත් හොරකම් කරලා හරි සල්ලි හොයන්නේ කම්පනය කරගන්නනේ දැන් මොකක්ද මේකෙන් වෙන්නේ මනුෂ්‍යයා ගෙදර ඉන්දෙද්දී වෙන මනුෂ්‍යයෙක් සොයාගන යන්නේ කම්පනය කර ගන්න. ඕක නිකන් පිස්සුවක් නේද? ඕක සැපක්ද, 'පළඟැටියා කොච්චර පිච්චුණත්' ගින්දරට පළගැටියා පහනට වහනවා. ආයිත් වහනවා. ඒ වාගේ මනුෂ්‍ය කොච්චර මොනවා කිව්වත් ආයිත් සැප සොයනවා, මැරෙනකම් හොයලා ඊට පස්සේ හුස්ම ටික යනකොට මොකද කියන්නේ. ආ මෙහේ නෑ සැප, දිව්‍ය ලෝකයේ හොයනවා. ඒත්

කම්පනයනේ. ඒත් සිතුවිලිනේ. 'මනෝ සෙන්සර්' එකෙන් දෙන්නේ සිතුවිලි කම්පන නේ. එහෙම දෙයක් තිබ්බත් එකයි නැතත් එකයි සිතුවිල්ල තමයි ටේස් කරන්නේ. දිව්‍ය ලෝකේ තිබ්බත් එකයි නැතත් එකයි. මේක සිතුවිල්ල. සිතුවිල්ල වටිනවනේ. සිතුවිල්ල තියෙනවනේ. කාවද රවට්ට ගන්නේ? කොහෙද ඔය ආත්මය තියෙන්නේ සැඟවිලා. ඔය කම්පනේ තමයි සැඟවිලා, ආත්මය තියෙන්නේ.

දැන් ඔය කම්පනය ඕන්නැත්නම් අන්න ඒ තීරණයට ආවොත් මොකද වෙන්නේ. එදාට අලියා එන කොට දුවන්නේ ඇයි? අලියා එන කොට දුවන්නේ මෙතන මේ කම්පනය නවත්ත ගන්න නේ. මේ කම්පනය වෙනවනේ ඒක තියා ගන්න ඕනනේ, අලියා ආවොත් මේක තියා ගන්න බෑනේ. හැබැයි කම්පනය වෙන්නේ නැත්නම් මොකක්ද තියෙන්නේ තේරුම. දැන් අවුරුදු පහකින් හුස්ම ගියත් එකයි දැන් ගියත් එකයි. දැන් කම්පනය වෙන්නෙත් නැහැ. අවුරුදු 5 කින් කම්පනය වෙන්නෙත් නැහැ. කොයි වෙලාවේ මේ හුස්ම ගියත් එකයි. "නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ' තමයි. දැන් ඔබ තුමියගේ දැන් හුස්ම ගියා කියලා හිතමු. දැන් අවුරුදු 5කින් හුස්ම ගියා කියලා හිතමු. මොකක්ද වෙනස දෙකම එකයි නේ. මේ 'නිර්වාණ' සුවේ කියන එක බලන්න, හරි සුන්දර කතාව. දැන් මේක අපිට මුලින් එන්නේ සිතුවිල්ලක් විදියට නේ, මේක අභ්‍යන්තරයට දැනෙනවා මේක ලුණු වගේ දැනෙන එකක් මේ තණ්හාව කොහොමද තව කෙනෙකුට පෙන්නන්නේ. දැන් පෙන්නන්න වෙන්නේ තව කෙනෙකුට මූණෙන් හරි පොඩි 'ඇක්ෂන්' එකකින්නේ. ඒක පෙන්නන්න ක්‍රමයක් නෑනේ. ලුණු රස පෙන්නන බැරුව වගේ නේද? දැන් තමන්ට මොනවාහරි දැනෙන සංඥාව කම්පනයක් නේ. ස්පාක් එකක්මනේ සංඥාව. 'ස්පාක්' එකේ වේගය තමයි සංඥාව, මේකමයි, විඤ්ඤාණය කියලා කිව්වානේ. මේ සත්‍ය දැක්කාට පස්සේ. මොනවද ඇත්තටම තේරෙන්නේ, මේක සිතුවිලි නෙමේ, අභ්‍යන්තරෙත් එක්ක තමයි මේ කතාව යන්නේ ඊට පස්සේ. දැන් සිතුවිලි හරි එක මට්ටමකට එනවා, සිතුවිලි ඕක එනවා. 'සක්කාය දෘෂ්ටිය' වශයෙන් තියෙන කතාව බිඳ වැටුණාම, අභන්තරේට ඊට පස්සේ හැමතැනම දැනෙන්න ගන්නවා. 'නිබ්බිදන්ති විරාගන්ති නිරෝදන්ති පටිනිස්සග්ගානු පස්සී' ඒක නිකම්ම සිද්ධ වෙනවා. ඊට පස්සෙ මේකේ තියෙන්නේ නුවණම. අර යථා භූත

ඥාණය, යෝනිසෝමනසිකාරය. මේක සකස් වෙන ආකාරය දැකීමමයි මැජික් කරන හැටි දැකීමමයි මැජික්වල මැජික් නැති වෙන්නේ.

දැන් මේ ධර්මය නොදකින තාක් හිතෙන්නේ බාහිර තියෙනවා කියලා. දැන් සමහරුන්ට අපි කිව්වත් හිතෙන්නෙම නෑ ශබ්දය එළියේ තියෙනවා ඒකම කුඩු කරන්න කොච්චර අමාරුද? නෑ නෑ අර ඈතට පේන්නේ. මේ අතට අහුවෙන්නේ තද ගතිය කොහොමද නෑ කියන්නේ. මේක කොහොමද කියලා දෙන්නේ බුදුන් වහන්සේ බලනවානේ මේ දහම කොහොමද කියලා දෙන්නේ මනුෂ්‍යයෙකුට කොහොමද කියලා දෙන්නේ. මේ පේන ඇහෙන දැනෙන මේ කිසිම දෙයක් එහෙම නෙමේ. මේ කතාව වෙනස් කතාවක් කියලා. හැබැයි මේක නුවණටම තමයි අසුවෙන්නේ, මේ යථා භූත වෙන හැටි, මේ සකස් වන හැටි, අපි සම්භූත නෙවා කියන්නේ සකස් වන හැටි දකිනවා. මොනවාද සකස් වෙන්නේ, මොනවාහරි තියෙනවාද දෙයක් මොන මැටීරියල් එකක් හරි තියෙනවාද? මැටීරියල් වර්ල්ඩ් කියනවානේ අද ලෝකේ එහෙම දෙයක් තියෙනවාද? නතිං අර අවුරුදු 7 ද 8 දරුවෙක් නතිං. අම්මා, නතිං. ඒ දරුවා ගොඩක් වීඩියෝ එවලා තිබුණා. දැම්මේ ඒකයි. හැබැයි ඒ දරුවා හැමතැනම කියනවා ඒ කතාව. ඒ දරුවාට ඒක දැනෙනවා. මේ ටික අහගෙන යනකොට ඒ දරුවාට දැනෙනවා මොකුත් නෑ කියලා. ඒ අම්මාගේ කතාවේ තියෙනවා ඒ දරුවා හඬනවා කියලා. ඒ දරුවා හඬන්නේ මේ මොකුත් නෑ කියලා දැනිලා. දරුවට ඇඬෙනවා, ඇඬෙන්නේ මොකද? කවුරුත් ගහලද නෑ, මොකටද දරුවාට ඇඬෙන්නේ එයාට අම්මා එයා නතිං අවුරුදු 7 දරුවාට දැනෙනවා. ඒත් අපිට දැනෙන්නේ නැත්තේ ඇයි? අපිට අභිසංකරණය බලගැන්විලා වැඩියි.

අභ්‍යන්තරේට අපිට දැනෙනවා වැඩියි ඉන්නවා වගේ. අපිට මේ ඉත්ත සංඥාව ඝනට තියෙනවා. අවුරුදු 7 දරුවාට මොකද වුණේ? එයාට ඒවා ඝනට නෑ. එයාට කවුරුත් කියලා නෑ එච්චර. එයාට දිව්‍ය ලෝක කතා, නිර කතා අරවා මේවා කතාන්දර එයා දන්නෙත් නෑ. එයා දන්නේ එකයි ස්පාකින් ස්පීඩ් එකට මැවෙනවා. හැබැයි මේ පේන ඒවා එකක්වත් ඇත්ත නෙවෙයි කියලා හැබැයි දරුවාට දැනුණොත් 'වෙයාරිස්

නතින්' ඒ දරුවා අරන් යන්න ඕන රාහුල කුමාරයා බුදුන් වහන්සේ අරන් ගියා වගේ ජේතවනාරාමයට, එහෙම නැත්නම් මේ කට්ටිය ඔක්කෝම එකතු වෙලා දරුවා විනාස කරනවා. ඒ කියන්නේ දරුවාගේ ඔළුවට දානවා නැහැ තියෙනවා කියලා. දරුවට තදට වැදුණොත්, 'නතිං' කියන ඒකමයි අර බුදුන් වහන්සේ ජේතවනාරාමෙට ගිහිල්ලා 'අම්බලට්ටිකා රාහුලෝවාද සූත්‍රයේ' රාහුල කුමාරයාට කණ්ණාඩියෙන් පෙන්නලා දියකඩිත්තෙන් පෙන්නලා ඕකම තමා ලෝකය කියලා පෙන්නුවා වගේ කිව්වොත් ඕකම ධර්මයම දුන්නොත් දරුවා රහත් වෙනවා. දරුවා ආයි උපදින්නේ හේතු සකස්වෙන්නෑ. දරුවාට අභ්‍යන්තරෙන් පරිවර්තන ඉක්මනට වෙනවා. ඒ නිසා තමයි සාමණේර හිමියෝ මහා තෙරවරුන් එක්ක කැලේට අරින කොට සාමණේර හිමියෝ තමයි ඉස්සරහට යන්නේ බිල්ලට මොන ලෝකයක්ද තියෙන්නේ පොඩි දරුවෙක්ට කොහෙද ලෝකේ තියෙන්නේ.

මේකේ තවත් ආශ්චර්යයක් තියෙනවා මේ දහම අවබෝධ වුණාට පස්සේ අපි හිතමු ඔබතුමියට අවබෝධ උනා කියලා. ඔබතුමිය හෙට ඔෆිස් ගියාම වැඩ කරන්නේ නැත්ද? ඔබතුමියට ඔය ඉලක්කන් ටිකත් ගණන් ටිකත් ඔබතුමිය ලස්සනට කරනවා. ඔබතුමිය හිතනවද ගණන් වරදී කියලා. නෑ එක ගාණක්වත් වරදින්නේ නෑ වෙනදටත් වැඩිය හොඳට තේරෙනවා. ඔබතුමියට වෙනසක් දැනේවි පුදුම විදියට. ඕනම වෙලාවක හොඳට ඕනම දෙයක් කරාවි. ඒ කරන වෙලාවේ ඒ මොහොත විතරයි දැනෙන්නේ. ඔක්කෝම සිතුවිලි සේරම වැඩක් නෑ කියලා හිතෙනවා. මේ කරන එක පුදුම 'ප්‍රසන්ට්' එකක් වෙනවා. ඒ මොහොතටත් දෙයක් නෑ කියලා දැනෙනවා. හැබැයි මේ කරන වැඩ නොකර ඉන්නෙත් නෑ. මොකක්වත් නවත්වන්න හේතුවක් තියෙනවාද? නෑනේ. ඕන නම් කරයි. නැත්නම් අත්ඇරලා දායි. කියන්න බෑ. 'ඝටීකාර' වගේ අන්ධ දෙමාපියොත් බලා ගනී. එහෙම දරුවන්ගේ දේවලුත්, එයාට ඒක බැලන්ස්. එයා දන්නවා මේ එකකවත් දෙයක් නෑ කියලා එයා දන්නවා. හැබැයි දෙයක් නැති නිසාම, ඇඩිල්ලක් නෑ. කම්පාවක් නෑ. වේදනාවක් නෑ. දුකත් නෑ. මේ කතාව හරි අරුම පුදුම කතාවක්.

සූත්‍ර ටිකක් පොඩ්ඩක් අධ්‍යයනය කරලා බලන්න ඕන. හැබැයි මේ ඔක්කෝම හොඳට ගැළපිලා ආවට පස්සේ අභ්‍යන්තර පරිවර්තනය වෙන කොට, **මේකේ එකම එක දෙයක් ඔළුවේ තියා ගන්න වාහනේක තියෙනවා නේ ඉස්සරහා තියෙනවා ස්පීඩර් මීටරයකින් වාහනේ තියෙනව තව මීටර දෙක තුනක් ඉස්සරහ. ඔබ ඔබගේ නිවන්මග ගමනට එක මීටරයක් තියා ගන්න. ඒක තමයි ඔබ මැරෙන්න ලෑස්තියි කියන එක ඕක තමයි මීටරය. ඒක නිසා තමයි දිග කාලයක් කමටහනක් දුන්නේ මේ 'අන්තිම හුස්ම බිංදුවයි' කියලා. දැන් හුස්ම ගියොත් ඔක්කොම ඉවරයි. මේ දහම දැනගත්තාට පස්සේ 'භව කතරක' කතාවකුත් නෑ.** දිව්‍ය ලෝක කතා ඔක්කෝම බොරු වෙනවා. ඒව ඔක්කොම සංඛාරා ඇත්තටම දිව්‍ය ලෝකෙත් අහිමියි. එක නිරයක්වත් සදෙව් ලොවක්වත්, මිනිස් ලොවක්වත්, තිස්චික් ලෝකතලේම ඉවරයි. ඒක කුඩුවෙනවා. මේ දේශනා අහන හැමෝම ඇත්ත කියන්න එපැයි. මේ අරමුණ දකින තැන කුඩුවෙලා ඉවරයි. එයාට යන එන මං නැතිවෙනවා. කොහොමත්, එයාට එකම එක 'චොයිස්' එකයි මාර යුද්දේ විතරයි. මාර යුද්දේ පැරදුණොත් හිතනවද පරදී කියල එයාට වෙන යුද්දෙකුත් නෑ. යුද්දෙට ගිය සෙබළාට ආපස්සට ගමනක් නෑ. පස්සට යන්නේ නෑ. වෙඩි කාල මැරෙනවා, යනවා නම් වෙඩි තියාගෙන ඉස්සරහටම යනවා.

ඒක තමයි මාර්ගය, දැනගත්තාට පස්සේ මේ අභිසංඛාරවලින් වැඩක් නෑ. එහෙනම් 'ස්කන්ධ මාර වේගෙට' හැදෙන ඒවනේ පළක් නෑ. 'ස්කන්ධ මාර' එතැනින් ඉවරයි. එහෙනම් 'ක්ලේශ මාර' සැප දුක් ඒවායින් හැදෙන දේ කිසිම පළක් නෑ. එතකොට 'අභිසංඛාර මාර' මේකේ තියනවාද තව මොනාහරි හොයන්න. ඒකත් ඉවරයි. ඊට පස්සේ 'දේව පුත්ත' මාර මෙතන හොඳ මනුෂ්‍යයෙක් දෙවියන් ඉන්නවාද? ඊට පස්සේ **'මාර මාර' මෙතන මරණයක් තියෙනවාද? ඉපදීමක් තියෙනවාද? මාර ඉවරයි මරණ ඉවරයි. දැන් මොකක්ද වෙලා තියෙන්නේ. 'පංච මාරෝ ජිනෝනාතෝ' කියන තැනට එනවා. දැන් මෙයාට ආපස්සට ගමනක් නෑ. 'පටිසෝතයට ආවට පස්සේ 'නියත සම්බෝධි පරායනයි.'** ඔබතුමියට ආයි පස්සක් නෑ. ආයි දිව්‍ය ලෝකෙ නෑ මුකුත් නෑ. බොරු කතා. ඔබතුමිය ඒකාන්තයෙන්ම ආර්ය භූමිය, 'අරියානන් දස්සාවි' අරියධම්මේසු කෝවිදෝ අරිය ධම්මෝ විනයෝ, ඔබතුමිය පුළුවන් නම් පෘථග්ජන කරන්න. මේ දේශනා

හරියට අහලා හරියට බැහැලා හරියට අවබෝධ වුණොත්, අභ්‍යන්තර පරිවර්තනය දැකලා පුළුවන් නම් පෘථග්ජන කරන්න. ආර්යයන් වහන්ස අභියෝග කරනවා, 'ආර්යයන් වහන්සේ නමක් කිසි දවසක පෘථග්ජන කරන්න බෑ.' ආර්යයන් වහන්සේට ආර්යයන් වහන්සේවත් නෑ. මේක මහා පුදුමාකාර බුද්ධ න්‍යායයක්. බුද්ධ ආඥාවක්. මේ මහා පුදුමාකාර ශූන්‍ය ස්වභාවය තුළ මහා බලගැන්වීමක්. දස දසක් ලෝක ධාතුව කම්පා වෙනවා. ඒකයි කිව්වේ සෝතාපන්න ආර්යයන් වහන්සේ නමක්, මේ සෝතාපන්න ආර්යයන් වහන්සේගේ අවසාන කටයුත්ත වෙනව. මේ ලෝකේ කොහේවත් තියෙන එකක් නොවේ. ආයි ආපස්සක් නෑ.

මේ දේශනා අහන කිසි කෙනෙක්, ශූන්‍යත පටි සංයුක්ත දේශනා අහන මේ නිවන් දොරටුවෙන් ඇතුල් වුණාට පස්සේ ආයි ලෝකයක් හම්බවෙන්නේ නෑ. ඔබ නිර්වාණ දොරටුව විවර කරලා ඉවරයි. ඔබ පටිසන්යුක්ත වෙලා ඉවරයි. පටිසෝතයට ඇවිල්ල ඉවරයි. ඔබට කවදාවත් අනුසෝතය හම්බ වෙන්නේ නෑ. පුළුවන් නම් දාන්නකෝ කර්ම භූමියට ඔබව, කවදාවත් බෑ ඔබව කර්ම භූමියට දාන්න. ඔබ අතින් මොන දේ සිද්ද වුණත්. මොන දේ කරත් ඔබට ඒක දෙයක් නෙමේ. ඇයි ශබ්ද වර්ණවල දේවල් නෑ. ඔබට කර්මයක් කොහේවත්ම පනවන්න බෑ. ඔබ කර්ම භූමියට කවදාවත් දාන්නත් බෑ. මේ "හේතුඵල දහම" කර්ම ඵලය කුඩුකර ලාම දානවා. ඇයි ඔබ එකක්වත් අයිති නෑ. එකක් හරි ඔබ ඔළුවේ තියාගෙන නම් ආර්ය භූමියට එන්නෙත් නෑ. ඔබ එහෙනම් මේ බණ අහන්නෙත් නෑ. ඔබ අහනවා කියන්නේ ඔබගේ නේචර් එකේ අවසාන කටයුත්තට සූදානම්. අපි මේ පැහැදිලි කළේ, සම්පූර්ණයෙන්ම ප්‍රායෝගික පැත්තත් තියෙන්නේ මෙතනමයි. එකම තැනක පෙන්නනව මේක කුඩු කරනවා කියන්නේ, අන්තිමට ගහලා තියෙන්නේ 'නේචර්' එකටමයි. 'නේචර්' එකෙන් ඉල්ලන්නේ පැවැත්ම. ගැහැනු කෙනෙක් ගෙන් 'නේචර්' එක ඉල්ලන්නේ දරුවෝ. ගහකින් බීජයක් හැදිලා මලක් හැදිලා තව ගහක් හැදෙන්නේ නැත්නම් 'නේචර්' එක ඉවරයි. මේක 'නේචර්' එකක් නෙවෙයි මේක 'මෙටීරියල් වර්ල්ඩ් එකක් නෙමේ, මේකේ තියෙන්නේ වෙනස් කතාවක් ආයි ඔබතුමිය පෘථග්ජන කරන්න පුළුවන්ද කියලා අපි අහපු ප්‍රශ්නයට ඔබතුමිය මොකද කියන්නේ.

**උපාසිකාව:** කොහොමත් එහෙම වෙන්නේ නෑ ආර්යයන් වහන්ස. වෙන්නේම නෑ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මේ සද්ධර්ම ශ්‍රවණය අතිගාම්භීරයි නේද?

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** කවදාවත් භාවනා කරලා මේකට එන්න බෑනේ. මේක පටිච්චසමුප්පාද ධර්මය අවබෝධය තුළම නේද? තියෙන්නේ. 'සංඛිත්තේ නිබ්බිදාය' අවබෝධයෙන් නිවන් දකිනවා. 'දුර්ලභං මනුස්සත්තං, දුර්ලභං සත්ධර්මස් ශ්‍රවණං' දුර්ලභං ක්ෂණසම්පත්තිං' දුර්ලභං පතිරූප වාසේච' මේ කොහේවත් නෑ දුර්ලභං භාවනා කියලා. භාවනා පන්ති රැල්ල සුනු විසුනු වෙනවා. 'දිට්ඨිංච අනුපග ම්ම සීලවා - දස්සනේන සම්පන්නෝ කියලා ගහන්න කිව්වේ. යුග ගණනක් දර්ශනය ගිලිහිලා තිබුණු මේ ලෝක ධාතුව තුළ මේක බුරුමය නොවෙයි, මියන්මාරය නොවෙයි. ඕස්ට්‍රේලියාව නෙමෙයි, ඉන්දියාව නෙමෙයි ලංකාව නෙමෙයි කොහේවත් නෑ මේ දර්ශනය. ඔවුන් පස්වග තවුසන්ගේ භාවනා කරන්නේ. ඔවුන් කියන්නේ 'එල්ලයිට්මන්' වෙනව කියල. අපි ඔබට පෙන්නුවා එල්ලයිමන්ට් කෙනෙක් 'බුද්ධ නොවන්නේ' කොහොමද? ඒ කල්ප 80,000 එහා තියෙන 'එල්ලයිමන්ට්' එක ඒ අසංඥ තලේන් එහා යන 'එල්ලයිට්මන්' එක බුද්ධ නෙමේ. ඒක කම්පනය වෙන ලෝකයේ සර්ච් කරලා වෙනම පරියායකින් පැහැදිලි කරන්න පුළුවන්. **බුද්ධ ස්වභාවය කියන්නේ 'එල්ලයිමන්ට්' එකක් නොවේ. මේක 'නතිං' තමයි හරි උත්තරය 'නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ.' දැන් ලෝකෙම ඉවරයි. දැන් ඔබතුමිය ඔබේ ගෙදර යනව නේද?**

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** අන්න අපේ ගෙදර අපි යනවා. කොහෙන්ද නාම, කොහෙන්ද රූප, කොහෙන්ද කෙනෙක්. මේකේ ඔබතුමිය ඉන්නවාද? මේකෙ අපි ඉන්නවාද? බණ කියන්න නාම-රූප ඕනද? ඇයි ඒ 'ඵල නැති කටමයි අපේ ඵලය. කොහේද ඵල, කාටද ඵල තියෙන්නේ. කොහේද කෙනා ඉන්නේ ඵල ලබපු. ඵල ලබපු කෙනෙක් නෑ. එහෙම

කියන්න කෙනෙකුත් නෑ. ඒ නිසා බුදුන් වහන්සේම කියනවා මේ අරහත්ව කාටවත් කියන්න බෑ කියලා. ඒක කියන්නේ නෑ. ආයතනයක කෝ එලය එහෙනම් කටපරිස්සම් කර ගන්න එක හොඳයිනේ. හොඳමයි. හැමෝටම තෙරුවන් සරණයි අපේ ගෙදර අපි, අපේ පාඩුවේ ඉන්නවා.

**උපාසිකාව:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස.

# 03

# මේ සිතේ සත්‍ය නොදන්නා තාක්, දෑස් තිබුණත් ඔබ අන්ධයි

**උපාසකතුමා:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** තෙරුවන් සරණයි.

**උපාසකතුමා:** ආර්යයන් වහන්ස පසුගියදා කළ දේශනාවේ මතු කළ ඉතාමත්ම සියුම් කාරණා ගැන එතනදි ඔබවහන්සේ ප්‍රකාශ කළා අංශු කම්පන ස්වභාවය. එහෙම නැත්නම් නිරූපණය නම් අංශු කම්පන නොවන ස්වභාවය ඒ වගේම එතනදීම ආර්යයන් වහන්ස තව උදාහරණයක් ගෙනාව අර සුදු කොළේක ඇඳපු ඩොට් එක, උඩ පහළ ගියාම මජ්ජේ සූත්‍රය එතනට ගෙනල්ල 'මජ්ජේ' සූත්‍රය මත මෙන්න මේ අංශුවේ කම්පන ස්වභාවය මත තමයි ඇත්තටම අපිට විඳීමක්, දැනීමක් දැනෙන්නෙ කියල ඒ වගේම එතනින් එහාට ගිහිල්ල ප්‍රකාශ කළ දෙය තමයි ඒ අංශු කම්පන ස්වභාවය. සිහිය එතන ජනිත වන බලය ඒ ක්‍රියාවලිය නොදැනීම නිසා ඇතිවන දෙයක් බවත් යම් කෙනෙක් නිවැරදි සම්මා දර්ශනයට පැමිණ මේ සිත හැදෙන ආකාරය අවබෝධ කරගැනීමෙන් පමණක් ඒ දෙස බැලුවහම ඇත්තටම ඒ බලය එතන ජනිත නොවන බව. ඒ මා අවබෝධ කරගත් ආකාරය ආර්යයන් වහන්ස. ආර්යයන් වහන්ස කිවූ ඒ 'ඛජ්ජනීය වග්ගයට' අනුව එදා දේශනා කළ පර්යායේ සඳහන් කළේ ඔන්න ඔය කරුණද? ආර්යයන් වහන්ස එහෙම නැතිනම් එතන අපි පැහැදිලි කරගත යුතු දෙයක් තියෙනවද? ඒ ගැන පැහැදිලි කිරීමක් සියලුදෙනා වෙනුවෙන් කරන මෙන් ඔබ වහන්සේගේ පාද නමස්කාර කර ඉල්ලා සිටිනවා.

**ආර්යයන් වහන්සේ:** මෙතන ප්‍රායෝගික පැත්ත දකින්න ඕන. 'රුප්පන්තිකෝ ආයුසෝ රූපං' කියන තැන. 'රූපං පර්ජානාති' කියන තැන මේ රුප්පනය **රුප්පනය වේගයට මැවෙන රූපය**. ඒක අභිසංස්කරණය මත සකස් වෙන රූපය. එතකොට මේ වේගය මතයි මෙය සකස් වෙන්නෙ. 'ස්ඛංධානානං පාතුභාවෝ' කියන්නේ ස්කන්ධ විග්‍රහය තුළ බුදුන් වහන්සේ පෙන්වන්නේ වේගයක්. මේක ප්‍රසිද්ධ දේශනයක්. මේක අභිඥ්ඥා දේශනාවක්, මේක තේරෙන්නෙ නැතිවෙන්න පුළුවන් කාටහරි මනුෂ්‍යයෙකුට. හැබැයි මේ මාර්ගය තුළ හොඳට අධ්‍යයනය කරල හොඳට විමර්ශනය කරල පරිණත වුණ කෙනෙකුට මේක තේරෙනව මොකද්ද මේ කියන්නෙ කියල. ඇත්තටම මෙතන සත්ව පුද්ගල කතාවක් නැහැ. ආත්ම කතාව කොහොමත්ම නැහැ. මෙතන ආත්මයක් නැහැ. කවුරුහරි ඇහුවත් මේ ඔක්කොම දේශනා අධ්‍යයනය කරන්න පුළුවන්. මෙහි සත්‍යයක් නැති බව හොඳටම දැනෙයි.

බුදුන් වහන්සේ පෙන්වන්නේ 'චක්ඛුං නිච්චංවා අනිච්චං භන්තේ, භික්ෂුව, 'ඉද භික්ඛු' කියන කොට මේ ශාසනයේ භික්ෂුව තෝරන්න එතනින්. ඇස නිත්‍යද මහණෙනි, 'චක්ඛුං නිච්චංවා අනිච්චංවා', ඇස කියන්නේ පේන බව මස් ඇහැ නෙවේ. පේන්නෙ බිත්තිය. බිත්තිය කියන්නේ ශබ්ද වර්ණ, බිත්තිය එහෙම එකක් කොහෙත් නැහැ. එතකොට අපට බිත්තියක් පේනව. බිත්තියක් කොහේවත් අපට හම්බ වෙන්නේ නැහැ. ඒකයි අනිච්චං භන්තේ කියන්නේ. මේ ශාසනයේ භික්ෂුවක් වෙන්නෙ බාහිර ඇත්ත කරගත් කෙනෙක් නෙවේ එයා. අනුසෝතයෙ ඉන්නෙ. මේ ශාසනයේ භික්ෂුවක් වෙන්නේ, 'ඉද භික්ඛු' භික්ඛු වෙන්නේ පටිසෝතෙට ආවොත් විතරයි. එහෙනම් බාහිර ඇත්ත කරගෙන බිත්තිය ඇත්ත කරගත් කෙනෙක් මේ ශාසනේ භික්ෂුවක් නෙවෙයි. හේතුඵල දහම කියන්නෙ ඒක නෙවෙයි. එහෙනම් මේ 'හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ජති' කියන්නෙ මේ කොහේවත් තියෙන එකක් නෙවෙයි. **'සම්භූත වෙනව** කියන්නෙ. **ශබ්ද වර්ණ සකස් වෙන චිත්තයක් වෙන කොහෙවත් හම්බවෙන්නෙ නැහැ.** 'චක්ඛුං නිච්චංවා - අනිච්චං භන්තේ' කියන කොට 'චක්ඛුං නිච්චංවා - අනිච්චං භන්තේ' 'ඇස අනිත්‍යයි.' ඇස කියන්නේ පේන බව. මස් ඇහැ නෙවේ. පේන්නෙ බිත්තියක්. බිත්තිය බාහිර බිත්තියක් හමුවෙන්නෙ නැහැ. බිත්තිය කියන්නෙ අපි ඇසුරු

කරන්නේ චිත්තයක්. 'චිත්තේන නීයති ලෝකෝ. චිත්තේන පරිකප්පති.' මේක සිතේ මැවෙන එකක් මිසක් බාහිර කතාවක් එතන නැහැ. බාහිර අත්දැකීමක් නැහැ. ඔබ ඔය කොච්චර මොනව කීවත් ඔබට කවදාවත් බාහිර අත්දැකීමක් ලැබිල නැහැ.

ඔබේ 'සෙන්සස්' වලින් එහාට ඔබේ විඤ්ඤාණ මායාවෙන් එහාට අත්දැකීමක් ඔබ ලබල නැහැ. එතකොට මේ බිත්තිය හම්බ වෙන්නෙ නැහැ කියන්නේ, භික්ෂුව කියනව නම් මෙතන' අනිච්චං භන්තේ' කියල, 'නිච්චංවා අනිච්චංවා- අනිච්චං භන්තේ' කියන කොට එතන බිත්තිය තියනවාද නැද්ද? නෑ. බිත්තිය තියනව කීවත් වැරදි. නැහැ කීවත් වැරදියි. ඇත නැත අන්තවලින් මිදුණ දහමක්. 'නිච්චංවා අනිච්චං- අනිච්චංවා භන්තේ' ගත්තොත් 'දුක්ඛං භන්තේ' එහෙනම් මහණෙනි, එතන ආත්මයක්ද? 'නො හේතං භන්තේ.' මේ අනාත්ම ධර්මය තුළ දෙයක් තිබ්බොත් විතරයි ආත්මයක් තියෙන්නේ, මේක තමයි දෘෂ්ටිය. **ඇත්තටම අපි විසඳන්නේ එසේ මෙසේ විසඳිල්ලක් නෙවෙයි. මේ මුළු සත්ව සංහතියෙම මූලය විසඳන්නෙ. මේක මනුෂ්‍ය ආත්ම භවයක මනුෂ්‍යයෙකුට විතරයි මේක විසඳන්න පුළුවන්.** සත්තුන්ට විසඳන්න බැහැ. මේ ලොකු සමීකරණයක් මේ විසඳන්නෙ. මේ මනුෂ්‍යයෙක් වත් කෝටි 800ක ජනගහනයෙන් එක මනුෂ්‍යයෙක්වත් බාහිර දැකල නැහැ. බාහිර අත්දැකීමක් නැහැ. තියෙන්නෙ විඤ්ඤාණ අත්දැකීම විතරයි.

කවදාවත් ඔබ බාහිර දැකල නැහැ. කවදාවත් ඔබට බාහිර දකින්නත් බැහැ. කවදාවත් බාහිර අත්දැකලත් නැහැ. කවදාවත් ඔබට බාහිර අත්දකින්නත් බැහැ. මෙතන අපි එන්න ඕන ඇත්තට. සත්‍ය ධර්මයට එන්න ඕන. සත්‍ය දැනගන්න ඕන, සත්‍යය නම් විඤ්ඤාණ මායාවේ අත්දැකීම් සත්‍යයක් නොවේ. මේ ඔබට පේන දේ නැත්නම් කොහොමද රතුපාට පේන් නැති දරුවෝ ඉන්නේ. නැත්නම් කොහොමද කොළපාට පේන්නෙ නැති දරුවෝ ඉන්නේ. එළියෙ කතාවක් නෙවේ. ඔබේම යෂ්ටි සෙල කේතු සෙලවල වෙනස අනුව ඔබට පේන දේ වෙනස් වෙනව. එහෙනම් ඔතන යෂ්ටි සෙල කේතු සෙසලවල මෙතැන 'නාභි' ගතවන කෝණය අනුව පෙනීම සිද්ධ වෙනව. ඒක කොහෙවත් තියෙන එකක් නෙවේ. ඇස් දෙක නැත්නම් පේන් නැහැ. හරියට හරි

ඇස් ගෙඩි නැත්නම් පේන්නැහැ. ඇස් ගුලියට මැවිච්ච එකක් බව ඔප්පු වෙනව. **ඇස් ගුලියට මැවිච්ච එකක් කොහෙවත් නැහැ.** ඇස් ගුලියෙමයි තියෙන්නෙ. මේක ඇත්ත කතාව.

ඔය වර්ණ හත කියන්නෙ දේදුන්නක් නෙ. ඔය දේදුන්න කොහෙවත් තියෙනව නෙවෙයිනෙ. ඔය ඇහේ කෝණයට අනුව බලන විට 'විෂන් කෙයා' වගේ හරියට. දැන් ඔය හමුදාවෙ එහෙම රාත්‍රී කාලයට පාවිච්චි කරනව, රාත්‍රී කාලෙ උෂ්ණත්වය අනුව තරංග 'සිස්ටම්' එකක් 'ඉන්ඩිකේට්' කරල. දැන් අපි ගත්තොත් රතුපාට කියන්නෙ තරංග යාම වැඩියි. සුදුපාට ගත්තොත් තරංගයාම කම්පන 'සිස්ටම්' එකමයි. විද්වත්තු මේක භාවිත කරනවනෙ. කම්පන සිස්ටම් එක පාවිච්චි කරනවනෙ. මේ අංශු කම්පන සිස්ටම් එකනෙ සිරස බලන්නෙ. දෙරණ බලන්නෙ. හිරු බලන්නෙ. මෙතන අංශු ටිකක් කම්පනය කරල සිත සකස් කරගන්න පුළුවන්නෙ. තව කොහෙ හරි තැනක **අහසේ විදුලි කොටනකොට මෙතන අර හෙල්ලෙන විදියට ජනේලෙ සකස් කරල තිබ්බොත් ඩිගි ඩිගි ගාල හෙල්ලෙයි. හැම ජනේලයම හෙල්ලෙන් නෑ. සංඛ්‍යාතය තියෙන විදියට සකස් වෙන්නේ.** මේ වගේ තමා 'සර්කිට්' එක කියන්නෙ. මේ වගේ තමා අපේ 'සෙන්සස්' ටික. මේ 'සෙන්සස්' ටික කාට හරි තියෙනව නම් මේ වගේ 'සෙන්සස්' හෙල්ලෙනව තමයි. ඒ කියන්නෙ ශබ්දය ඔක්කොටම ඇහෙනවා. ඒ කියන්නෙ ශබ්දය එළියෙ තියෙනවද නැහැ. මේකෙ එහෙම එකකුත් නෙවෙයි. මේක අංශු කම්පනයක් විතරයි.

මේකෙ ශබ්ද කියල දේකුත් නැහැ. වර්ණ කියල දේකුත් නැහැ. තරංග ගත්තොත් ඔක්කොම එකමයි අංශු කම්පනය විතරයි. මේකෙ ශබ්ද වර්ණ කියල දේකුත් නැහැ. මේ නිසා තමයි මේ අංශු කම්පන දෙක එකට එකතු කරල ශබ්ද තරංගයයි, වර්ණ තරංගයයි එකතු කරල චිත්ත තරංගයක් හැදෙන්නෙ. මේ සොබාදහමේ නිර්ණායකයෙක්. මේක අමුතු දේකුත් නෙවෙයි. මේක අවබෝධ කළාට පස්සෙ මේක අමුතු දේකුත් නෙවෙයි. මේක අවබෝධ වෙනකම්ම එකපාරට කෙනෙකුට මහ ලොකුවට දැනෙන්න පුළුවන්. හැබැයි හොඳට අධ්‍යයනය කරගෙන යනකොට පුංචි සිද්ධියක් තියෙන්නෙ. මේක හොඳට අධ්‍යයනය කළාට පස්සෙ එයාට ලෝකෙ කුඩුවෙනව. කොහොමත් එයාගෙ අවබෝධය

තුළයි ලෝකෙ කුඩුවෙන්නෙ. සාමාන්‍ය විදියට පේන දැනෙන කතා කරන තැනක ඒක සාමාන්‍යයෙන් සිද්ධ වෙනවා. ඒක වෙනස් වෙන්නැහැ. සම්මුතිය ඒ විදියමයි. නමුත් මේ අවබෝධය නැති කරන්න බැහැ. යම්කිසි කෙනෙකුට යමක් අවබෝධ වෙනව නම් ඒක කාටවත් මකන්න බැහැ. එක එක කෙනාගෙ අවබෝධය.

දැන් මෙතන චිම්පන්සියෙක් ඉන්නව. වඳුරෙක් ඉන්නව. මනුෂ්‍යයෙක් ඉන්නවා. දැන් මේ කණ්ණාඩියක් තියෙනවා, දැන් චිම්පන්සියාගේ අවබෝධය ඇතුළෙ දෙයක් තියෙනව කියලනෙ. වඳුරගෙ අවබෝධයත් ඒකමයි. ඒත් මනුෂ්‍යයාගේ අවබෝධය ඒකද? මනුෂයා බලන්නෙවත් නැහැ. ඇයි ඒ හොඳටම දන්නව මේක ඇතුළෙ මොකුත් නැහැ. ආයෙ මොකුත් අවශ්‍ය නැහැ. චිම්පන්සියා ගිහිල්ලා එහෙට මෙහෙට කරකව කරකව බලනවා. එයාට එතන දෙයක් තියෙනවා. මේක තමයි අවබෝධය කියන්නෙ. ඒ කියන්නෙ මේ අවබෝධය කියන එක ඇවිල්ල ලුණු වගේ දැනෙන දෙයක් මේක. කාටවත් හංගන්න බැහැ, තමන්ට අවබෝධ වුණාට පස්සෙ ඒක තමන්ගෙ අවබෝධය. ඒක එළියට කියන්න බැහැ, ඒක කියා ගන්න බැරිවෙන්න පුළුවන්. දැන් මට තණ්හාවක් තියෙනවා, කොහොමද මම කියන්නෙ. මගෙ තණ්හාව මට කියන්න පුළුවන්ද? මේක පොතේ ලියන්න පුළුවන්ද? තණ්හාව පුළුවන් නම් පොතේ ලියල පෙන්වන්න. මගේ තණ්හාව කාටවත් පොතේ ලියන්න බැහැ. මගෙ තණ්හාව නැහැ කියල ඔප්පු කරන්න පුළුවන් නම් පොතේ ලියන්න. තණ්හාව නැහැ කියල පොතේ ලියන්නත් බැහැ. කොහොමද ඒක කරන්නෙ. මේ ධර්මය අවබෝධ කරන දහමක්.

මේ අපිට දැනෙන හැම එකම ශබ්ද වර්ණ කියල හිතනවද? මේ අපිට දැනෙන මේ හැම එකක්ම පොතේ ලියන්න පුළුවන් වෙන්නේ ශබ්ද වර්ණ විතරයි. මේකෙ මීට වැඩිය කුඩු පට්ටම් කරන්න ඕන එකක් තියෙනවා. මේ කුඩු පට්ටම් කරන්න ඕන කියන්න හේතුවක් තියෙනවා. මේ නාමය කියන්නෙ ශබ්දය කියන එක. මේ කුඩු පට්ටම් කරන්න ඕන කියන වචන කියන්න හේතුවක් තියෙනව. නම් කරන ලද්දේ නාමයයි. නම් කරන ලද්දේ සියල්ල යටයි කියන එක. බුද්ධ වචනය, එතකොට නාමය කොහොමද එන්නෙ. වේදනා සංඥා යමක් **'යං වේදේති - තං**

**සංජානති.**' ඒ වේදනා සංඥා වෙන් කරන්න බැහැ. **වේදනාව තමයි සංඥාව කියන්නෙ. වේදනාවේ නිරූපණයයි සංඥාව. වේදනා නැතුව සංඥාවක් එන්නෙත් නැහැ.** ඒකයි අර 'යං වේදෙති තං සංජානාති' කිව්වේ. 'වේදනා සංඥා චේතනා පස්ස මනසිකාර අයං වුච්චති නාමං වදේති' කිව්වෙ ගැනු ළමයෙක්ගෙ හිත ඇතුළෙ තියෙන කැමැත්ත හිනාවෙන් පේනවා. හිනාව කියන්නෙ සංඥාව. මේක චේතනාවෙන් තමයි කවුරුහරි කෙනෙක් කියන්නෙ ශබ්දෙ. අන්න ඒ නිසා තමයි ශබ්දෙට නාමෙ එන්නෙ. මේකෙ තවත් පැති තියෙනවා. 'යං වේදේති තං සංජානාති' ඒක එනව 'වේදනා සංඥා චේතනා පස්ස මනසිකාර අයං වුච්චති නාමං වදේති' කවුරුහරි කීවොත් ඒ නම් කරන ලද දේ නාමය බවට පත්වෙනව කියන එක.

තව පරියායක් තියෙනවා. මේක කෑල්ලක් අල්ලගන ඔක්කොම මේකෙයි කීවොත් ඒක හරියන්නෙත් නැහැ. මේක අර පුංචි දරුවට තොටිල්ලෙ ඉන්න දරුවට ෆෝන් එක දුන්නම, **තොටිල්ලෙ ඉන්න දරුවට වේදනා සංඥා තිබුණා. ස්කන්ධය තිබුණා එතන. ඒ නිසා තොටිල්ලෙ ඉන්න දරුවා අර 'ෆෝන්' එක ඉම්බා මිරිකුවා ලෙවකෑව. ඒ ඔක්කොම කරල ඒ දරුවට ඒක දැනුණා. ඒ දැනෙන නිසා තමයි ඒ දරුව ආයෙ 'ෆෝන්' එක ගන්න කොට කෑගහන්නෙ. එතන ආරෝපණ බලයක් හැදුණා සාසවීය ගම් එක එතන ආවා. ඒකයි කම්පනය වන වේගෙට ආපු බලය. ඇස කියන ආරෝපණ බලයට 'චක්ඛු විඤ්ඤාණයට' එන බලය. 'සෝත විඤ්ඤාණයට' එන බලය මේව එකතු වෙලා නෑ. දරුව දන්නැහැ 'ෆෝන්' එකක් කියල.** හැබැයි ආලෝක හැඩතලයට එනව බලයක්. ශබ්දයටත් එනවා බලයක්. ඒකත් එක්කම ගඳ, රස, උණුසුම, තද ගතිය ඔක්කොටම 'ස්පාක්' වෙනව. 'ෆයිව් සෙන්සස්' ටික 'ස්පාක්' වෙන වේගෙට ආරෝපණය හැදෙනව කියන්නෙ අර ගම් එක වගේ අර චුම්භක ආරෝපණ වගේ මේකෙ හැදෙනව චිත්තාරෝපණ. ඒක නිසා තමයි 'ෆෝන්' එක ගන්න එනකොට දරුව කෑගහන්නෙ. **'කරන්ට්' එකක් වගේ**. එතන දරුවෙක් පනවන්නත් බැහැ. ඇයි **දරුවෙක් පනවන්න බැරි ආරෝපණ බලයට එහෙම ආවට මෙතන දරුවෙක් පනවන්න දෙයක් තියෙන්නෙ ඕන. දෙයක් හැදෙන තැනයි ජාතියක් හටගන්නෙ. ජාතියක්**

**හටගත්ත තැනයි දරුව හට ගන්නෙ. ආරෝපණ හැදෙනවා. මේක වෙනම කතාවක් ජාතිය හැදෙන එක වෙනම කතාවක්.**

මහණෙනි, 'ඇසේ උපතයි' උපත කියල බුදුන් වහන්සේ කීවෙ ඇයි? **ඇසේ උපතයි උපත කියල කීවෙ ඇසින් බලල ආයතන කෘත්‍යය වෙන්න නම්, ඒ මොහොතෙ දෙයක් කියල දෙයක් වගේ දැනෙන ගතිය එන්න ඕන.** එහෙනම් එතන ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස සියල්ලම එකට එකතු වෙච්ච ඵලයක් එන්න ඕන හේතුඵල දහම තුළ. **'හේතුව' ආයතන 'ඵලය' අන්න දෙයක් හැදෙනවා.** අන්න 'ස්කන්ධානානං පාතුභාවෝ ආයතනානං පටිලාභෝ අයං වුච්චති ජාති' ආයතන හැදෙන්න ඕන. ආයතන හැදුණොත් ජාතිය හැදෙනවා. එතකොට ආයතන කියන්නෙ මොකක්ද? **ආයතන හැදෙනව කියන්නෙ 'තිණ්ණං සංඝති පස්සො'** කියන තැන. 'තිණ්ණං සංඝති පස්සෝ' කියන්නෙ එතන තමයි මේ කතාව විසඳෙන තැන. එතනින් තමා මෙතනට 'ස්කන්ධානනං පාතුභාවෝ' 'ස්පාක්' වෙන වේගයට ශබ්දය වර්ණය, ගන්ධය, රසය, පහස මේක **දිට්ඨ සුත මේකෙ ප්‍රකටයි.** ඒක නිසා තමයි **මේ දෙක එකට එන තැන බිත්තිය, පුටුව, අම්මා, තාත්තා.** අපි බලමු අර ඊට යටින් තව දේවල් තියෙනව. හැබැයි ඒම එකතු වෙනව තව දේවල් නැත්නම්, ඒ ආයතන ටික නැතිනම් අනෙක් ආයතන ටික එකතු වෙනව. **මේක සොබා දහමේ නිර්ණායකයක්** කිසි කෙනෙකුට නවත්වන්න පුළුවන් එකක් නෙවෙයි. ඒකයි **කැලේ ගිහින් දැම්මත් ටාසන් වගේ නරි හූ කියනව වගේ එකතු වෙනව අර කියන හැඬතලවලට, ශබ්දය මොකක්ද කියල ඊට අදාළ නැහැ.**

අපි හිතමු ලංකාවෙ ඉපදුණ දරුව ජපානයේ දෙමවුපියො ළඟ තිච්ච කියල. 'චාං චූං' ගානවා අර හැඬතල එනකොට, 'චාං චූං' කියන්නෙ මොකක්ද කියල අපි දන්නැහැ. හැබැයි ඒ දරුවට පොඩි කාලෙ ඇර හැඬතල ආවම 'චාං චූං' ශබ්දය දාලා තියෙනවා. ඒ දරුව අන්තිමට 'චාං චූං' මොනවහරි එනකොට ඇහැක් හදනවා. එතකොට කොහෙද චාං චූං ඉපදුණේ. 'චාං චූං' කියන්නෙ අම්මා. ඇයි මේ දරුව ඇමරිකාවට දුන්නොත් ඇමරිකාවෙ දෙමවුපියො ළඟ හැදෙන්නෙ 'මදර්' සුදු ජාතික හැඬතල. ඒ දරුව මැරෙනකම්ම අම්ම කවුද කියල

දන්නැත්තනම් **අර හැඩතලය එතකොට මදර් කියල. කිරි දීපු අම්ම, බත් කවපු අම්ම, ඉස්කෝලෙ යවපු අම්ම, දුක් විඳපු අම්ම ඔක්කොම අභිසංස්කරණයත් වෙලා ඉවරයි. එතන තියෙනව උපාදාන බලය, උපාදාන බලය, බිඳ වැටෙන කොට දුක එනව. ඒකෙම අනික් පැත්ත. ප්‍රතිරෝධය එනව ඇලීම, ගැටීම, ධන රින. ආරෝපණ බලය, ස්පර්ෂණ බලය,** දුක කියල දෙයක් නැහැ. කොහෙද දුක තියෙන්නෙ. මොකක්ද දුක කියන්නෙ. ඇලීමයි, ගැටීමයි. දුක කියන්නෙ ධන රින කීවත් එකයි. දුක සැප කීවත් එකයි. අපි 'කරන්ට්' එකක් විතරයි. ඒ කරන්ට් එකට ඕන විදියට අපිට ඕන නම් ශබ්ද ටිකයි, වර්ණ ටිකයි දාල කරන්ට් එක හදතැහැකි. ඒකෙ කොහෙද දෙයක්.

**දැන් මෙතන 'නම්' කරන ලද්දේ නාමයයි කියල ගන්න කොට, දැන් මේක වේදනා සංඥා චේතනා නම් ඒක සිතුවිල්ලක් වෙනව. 'වේදනා සංඥා චේතනා පස්ස මනසිකාර' අර මනසිකාරයකින් තමා ආයි ශබ්දයක් දෙන්න ඕන. ඇයි මේ නාමය මෙහෙම වුණේ. කොහොමද රූපයට කියනව 'චත්තාරෝච මහාභූතානං චතුන්නංච මහා භූතානං උපාදාය රූපං රූපං වදේති' එතකොට නාමය වේදනා, සංඥා, චේතනා, පස්ස, මනසිකාර අයං වුච්චති නාමං වදේති.** හැබැයි මේක පරිස්සම් වෙන්න. මෙතන තියෙන්නෙ 'පටිඝ සම්පස්සයට' අධිවචන සම්පස්සයම' තමයි. ඒ 'පටිඝ සම්පස්සය' තමයි මහා භූත වශයෙන් හඳුන්වන්නෙ. 'ස්පාක්' වන 'සෙන්සස්' ටික, අධිවචන සම්පස්සයක් වෙන්නෙ මෙතන දැනෙන වේදනාවමයි. ඒකයි, වේදනාව එතන පටිඝයයි. අපි හිතමු මේ ස්පාක් වන වේගයට දැනෙන ගතිය තමයි, 'කරන්ට්' එක. ඒක තමයි වේදනා අපි කතා කරන්නෙ නාම - රූප. ඒ දැනෙන නාමයෙන්ම තමයි රූපය ගැන කියන්නෙ. ඒ දැනෙන වේදනාව කියන්නෙ දැනීම, ඒ දැනීම මොකක්ද? ඒ දැනීමෙන් එපැයි කියන්න රූපෙ කියල. ඒ දැනීම වචනයෙන් කීවම ඒකට සියල්ල යටත් කියනව අන්න ඒකයි ශබ්ද වර්ණ එකතුවීමෙන් නාම රූප වුණේ. ඒක එකපාරට පිළිගන්න එපා. ඒක පිළිගන්න කීව නෙවෙයි. මේකෙ පරතෙරට ගිහිල්ල ආර්යයන් වහන්සේ කියන්නෙ මේක තමයි නාම රූප කියන්නෙ.

මේක පොඩි කතාවක් නෙවෙයි මේ කියන්නෙ. මේක ඔප්පු කරන්න පුළුවන් විදියට ආර්යයන් වහන්සේ කියන්නෙ. මේකම තමයි ශබ්ද වර්ණ කියන්නෙ. සාමාන්‍ය බැලූ බැල්මට මේක තේරෙනව. පුතේ මේක බිත්තිය කනට ඇහෙන්නෙ ශබ්දයක්. ඇහැට ආවෙ වර්ණයක්. අපිට මේක බිත්තිය කියල දන්නව. ඕන කෙනෙකුට මේක පේනව. නමුත් මේක නාම රූප කියල පිළිගන් නැහැ. ඒකට හේතුව අපේ දැනුම, ප්‍රායෝගික පැත්ත බිමට දාල ඒක ඕනෙම නැහැ කියල දැනුම පස්සෙ ගිහිල්ල අන්තිමට අරක තමයි ගෙනියන්නෙ. 'වේදනා, සංඥා, චේතනා, පස්ස, මනසිකාර. අයං වුච්චති නාමං වදේති කියල. කන්සෙප්ට් එකක් හදාගෙන 'සිලබස්' එකක් හදාගන, 'සිලබස්' එක කටපාඩම් කර කර ඉන්නව. ප්‍රායෝගිකව අත්දකින දේ ප්‍රායෝගිකව අත් දැකල මේක හඳුනගෙන, ඒකම නේද මේ දැනෙන එක නේද කියල දැනගෙන මේකම නේද මේ ශබ්ද වර්ණ නේද මේ එන්නෙ කියල දැකල මේ ශබ්දෙක වර්ණෙක දෙයක් නැහැ කියල දැකල මේකෙන් මිදෙන්න ඕනකමක් නැහැනෙ.

දැන් මේ අපි කතා කරනව මේ බිත්තිය මේ පුටුව, මේ ඇඳ, මේ මේසෙ, මේ ශබ්ද වර්ණෙ තියෙන්නෙ. මේක කාටවත් නැහැ කියන්න බැහැනෙ. අර පර්යාය, මේක ආවෙ කොහෙන්ද කියල හොඳට විමර්ශනය කරල තීක්ෂණ නුවණින් විදර්ශනා නුවණින් විඳගෙන යන නුවණින් මේක ග්‍රහණය කරගෙන මේ ශබ්දය නාමය වෙනව කියල. නමුත් මේක සූත්‍රවල තියෙනවා නම් කරල තියෙනවා. නම් කරන ලද දේ නාමයයි. නාමයට සියල්ල යටයි. අපි මේක පැහැදිලි කරල තියෙනව. බුදුන් වහන්සේ මේක දේශනා කරනව කියල. නම් කරන ලද්දේ නාමයයි. නාමයට සියල්ල යටයි කියන්නෙ, නම් කරන්න වෙන්නේ ශබ්දෙකින් ශබ්දයට සියල්ල යට වෙනව. එතකොට මේ සිත කියන්නේ ධ්වනියක් වෙනව. තව පැත්තකින් ගත්තොත් ඇයි ශබ්දෙ කියන්නේ මේකෙ තියෙන්නෙ තරංග යක් කම්පනයක් තරංග 'සිස්ටම්' එකක්. මේකෙ තරංග සිස්ටම් එක කියන්නෙ කම්පනය කියන්නෙ ධ්වනියක් කියන්නෙ මොකවත් නෙවේ. බුදුන් වහන්සේ 'මජ්ජේ සූත්‍රයෙ' පෙන්නපු කාරණා. මෙතන තියෙන්නෙ අංශු කම්පනයක්. කම්පනය තමයි ධ්වනිය කියන්නෙ. කම්පනයට තමයි ශබ්දය කියන්නෙ. කම්පනය තමයි වර්ණය කියන්නෙ.

කම්පනයට තමයි අපි මේ 'ස්පාක්' වෙනව කියන්නෙ. ඒ 'සෙන්සස්' වල 'ස්පාක්' වෙන හැමතැනම කම්පනයක් තියෙන්නෙ. ශබ්දයක් ආවත් වර්ණයක් ආවත් ගන්ධයක් ආවත්. රසයක් ආවත් කොහේද? 'ස්පාක්' වුණේ. කම්පනයක් විතරයි ශබ්දයෙන් හරි කම්පනයක් එනව නම් වර්ණයෙන් හරි කම්පනයක් එනව නම් සුවඳින් හරි කම්පනයක් එනව නම් රසයෙන් හරි කම්පනයක් එනව නම් පහසින් හරි කම්පනයක් එනව නම්, ඒ කම්පනය වෙන දේ 'වේදනා සංඥාව.' ඒකයි 'ශබ්ද රූප, වර්ණ රූප, ගන්ධ රූප, රස රූප' 'පොට්ඨබ්බ රූප, ශබ්ද සංඥා, වර්ණ සංඥා, ගන්ධ සංඥා, රස සංඥා, පොට්ඨබ්බ සංඥා. ඔක්කොම එකයි. කම්පනයක් විතරයි. මේ සේරම කම්පන, ශබ්ද වර්ණ ඕලාරික මට්ටමෙන් මිදිල මේ සේරම ඒකීය මට්ටමක් දකින එක තමයි ලෝක සංඥාවෙන් මිදිල අන්න ඔබ අනාගාමී පැත්තට එනව කියන්නේ. ලෝක සංඥා තියෙනකම් අපට උපතක් තියෙනව, මේකෙ සැකැස්මක් තියෙනව මේකෙ පර්යායක් තියෙනව. අපි ගත්තොත් අපිට 'සිරස' කොහෙ හරි විකාශනය කරොත් තමයි තව තැනක 'සිරස' අහුවෙන්නෙ. 'දෙරණ' කොහෙ හරි විකාශනය කරොත් තමයි තව තැනක 'දෙරණ' අහුවෙන්නෙ. **ශබ්ද වර්ණ ලෝකයක් කොහෙ හරි විකාශනය කරොත් ඔබට කොහෙ හරි ශබ්ද වර්ණ ලෝකයක් අහුවෙයි. ඒ ස්වභාවය අනුව 'ඒආකාර ඒලිංග ඒනිමිති ඒඋද්දේශ' වගේ තමයි, ගති නිමිති, කම්ම නිමිති.**

ඔබ දෙයක් තියෙනව කියල ගත්තොත්, ඔබට උපතක් තියෙනව කර්ම භූමිය තියෙනවා බෞද්ධයෙක් නෙවේ මිථ්‍යාදෘෂ්ටික භූමිය. අසෘතවත් පෘථග්ජන මිථ්‍යාදෘෂ්ටික උන්මත්තක භූමියෙ 'සසර ඕඝයට' අසුවුණ භූමිය, මේක හඳුනා ගන්න බැරිනම් ඒකෙ තමා ඉන්න වෙන්නෙ. 'ඒකෙන් මිදෙන්න බෑ. ඒකෙන් මිදෙන්න නම් හේතුඵල දහමට එන්නම ඕන, හේතුඵල දහමට එන තෙක් සසර ඕඝයෙන් මිදෙන්න බැහැ. මේක ඇතුළෙ තවත් තියෙනව කියන්න. දැන් ඔය මහත්මයා කියපු කතාව එදා දේශනාවේ කිව්වා මෙතන තිතක් තියෙනවා. තිත එහෙට මෙහෙට කරොත් එතන 'මජ්ජේ සූත්‍රයෙ' තියෙනවා කියල. ඔව්. 'යො උභන්තේ විදත්වාන - මජ්ජේ මන්තා නලිප්පති' 'තං බ්‍රෑහි මහා පුරිසෝ - සේද සිබ්බනි මජ්ඣගා' අන්ත දෙකක් තිබ්බොත් මහණෙනි කොන් දෙකක් තිබ්බොත් 'යෝ උභන්තෝ විදිත්වාන අන්ත දෙකක් තිබ්බොත් 'යෝ

උහන්තේ විදිත්වාන අන්ත දෙක නැති වුණොත් මජ්ජේ මන්තා නලිප්පති' එහෙම වුණොත් මැදක් නැහැ. අන්ත දෙකක් නැති වුණොත් කියන්නෙ. අන්ත දෙකක් නැහැ කියන්නෙ අර තිත, අන්ත දෙකක් තිබ්බොත් මේ තිත එහාට මෙහාට වෙන්න ඕන, හැබැයි අන්ත දෙකක් නැති වුණොත් මැඳක් නැති වෙනව.

යෝ උහන්තේ විදිත්වාන - මජ්ජේ මන්තාන ලිප්පති තං බ්‍රෑහි මහා පුරිසෝ සේද සිබ්බනි මජ්ඣගා. තනිකරම නිවන් දොරටුවෙ යතුර ඔය තියෙන්නෙ. කරකවන්න තියෙන්නෙ. එතන හම්බුනෙ නෑනෙ. යතුර දැක්කෙ නැහැනෙ දොර, දැක්කෙ නැහැනෙ දොරේ යතුර දාන තව්ව. 'යෝ උහන්තේ විදිත්වාන මජ්ජේ මන්තා න ලිප්පති තං බ්‍රෑහි මහා පුරිසො' ඔන්න මහා පුරුෂයා සේද සිබ්බනි මජ්ඣගා' මැද ඇලෙන්නේ නැහැ. කොන් දෙකක් නැත්නම් මැද ඇලෙන්න තැනක් නැහැ. අන්න එහෙම වුණොත් ඔහු දැක්කොත් ඒක මහා පුරුෂයෙක්. මේ මුළු කතාවම තියෙන්නෙ ඔතන. ඔතන තමයි යතුර තියෙන්නෙ. ඔතන තමයි හරියටම බලල දාන්න පුළුවන් නිවන් දොරටුව ඇරෙන තැන. මේ කතාවේ මේ අභිඤ්ඤා දේශනයේ තියෙන්නෙ ටිකක් ගැඹුරු කතාවක්. මෙතන මේ තිත එහාට මෙහාට කරන එක ඇත්තටම 'කොන්ටම් න්‍යාය' කියල අපේ විද්‍යාඥයො කතා කරනවා. ඇත්තටම කතා කරන්න දෙයක් නැහැ. මේක තමයි 'තරංග න්‍යාය' 'කොන්ටම් න්‍යාය' මේක එක විද්‍යාඥයෙක්ගෙ 'ඩයරි' එකේ ලියල තියෙනවා. එයා මොකුත් ඔප්පු කරල නැහැ. ආසියාවේ බුද්ධ න්‍යාය මේක තියෙන්නෙ කියල කියනව විතරයි.

මේක තමයි මුළු ධර්මස්කන්ධයම මජ්ජේ සූත්‍රයේ, මේකෙ තමයි මේ තිත ගැන කතා කරන්නෙ. මේක දකින එක ලේසි නෑ, ආර්යයන් වහන්සේ 'මජ්ජේ සූත්‍රයේ' දැක්කෙ මේ ආකාරයට තමයි. මේ මැද තියෙන අංශුව එහාට කෙරුණොත් එතනයි මෙතනයි බලාන්තරයක් වෙනව. ඔබ බලන්න ඉලාස්ටික් එක ඇද්දොත් එතනයි මෙතනයි ආතතියක් තියෙනව නේද කියල. මේක මෙතනත් තියෙනව. මේ අංශුව එහාට මෙහාට කරපු ගමන් ඒකෙ බලයක් වෙනවා මැද්දෙ 'යෝ උහන්තේ විදිත්වාන' මේ අන්ත දෙක නැත්නම් 'මජ්ජේමන්තා නලිප්පති' මැදක් නැහැ ඇලෙන්න. මේ මැද ඇලෙනව. 'නලිප්පති' කීවෙ ඇයි ඇලෙන කතාවක් කියන්නෙ

මෙතන. මේ අන්ත දෙකක් තිබ්බොත් තමයි මැදක් තියෙන්නෙ. මේ විඤ්ඤාණය ගැනයි කියන්නෙ. බුදුන් වහන්සේ කියන්නේ විඤ්ඤාණය ගැන. විඤ්ඤාණය හටගන්න ආකාරය මේ කියන්නෙ 'අජ්ජත්‍ථා බහිද්ධා' කියල අන්ත දෙක තිබ්බොත් තමයි එතන දෙයක්, දෙයක් තිබ්බොත් තමයි 'අජ්ජත්‍ථ බහිද්දා' දෙයක් නැත්නම් 'අජ්ජත්‍ථා බහිද්දා' කියල දෙයක් නැහැ. එතන දෙයක් කියල දැනෙන්නෙ, අර මෙතන තියෙන්නේ මෙන්න මේ කතාව දැන් මේ ඔක්කොම කම්පන වේගයකටයි සකස් වෙන්නෙ. අභිධර්මයේ බිත්තිය දකින කොට චිත්තක්ෂණ කෝටි ගාණක් පහළ වෙලා අර එක අංශුවක් දකින්නෙ චිත්ත වීථියෙ. ඒකට හේතුව තමයි මේ වේගය පෙන්වන්නෙ ඇතිවන නැතිවන.

'උප්පාද වය ධම්මිනො,' කියන්නෙ ඇතිවන නැතිවන ප්‍රවාහයක් 'උප්පජ්ජිත්වා නිරුජ්ජන්ති' 'උප්පාද වයධම්මිනො' ඇතිව නැතිවන ප්‍රවාහයක් වේගය, 'ස්පාක්' වන වේගෙ. ඒ 'ස්පාක්' වෙන වේගයට තත්පරයට කෝටි වාරයක් කියන කොට වේගෙට 'ස්පාක්' වෙන කොට මොකද වෙන්නෙ. ඒ වේගෙ නිසා. මේක හොඳට බලන්න පුළුවන් ඒක ප්‍රායෝගිකව දකින්නත් පුළුවන්. **ඒ 'ස්පාක්' වෙන වේගය නිසා උපදින බලය, ඒ ස්පාක් වෙන වේගය නිසා උපදින ආරෝපණ බලය, මෙන්න මේ ආරෝපණ බලය තමා විඤ්ඤාණ බලය. මේක තමයි විඤ්ඤාණ බලය අතනයි මෙතනයි අන්ත දෙක මැද තියෙන බලය එතන විඤ්ඤාණය කියන්නේ දෙයක් වගේ දැනෙනව කියල.** ඒක අර කැරකෙන වේගෙට ප්‍රායෝගික පැත්තට ආවොත් කැරකෙන අර බුදුන් වහන්සේ කියන උපමාව ගිනිබෝලෙ, ගිනි බෝලෙ කැරකෙන වේගයට සංඛාරා උපමා කරනව. ගිනි වළල්ලක් මැවෙනවා කියනවා. ඒ ගිනි වළල්ල තමා විඤ්ඤාණය කියන්නෙ. එතන බුදුන් වහන්සේ සංඛාරා උපමා කරන්නෙ, ගිනිබෝලයක් කරකවන වේගයට ගිනි වළල්ලක් මැවෙනව. අන්න ඒ වළල්ල තමයි විඤ්ඤාණය. මායාව වළල්ල මැවෙන එක. 'මායූපමංච විඤ්ඤාණං' දැන් මෙතන අපිට වළල්ලක් හමුවුණේ නැහැනෙ. දැන් මෙතන අන්ත දෙකක්. කම්පන වේගයට දැන් මේක දිගටම කම්පනය වෙනකොට මෙතන එන ආරෝපණය, බුදුන් වහන්සේ දෙන උපමාව ගත්තම ගිනිබෝලෙ කැරකෙන වේගටෙ වළල්ල පේන එක. එතැනින්ම නේද බලයක් හැදිල තියෙන්නේ වළල්ලක් වගේ මැවෙන එකක්. මේ

ඔක්කෝම උපමා තේරුම් ගන්න ඕන. බඹරයක් කැරකෙන කොට අපි හිතමු බඹරයට බලයක් ඇවිල්ලා බඹරෙ බලගැන්විලා කියල, අන්න ඒ 'සිස්ටම්' එකමයි මෙතන තියෙන්නෙ. බඹරෙ කැරකෙන කොට බඹරෙට බලයක් ඇවිල්ලා බඹරෙ විසින්ම බලය අරගෙන ඊට පස්සේ කැරකෙනව.

ඒ බලය කොහෙන්ද ආවෙ? අපි ගතතොත් එහෙම මේ බලයක් ස්ඵටියක් ඝනයක් පෘථිවියක් හැදෙන්නේ කැරකෙන වේගයට පැයට කි.මී. 187ක වේගයෙන් පරිභ්‍රමණයට අමතරව කැරකෙනවා පෘථිවිය, ඒ කැරකෙන වේගයට උත්තර ධ්‍රැවය දක්ෂිණ ධ්‍රැවය හැදිල මෙතන ගුරුත්වාකර්ෂණ බලයක් හැදෙනවා. එතනදි 'ඕසෝන්' ස්ථරය හැදිල ගලක් උඩ දැම්මත් බිම වැටෙනව. චුම්බකය වගේ හැදෙනව. මේ ඔක්කොම කම්පන වේගයට තමයි මේ ආරෝපණ බලයක් හැදෙන්නෙ. විද්‍යුත් ආරෝපණ බලය වුණත් එහෙම තමා, වික්ටෝරියා ඩ්‍රෑම් එක චුම්බකයක් කරකවන වේගයෙන් ඒකෙ 'ධන-රින' කියල වයර් දිගේ එන්නේ, ඒකෙන් තමයි ගෙදර ලයිට් හදනව විදුලිය හදනව, වතුර හදනව. ඕනම දෙයක් හදන්න පුළුවන්. ෆෑන් හදනව, හුළං හදනව. ගින්දර හදනව. මොනව හින්දද මේ හදන්නෙ. ධන රින 'ෂෝට්' එකකින් හදන්නෙ මේ ඔක්කොම මොනවද හදන්නෙ. AC හදනව, හීතල හදනව, ගින්දර හදනව, රශ්නෙ හදනව, ආලෝකය හදනව. මේ ධනයි රිනයි 'ෂෝට්' එකකින් කොච්චර දේවල් හදනවද? මේ ඔක්කොම කතා තියෙන්නෙ ඔතනයි. මේ ඔක්කොම තියෙන්නෙ 'ෂෝට්' එකක් කම්පන වේගයක් 'ස්පාක්' එකක් කම්පන වේගෙට මෙතන මේ මැවෙන බලය. ඒ දිග කතාවක් මේ කියන්න යන්නෙ.

ඒ අංශුවෙ එතනයි මෙතනයි මේ අංශුවෙ මැද තියෙන බලය, මෙන්න මේ බලය විඤ්ඤාණය, විඤ්ඤාණය කීවට, මේක මේ විඤ්ඤාණ ශක්තියක් බලයක් එහෙම මොකක්වත් නොවේ. මේ ඔක්කොම අපි වචන භාවිත කරනව මේක තේරුම් ගන්න සන්නිවේදනය සඳහා එච්චරයි. එකම එක වචනයක්වත් එල්ලිල ඉන්න එපා. එක වචනයක්වත් ඇත්ත නෙවේ. මෙතන මොකද වෙන්නෙ කියන එක. **එළියෙ දෙයක් තියෙනව කියල ගත්තොත් මෙතන මම ඉන්නව. දෙයක් තිබ්බොත් අනිවාර්යෙන් එතනයි මෙතනයි හැදෙනවා. අන්ත දෙක නවත්තන්න බැහැ. දෙයක්**

**තිබ්බොත් කොහෙද තියෙන්නෙ. අතන. එතකොට මෙතන මම, 'මම හැදෙන හැටි.' මේ ආරෝපණ බලය හැදෙන හැටි. හැබැයි දෙයක් නැත්නම් මොකද වෙන්නෙ. එතනත් නැහැ. මෙතනත් නැහැ. එහෙනම් මමත් නැහැ. ඒක නැති වුණොත් මාත් නැති වෙනවා.** ඒකයි ඔය 'තියරි' එක තමයි ඕකෙ තියෙන්නෙ. 'යෝ උභන්තේ විදිත්වාන' කියන්නෙ, ඒක නැතුව මේකත් නැහැ. දැන් මමත් නැහැ. එහෙනම් ආත්මෙත් නැහැ. 'චක්ඛුං නිච්චං වා අනිච්චං වා'කියන්නෙ ඒකම තමා. ඒ දකින දෙය දෙයක්ද? නැහැ. එහෙමනම් ආත්මයක්ද? නැහැ ඒකම තමා තියෙන්නෙ.

මෙතන තියෙනවා රහසක්. ඒ රහස තමා කම්පන බලයට දෙයක් තියෙනවා කියල, නැවත නැවත එක අභිසංස්කරණ බලය. ඕක හැදෙන්නෙත් ඔය කම්පන වේගයක් නිසයි. ඒ වේගය තමයි 'ස්කන්ධනානං පාතිභාවෝ' කීවෙ. ඒ වේගෙ තියෙනවා බලයක්, ඒ අභිසංස්කරණ බලය. ඒ අභිසංස්කරණ වේගයට එන බලය මොකක්ද? 'නන්දිය' ඔන්න ඔකේ තියෙන්නෙ රහස අවිද්‍යාව. අවිද්‍යාව තමා වේගෙට එන බලය, දෙයක් කියල දැනෙන එක අපට නොතේරී. හැබැයි ඒක දෙයක් වගේ වැනෙන එක විතරයි අපට කියෙන්නෙ. ප්‍රායෝගික පැත්ත දෙයක් වගේ දැනෙන්න ගන්නවා. ඒකම තමයි ඕකෙ තියෙන්නෙ 'නන්දිය බලය'. 'අජ්ජෝසාය තිට්ඨති - යා රූපේ නන්දි තදුපාදානං භවෝ' දෙයක් වගේ දැනෙන මේ ඔක්කොම එකට එකම මොහොතෙ 'භවය' වෙලා ඉවරයි. කියන කොට ඕක ඕන නම් ඔය විදියට විග්‍රහ කරන්න පුළුවන් පර්යාය පෙන්නන්න, නමුත් ඒක අත්දකින්න බැහැ. අත්දකින කොට ඒක කෙළින්ම දෙයක් වෙලා තියෙයි. 'මේක නන්දිය' මේක උපාදානය' මේක භවය' එහෙම වෙන් කරන්න බැහැ ප්‍රායෝගිකව. ප්‍රායෝගිකව, මේ ඔක්කොම ඒ මොහොතෙම ක්ෂණයෙම දෙයක් වෙලා ඉවරයි. 'පටිච්ච සමුප්පාදය' මේ වෙලාවෙ දෙයක් තියෙනවා කියන කොට වෙලා ඉවරයි. දෙයක් තියෙනවා කියන්නෙ පටිච්ච සමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම ඔක්කොම හරි, සිද්ධ වෙලා ඉවරයි. ඒක දකින එක තමයි මේකෙ තියෙන්නෙ.

මෙන්න මේ බලය තියෙනකම් මේ බලය තමයි ඔබ නොහිතුවට ඔබ දන්නවා සිරස හරි දෙරණ හරි ඒකට කියනවා තරංගෙම අංශු කම්පනයක්. ඔබ දන්නවා ඒක තමයි ඔය 'සර්කිට්' එකෙන් අල්ලලා අපි

ඔය පුළුල් තිරයට ගන්නෙ මෙතනින් තමයි. මෙතනත් ඒ 'ෆ්‍රීකොන්ස්' එකම තියෙනවා. ඔය අංශු දෙක කම්පන වෙන තැන මෙතන මොකක්ද තියෙන්නෙ. ඒකම තමා අතනත් තියෙන්නෙත් ඒකමයි. ඔය අංශු කම්පන අතර තියෙන්නෙ. ඒ කම්පන අතර තියෙන බලය තමයි හැමතැනම ඔක්කොම උස්සල වැඩ දාන්නෙ ඒකෙන්. ඒකමයි මේකෙ කම්පන වන බලයට මෙතන මේ අංශු කම්පනය වන වේගය නිසා මෙතන ඇතිවන ආරෝපණ බලය ආරෝපණ බලයට ඊට පස්සෙ මේක දිගටම කන්ටිනිව් වෙනවා. දැන් මුලින් මේකෙ ස්පාර්ක් වන වේගයට ඔන්න ඔතන හැදෙනව ආරෝපණය. එතනම 'සිස්ටම්' එකෙන්මයි හැදෙන්නෙ. 'සිස්ටම්' එකෙන්ම හැදිල නවතින් නැහැ. ඒක දිගටම ගලනනව ගඟ ගලනව වගේ. ඊට පස්සෙ මේකෙන් ඇවිල්ලා එතැනින් නවතින්නෙත් නැහැ. සද්දයක් හරි ඇහෙන කොට මේකෙන් එහෙම වෙනව. ඒකත් එහෙම වෙනව. දෙක එකට එකතු වෙනව. ඒකෙන් නවතින්නෙත් නැහැ. ඊට පස්සෙ ආයි බලන කොට මෙයා දෙයක් වෙලා ආත්මෙකුත් වෙලා. ඊට පස්සෙ ආශාව, තණ්හාව, ඊර්ෂ්‍යාව, වෛරය ඔක්කොම ඇවිල්ල තියෙන්නෙ. ඔතනින්මයි. 'මූලයට' ගියාම එන්නෙ ඔතනටමයි ආයි ගලාගෙන යන්න. දැන් මෙතන මේ එන ආරෝපණ බලය, මේ ආරෝපණ බලය ඇයි අර විදිහට ශබ්දයක් ගත්තත්, වර්ණයක් ගත්තත් ගඳක් ගත්තත් ඔක්කොම ටික තියෙන්නේ මේ 'සිස්ටම්' එකෙන්මයි. මේ සිස්ටම් එකම දිගටම දුවනවා ගලනවා. ඊට පස්සේ ඉත්ථභාවයක් හැදෙනවා අන්‍යාකාරයකට. ඊට පස්සෙ ආත්ම භාවය ඊට පස්සෙ ආශාව, තණ්හාව ඔක්කොම ඔය විදියටමයි ගලන්නේ. මේ බලයම තමයි මේක මේක කුඩු කරගෙන ගියාම තියෙන්නෙ.

දැන් මේකෙ තව රහසක් තියෙනව. ඉතාම ගැඹුරු පර්යායක් මේකෙ පෙන්වන්නෙ. මේ කියන තැන මේ බලය මෙතන තියෙන්නෙ, මේක තියෙනකම් දිගටම මේක නවතින් නැහැ. ඒ කියන්නෙ ඔය බලය තියෙනකම් ඔබේ සසර ඕඝය නවතින් නැහැ. ඒක සිද්ධ වෙන්නෙ මෙහෙමයි. දැන් මෙතන 'ක්‍රියේට්' වෙන කොට අහසේ විදුලි කොටන කොට මේ ජනෙල් හෙල්ලනවා වගේ තව තැනක මෙතන මේ 'සිස්ටම්' එකෙන් මෙතන මේ 'සර්කිට්' එක හැදිල මෙතන මේ ෆ්‍රීකොන්ස් එක අහුවෙනවා කියන්නෙම, කොහෙ හරි තිබිල මේක අහුවෙනව හෙඳට

බලන්න. මේකයි ඇසේ 'උපතයි' උපත මහණෙනි කියන්න හේතුව මේ 'සෙන්සස්' සිස්ටම් එකෙන් මේක 'ක්‍රියේට්' වෙන කොට ඒක 'ක්‍රියේට්' වෙනවා. **ඔබේ ෆ්‍රීකොන්ස් එක සුසර වෙනකොට ටියුන් එක ඔබ අල්ලලා බලන්න, ඒක තමයි නාලිකාව. ඔබේ 'භව ඕඝය' තියෙනව ඔතන. ඔබට ජේන්නැහැ, ටී.වී. එක දාල වගේ තමයි ඔබ අල්ලන්නෙ. 'සිරස' ද 'දෙරණ' ද 'හිරු' ද සිස්ටම් එක වැඩ ඔබට අහුවෙනවා.** කවුරුහරි කියයි; මේ කැලේ කපල දාන්න ඕන කියල. එයාට අහුවෙන්නෙ වෙන එකක්, එයාට අහුවෙන්නෙ කැලේ කපල දාන එක ටියුන් එකක්. මෙයාට අහුවෙන්නෙ වනපෙත හරි සුන්දරයි. තව එක්කෙනෙකුට නෑ නෑ මේ තව දෙයක් කරන්න ඕන මේ 'වනේ' හරියන් නැහැ. මේක ඉවරයක් කරන්න ඕන. මොකද්ද ඔය වෙලා තියෙන්නෙ, එක එක්කෙනාට 'ෆ්‍රීකොන්ස්' වෙනස්. මේ ගැන තව කතා කරන්න ගියොත් ඉතාම දියුණු වෙනස් පරිසරයක් යනව. මේකෙ බුදුන් වහන්සේ නිවන් දකින හැටි කියපු හැටි පෙන්නමු.

බුදුන් වහන්සේ මෙතනින් ගලවන හැටි මේකෙ පෙන්නුව. මෙතනින් කොහොමද ගලවන්නෙ, ඔබ නොහිතන දෙයක් තියෙනව මෙතන. මේක ඔබට තාම තේරෙන්නෙ නැහැ. අපි දන්නව මේ කිසි කෙනෙක් දන්නැති දෙයක් මේ කියන්නෙ. ආර්යයන් වහන්සේ කලින් කියලත් නැහැ. ඒක තමයි මේකෙන්ම හට ගන්න බලය, මේ බලය ඒකෙන්ම තමයි හටගන තියෙන්නෙ. වෙන මොකක්වත් නෙවේ. කවුරුත් කරලත් නෙවේ, මෙතනම මේ 'සිස්ටම්' එක මෙතනම මේ කම්පන වේගයට සකස් වෙන එකක්. හැබැයි මේක මොකද්ද සකස් වෙලා තියෙන්නෙ බලය, ඒ බලය ඔබ ළඟ තියෙන රාග, ද්වේෂ, මෝහ ඔය කියන තණ්හාව ඔබ ඔය කතා කරන බුදුන් වහන්සේ පෙන්නපු 'කන්සෙප්ට්' එක. 'තණ්හාව නමැති වඩුව තා මා දිටිමි. නැවත නිවසක් සෑදීමට ඉඩ නොදෙමි.' ඔන්න ඔතනයි තියෙන්නෙ 'නන්දිය.' ඒ කියන්නෙ මෙතන තවත් පැත්තක් තියෙනව 'නන්දිය' කීවට 'තණ්හාව' කීවට, ඔබේ මේ සිතිවිලවල දෙයක් තියෙනව වගේ දැනෙන එකක් තියෙනවා. ඕකම තමා ඕකේ තියෙන්නෙ. දෙයක් වගේ දැනෙන ගතිය, ඒකම තමා 'නන්දිය' කියන්නෙ. ඒකම තමා 'තණ්හාව.'

තණ්හාව කියල පොතේ ලියන්නෙ එහෙනම් නන්දිය කොහොමද පොතේ ලියන්නෙ. 'නන්දිය' තණ්හාව වෙනස්ද? ඔක්කොම එකයි. ඔබට

මෙතන දෙයක් තියෙනව. ඔබට දරුවෙක් ඉන්නව. ඔබට වාහනයක් තියෙනව. ඔබට ගෙයක් තියෙනව. ඔබට මොනවද නැත්තෙ. ඔබ නෑ කියල හිතුවත්, තියාගෙනයි හිතන්නේ. ඔබට දැනෙන්නෙම තියෙනවා කියලා තියාගෙන නෑ කියනව වගේ, නෑ කියන්නෙම තියාගෙන. ඒකට හේතුව මේ අවබෝධය මේ විදියට කුඩු කරන්න පුළුවන් නම් ඉතාම වටිනව. මේක නම් කරන්න බැහැ ලේසියෙන්.

ඔබට මේක පහසු ඒව ටිකක් පෙන්නන්න පුළුවන්. ඔබට අල්ලන්න පුළුවන්. ටිකක් තියෙනව. අල්ලන්න බැරි නම් අල්ලන්න බෑ. ඒක ලේසි නැහැ. නමුත් මේක අල්ලල දුන්නොත් සාමාන්‍ය කෙනෙකුට තේරුම් ගන්න පුළුවන්කමක් තියෙනව. මේ කතාව මේ 'සිස්ටම්' එකේ තියෙන්නෙ, නුවණට හසුවෙනවා. පර්යායම මෙතන තියෙනව. මේක දැක්කට පස්සෙ ආයි මොකක්වත් ඉතුරු වෙන්නෙත් නැහැ, එතන දෙයක් වගේ දැනෙනව කියන එක. දෙයක් තියෙනව කියන එක, දෙයක් වගේ දැනෙනව කියන එක තමයි ඕකේ තියන බලය. ඔය දෙයක් තියෙනව වගේ ඔබට ඔය දැනෙන එක, දෙයක් තියනව කියල. ඔබ හිතන එකෙන් බලගැන්විලා තියෙන්නෙ. මේක ඇතුළෙ තව දෙයක් තියෙනව වගේ දැනෙන එක. ඒ බලය බලගැන්වෙනවා. අර බඹරෙ කැරකෙන කොට බඹරෙ විසින් බලයක් ගන්නව වගේ, ඒ බඹරෙ බලගැන්වෙනවා. ඒ එතන තියෙන අංශු කම්පන තව බලය බලගැන්විලා තියෙනව. සිතුවිල්ලෙන් ඔය ඔතන තියෙන්නේ ඒ සිතුවිල්ලෙන් දෙයක් තියෙනවා කියලා දැනෙන එක වෙනයි ඒක සිතුවිල්ලෙන් ඊට පස්සෙ ඒක බලගැන්වෙන එක වෙනයි.

**දැන් බුදුන් වහන්සේ එතන ඒක කඩන ක්‍රම දෙකක් තුනක් පෙන්වනවා එකක් තමයි ඔතන සිතුවිල්ලෙන් බලගැන්වෙච්ච එකට ගහන්න ඕන කියල ඉස්සෙල්ලම. එතන ආත්ම දෘෂ්ටියකින් ඉන්නව සිතුවිල්ලකින් සත්වයෙක් ඉන්නව, ආත්මයක් තියෙනව. මේ සේරම තියෙන එකම තමයි ආත්මය කියන්නේ.** වෙන එකක් නොවේ. දෙයක් කියල දැනෙන එකමයි ඒ දැනෙන එක සිතුවිල්ලෙන් ඉන්නව දෙයක් තියෙනව කියල සිතුවිල්ලක් බලගැන්විලා තියෙනව අප අතර නොතේරී. ඒකට ඉස්සෙල්ල දෙයක් තියෙනව කියන සිතුවිල්ල තියාගන ඉන්න තාක් කල්, අසඤ්ඤ තලයේ සමතය වඩල ඔක්කොම නොදැනෙන තැනට

ගියත් අර සිතුවිල්ල කුඩුවෙන් නැහැ. ඒක නැතිවෙන් නැහැ. දෙයක් දැනෙන්නෑ, අසඤ්ඤ තලයේ ඉන්නෙ. ඒ වුණාට සිතුවිල්ල තියෙනව, ඒ සිතුවිල්ලත් මේ ආරෝපණ බලයේම කොටසක්. ඒ සිතුවිල්ල නැති කරන්න බැහැ වෙන ක්‍රමයකින්. මේ අවබෝධය තුළින් 'අවිද්‍යා අශේෂ විරාග නිරෝධා' කියන්නෙ. මේ අවිද්‍යාව දුරුවෙන්නම ඕන. දැනගන්න ම ඕන ආත්ම දෘෂ්ටිය මොකක්ද ආත්ම සංඥාව මොකක්ද ආත්මයක් කියල දෙයක් තියෙනවද කොහොමද මේ ආත්මය හැදෙන්නේ කියල.

ඒක නිසා තමයි බුදුන් වහන්සේ 'මහා නිධාන සූත්‍රය' 'සංචේතනා සූත්‍රය', 'අභිසංචේතනා සූත්‍ර', 'ස්කන්ධ වග්ග ඛජ්ජනීය වග්ග' ගොඩක් මේ පරියාය දේශනා කළේ. හැබැයි සමහර ඒව බැලුවහම ඒ කෙනාට කෙනාට නිවන විවර වෙන විදියට තමයි දේශනා කරල තියෙන්නෙ. මේ නිවන කියල දෙයක් නැහැ, මෙතන මේ ගින්න නිවෙන එක තමයි නිවන කියන්නෙ. මේ ගින්න තමයි බලය, ඔය බලය කුඩු කරන එක තමයි හැමතැනම කරන්නෙ. ඔය බලයට ගහන්නෙ. එතන දෘෂ්ටියෙන් හැබැයි එනව එතන අවිද්‍යාව, ඇත්තටම අවිද්‍යාව කුඩු වෙන්නෙ. බුදුන් වහන්සේගෙන් බාවාරි බ්‍රාහ්මණයාගේ ගෝලයේ ඇවිත් අහන්නෙ මොකක්ද කියන්නේ බාවාරි බ්‍රාහ්මණයාගේ ප්‍රශ්නය මොකක්ද හිස්මුදුන මොකද්ද හත්කඩකට පැලෙනව කියන්නෙ මොකද්ද බුදුන් වහන්සේ කියන්නෙ. මේක ඒ කාලේ බුදු සමය තුළ ජටිල බ්‍රාහ්මණයින්ගේ ශාප කරන විදියක් හිස් මුදුන හත්කඩකට පැලෙනව කියල ශාප කරනව. බුදුන් වහන්සේ මේකට දෙයක් දාල ධර්මයෙන් හැම තිස්සෙම දෙනව. **බුදුන් වහන්සේ ඒකට දැම්ම ධර්මය මොකක්ද? හිස් මුදුන කියන්නෙ අවිද්‍යාව. හත්කඩකට පැලෙනව කියන්නෙ, අවිද්‍යාවට ගහපු ගමන් හිස් මුදුන හත්කඩකට පැලෙනව කියන්නේ 'සප්ත බොජ්ජංග' වැඩෙනව කියල.**

හැමතැනම මේ ධර්මය තමයි තියෙන්නෙ. සුර අසුර යුද්ධයත් එහෙමයි. නැති දෙයක් තියෙනවා කියල ගත්ත එකයි, අසුරේන්ද්‍රයාගේ මාර බන්ධනය. නැති දේ මොකක්ද? අපිට හැම තිස්සෙම දෙයක් තියෙනව, ඒක දෙයක් තියෙනව කියල ගත්තොත් මාරයට බැඳෙනවා. ඒ කියන්නේ ආත්මයක් තියෙනව ආත්ම දෘෂ්ටියට බැඳෙනව කියන්නේ

මාරයට බැඳෙනවා. මරණයක් තියෙනවා. සුර අසුර යුද්ධය ගත්තොත් අසුරයන්ගේ මාර බන්ධනය මොකක්ද නැති දෙයක් තියෙනව කියල හිතන එක. ඒ කියන්නේ සුරයන් නරකයි අසුරයන් හොඳයි කියල හිතන එක. **මාර බන්ධනය පස් ආකාරයකට බැඳිල තියෙනව කියන්නෙ, ඇස, කන, නාසය, දිව, කය මේ ආයතන පහට බැඳිල තියෙන්නෙ. ඒ ආයතනවලින් එන අරමුණුවලට රැවටිලා ඉන්නෙ ඇත්ත කරගෙන. ඒකට කියනව මාර බන්ධනය කියල. මාර බන්ධනයෙන් මිදෙනව කියන්නෙ 'යථා භූත' 'යථා ආකාරයෙන්' දකින එක.** අන්න එතකොට මාර බන්ධනය ලිහෙනවා. සූරයන් හොඳයි, අසුරයන් නරකයි කියල හිතපු දවසට එතන මාර බන්ධනය ලිහෙනවා. ඒක සත්‍යය විදියට දකිනව නම් සූරයන් හොඳයි. අසුරයන් නරකයි කියලා හිතපු දවසට එතන මාර බන්ධනය ලිහෙනවා. ඒක සත්‍යය විදියට දකිනව නම් සුරයන් හොඳයි අසුරයන් නරකයි කියලා වෙන් නෑ, ඒක දකින් නැහැ. කියනව අසුරයන්. ඔන්න සුර අසුර යුද්ධය. ඒ කියන්නෙ අපි මේ කතා කරන එකක්වත් බුදුන් වහන්සේ කියල තියෙන එකක්වත් සුරංගනා කතා නෙවෙයි. ඒ හැමතැනම තියෙන්නෙ නිවනමයි.

ඒක 'සප්ත සූරියෝද්ගම' සූත්‍රයට ගියත් නිවන් මග පෙන්නන්නෙ. 'පංචමහා නදී සිඳී යයි කියන්නෙ ආයතන ටික පිනවන එක සිඳී යයි කියල. අන්තිමට හුඹස් මැට්ටක් වගේ මහා මේරු පර්වතය අළුවෙලා යනව කීවෙ, අවිද්‍යාවයි. අළුවෙලා යන්නේ. ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පල්ලෙහා හත් වතාවක් ගින්නෙන් විනාශ වෙනවා. ආභස්සර බ්‍රහ්ම ලෝකෙන් පල්ලෙහා විනාශ වෙනව කියන්නෙ, ප්‍රභාස්වර සිත අවදි වෙනව. ප්‍රභාස්වර සිත අවදි වුණා කියන්නෙ, හතරවන වතාවට ජලයෙන් විනාශ වෙන්නේ ජලයෙන් කියන්නේ. ඊට පස්සෙ ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පල්ලෙහා විනාශ වෙනව කියන්නෙ සිසිලස, භාවනා කරන කොට මේක හම්බ වෙනව. ඇයි 'විචිකිච්ඡා' සංසිඳෙනව ප්‍රීතිසුඛ සංසිඳෙන කොට, සිසිල් වෙනවා. ප්‍රායෝගිකව අත්දකිනව 'සප්ත සූර්යොද්ගම සූත්‍රයේ ඔබට මේක හරියට ප්‍රායෝගික නැහැනෙ. දහම තුළ හරියටම ප්‍රායෝගික නැහැ. ඔබට මේව අත්දකින්න බැරිවෙලා තියෙන්නෙ. සප්ත සූරියෝද්ගම සූත්‍රයෙ හරියට තියෙනවනෙ 'පංච මහා නදිය සිඳී ගියා' ඔක්කොම තියෙනවනෙ. අවිද්‍යාව ඔක්කොම තියෙනවනෙ. අපි මේක ධර්මය දැකල නැහැනෙ. ඒකට හේතුව අපි නිවන දන්නෙත් නැහැනෙ.

අපි ප්‍රායෝගික නැහැනෙ. අපි හරියට යතුරක්වත් කරකවන හැටි දැනගෙන තියෙන්නෙ ඕනනෙ. ඒ වගේ වැඩක් මෙතන තියෙන්නෙ. ඒක හරියට දකින්න ප්‍රායෝගික වෙන්න එපායැ ග්‍රන්ථ ධුරයෙන් විදර්ශනා ධුරය මතුකර ගන්න එපැයි.

බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කළේ විදර්ශනා ධුරයනෙ. ග්‍රන්ථ ධුරයක් තිබුණෙ නැහැනෙ, පස්සේ දැන් අපේ දරම්ටිසෑයේ භික්ෂූන් වහන්සේලා මේකට අහුවෙලා විනාශ වෙන්න යනකොට කරගන්න දෙයක් නැතුවනෙ ග්‍රන්ථාරූඪ කළේ. අපි මේකෙන් යැපුණානෙ. උන්වහන්සේලා හිතුවෙන කවදහරි කවුරුහරි විදර්ශනා ධුරය මතු කර ගන්න ග්‍රන්ථ ධුරය හේතුවෙයි කියල. අද ඒක නෙවේද බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ කරන්නෙ. ඇත්තටම බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ කියල කෙනෙක් නැහැ. ඇත්තටම තියෙන්නෙ ආර්ය භූමිය සත්ත්වයෙක් පුද්ගලයෙක් නැහැ. එතන තියෙන්නෙ 'බුද්ධ ස්වභාවය.' නමුත් ඒකට හරිම වචන දෙක තමයි දාල තියෙන්නෙ. බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේල තමයි ඔක්කොම ඉන්නෙ. මේ ධර්මය අවබෝධ වෙනකොට. ඒකට කෙනෙක් පුද්ගලයෙක් නැහැ. මේක අවබෝධ උනහම මෙතන කවුද ඉන්නෙ. ශබ්ද වර්ණ මේව මොකක්වත් නැහැ. ඇත්ත ලෝකෙ පේන්න ගත්තහම ඔබට මේ 'ෆැන්ටසි වර්ල්ඩ්' එක ඉවරයි. ඔක්කොම කුඩුවෙලා යනව, ඊට පස්සෙ ඔබ සාමාන්‍ය විදියට වැඩ කරයි. සාමාන්‍ය විදියට සම්මුතිය තුළ අනෙක් අයත් එක්ක බොහොම සතුටින් වෙනදටත් වැඩිය හොඳට හිනාවෙලා කටයුතු කරයි. එතකොටම ඔබගෙ අවබෝධය, ඒක අසාමාන්‍යයයි. හැමෝම වැලපෙන මොහොතක් එයි. ඔබට සාමාන්‍ය ජීවිතේ හැමෝම වැලපෙන හැමෝම අතහරින දෙයක් එයි. කිසිදෙයක් කිසි කෙනෙක් සම්බන්ධ නොවන දෙයක් එයි. එදාට ඔබ අර පුංචි සාමණේර හිමියෝ සේරම භික්ෂූන් වහන්සේලා පස්සට කරල ඉස්සරහට ගිහිල්ල බෙල්ල තිබ්බ වගේ වැඩක් වෙයි. ඒකට හේතුව ඔබ මහා පුරුෂයෙක් 'ඔබ වේදඥද' ඔබට වඩා වේදඥද කියන්න කෙනෙක් නැහැ, හේතුව ඔබට සත්‍ය අවබෝධ වීම. ඒ මොහොත එනකොට තමයි පේන්නෙ කවුද මහා පුරුෂයා කියල. මේ මනුෂ්‍ය සිතට, මිනිස් සිත අබිබවා ගිය මේ මහා දැවැන්ත පරියායක් ඔබට දකින්න තියෙනව. ඒක දකින එක ලේසි නැහැ. බුදුන් වහන්සේ අසරණ මනුෂ්‍ය ගැන හිතල යමක් පැහැදිලි කරනව. ඒක

අවබෝධ කරලා ඒ අසරණ මනුෂ්‍ය ගැන හිතල යමක් පැහැදිලි කරනව. ඒක අවබෝධ කරලා ඒ අසරණ මනුෂ්‍යයාගේ 'සසර ඕඝය' නිමා වෙනව.

මේකෙ තියෙන්නෙ 'කන්සෙප්ට්' එකක්. ඇත්තටම නැවත මේ ප්‍රීකොන්ස් සිස්ටම්' එක මෙතනින් නිෂ්ක්‍රීයයි. භව ඕඝයට ආයෙ හසුවෙන් නැහැ. එතනින් සියල්ල සුනු විසුණු වෙලා 'නියුට්‍රල්' වෙනවා. ඒක වෙන ආකාරය පුදුමාකාර පර්යායක්. බුදුන් වහන්සේ දේශනා කරනවා ඒ කියන්නේ සත්‍යඥාණේ දිගුව නෙවෙයි, 'කෘත්‍ය ඥාණේ' දිගුව. කෘත්‍ය ඥානයේ දිගුව අතිවිශිෂ්ටයි. මොකද මෙතන ආත්ම සංඥාව අභ්‍යන්තරයට දැනෙන්නේ ඒක 'ඥාණයට' හසුවෙනවා. ඒක දියවෙන ස්වභාවය 'ආසවඛ්‍යය ඥානය' තමයි සිහියට හසුවෙන්නෙ, අන්න අතන අන්ත දෙක අතර තිබුණු බලය නැතිවෙන එක අසුවෙන්නෙත්. අපි කිව්වනෙ තිතක් තියෙනව, ඒ තිතේ එතනයි මෙතනයි අන්ත දෙකක් තියෙනව, එහෙම වුණොත් මැද්දෙ බලයක් එනව කියල. හැබැයි මෙතන මේ යට තියෙන තිත හැම තිස්සෙම පෙන්නුවනෙ කම්පනය වෙන ස්වභාවය, කම්පන නොවන ස්වභාවය කියල සිහිය කියලා සිහියටම තමයි මේක අසුවෙන්නෙ. බලය තියෙන බව සිහියටම අසුවෙන්නෙ. කම්පනය වෙනයි කම්පනය නිසා ඒව ආරෝපණය වෙනයි. ඒකත් සිහියටයි අසුවෙන්නෙ. ඒකට තමයි 'ඥානය' කියන්නෙ. මේක අති සියුම් විග්‍රහයක්. ඒක අභිඥ්ඥා ඥානයට හසුවන පරම සත්‍යය 'ඥායස්ස' අධිගමාය කියන්නෙ මොකද්ද කියන ඥායස්ස අධිගමාය කියන්නේ ඔන්න ඔය ආරෝපණ බලය ශූන්‍ය වෙන එක. ඊට පස්සෙ ආරෝපණය විශ්වයේ කොහේ ගත්තත් තියෙන්නේ ආරෝපණයක් කොහෙ හරි. හැබැයි ඔබේ කතාව ඔබ ඒක ශූන්‍යය කළා කියන්නේ මුළු 'ගැලැක්සිය සීරෝ' මෙතන හැබැයි 'ගැලැක්සියම' නෙවෙයි මොනව කතා කළත් තියෙන්නෙ කම්පනයක්. හැබැයි මෙතන කම්පනය නෑ. මේ 'බුද්ධ ස්වභාවය' අති ගැඹුරු විෂයක්.

බිග්බෑන් ගහලා විද්‍යාඥයො පෙන්නුවෙ මේ මුළු විශ්වයම යනව මෙන්න මෙහෙම කම්පනයකින් කියල. බුදුන් වහන්සේ හැම තැනම කම්පන නොවන ස්වභාවයක් කියල පෙන්නුව. ඒ ගොල්ල දැක්කෙ කම්පනය විතරයි. නාසා ආයතනයට ඒක තාම තේරිල නැහැ.

ඒගොල්ලො දන්නැහැ මේ ප්‍රසාරණය වන බව. මේක හිතා ගන්න බැහැ. මේක ප්‍රසාරණය වෙලා යන්නෙ කොහෙද මේ විශ්වය මෙහෙම වෙන්න පුළුවන්ද? එහෙනම් මේක කවදාහරි හැකිළෙනවද? ඔක්කොම හීන බලනව. බුදුන් වහන්සේ ඔක්කොම කුඩු කරලත් ඉවරයි. උත්තරය පෙන්නලත් ඉවරයි. මෙතන මේ හැම මොහොතෙම තියෙන්නෙ කම්පන වෙන ස්වභාවය, ඇත්තටම තියෙන්නෙ මේ අංශුවේ කතාව ඇතුළෙම මේ අංශුවලම තියෙනව කම්පනය නොවන ස්වභාවය. නමුත් අපට පේන්නෙ කම්පන වන ස්වභාවය විතරයි. ඒකට හේතුව වෙලා තියෙන්නේ අපේ ඉන්ද්‍රියයන්. අපේ ඉන්ද්‍රියට අහුවෙන්නෙ මේක විතරයි. අපිට වෙන මානයක් නැහැ. අහුවෙන්නෙ අපිට අහුවෙන්නෙ ත්‍රිමාන. ඒ පැත්තට මේ පැත්තට යන ඒව විතරයි අහුවෙන්නෙ. මෙතන 'මානයක්' නැහැ. ඒකයි මෙතන 'අසංඛතය' මේ නිවන්. මේක අර ඕලාරික මට්ටමට ගියහම හොඳටම මේක පේන්න ගන්නව. අර සත්තුන්ගෙ විඤ්ඤාණ ස්වභාව ටික බලල මනුෂ්‍යයින්ගෙ විඤ්ඤාණ ස්වභාව ටික බලල කම්පන ස්වභාව ටික බලල 'ටෙලි' වන ආකාරය බලල හොඳ විග්‍රහයක් කරන්න පුළුවන්. එතකොට තමයි තරු පේන්න ගන්නෙ හිතාගන්න බැරිවෙනව, දැන් මෙතන හුස්ම ටික ගියොත් වෙන දේ කියන්න පුළුවන්. 'බුද්ධ ඤාණං අචින්ත්‍යයි' කියන තැනට එනව.

මේව හොඳට සියුම්ව ගළපන්න පුළුවන් හැකියාවක් තියෙනව. ඒ නිසා තමයි අපි අර ඊයෙත් කීවෙ රජවරු රජකම් අතහැරියෙ සිටුවරු සිටුකම් අතහැරියෙ, ඊට එහා දෙයක් තිබුණෙ නැහැ. ඒගොල්ලන්ට ආයතන පිනවීම හැර. නමුත් ඒගොල්ල දැක්ක බුදුන් වහන්සේ සදාතනික සුවයක් ගැන කියනව. ඒගොල්ල දැක්ක බුදුන් වහන්සේ සදා අමරණීයත්වයක් ගැන කතා කරනව. ඒ කියන්නෙ කිසි දවසක නොවෙනස්වන සුවයක් විඳිනව. අරක ආයතන පිනවනකම් විතරයි තියෙන්නෙ. ඔය රජවරු සිටුවරු උපරිමයට ගිහින් ඉවරයි. ආය පිනවන්න දෙයක් නැහැ. ඔක්කොම පිනවලා තියෙන්නෙ. මීට වැඩිය දෙයක් නැහැ කියල. ඊට වැඩිය දෙයක් කොහෙද තියෙන්නෙ. ගෞතම බුදුන් වහන්සේ ගාව සිටුවරු සිටුකම් අතෑරලා එන්න ඕන ආයෙත් ගෞතම බුදුන් වහන්සේ ළඟට. ඇයි, ඊට වඩා සැපයක් මේකෙ තියෙනව කියන්නෙ, අරක හුස්ම ටික යනකම් විතරයි. ඊට පස්සෙ කොහොමත් දුරක් මේකෙ එහෙම නෙමේ. හුස්ම ටික

ගියත් සැපයි. **හුස්ම තිබ්බත් එකයි ගියත් එකයි මෙතනම. 'සදාතනික සුවයක්' අත්විඳිනව. ඇයි මරණෙකුත් නැහැ. මරබියකුත් නැහැ. හිටිය කෙනෙකුත් නැහැ. ඉන්න කෙනෙකුත් නැහැ. මැරෙන කෙනෙකුත් නැහැ. අංශු කම්පනයකුත් නැහැ. අංශු කම්පනයත් 'සීරෝ' කරල සේරම 'ජකඳි කරල භව 'ඕඝය' නිමා කරල 'සුවිසුද්ධං' කියල.**

**උපාසකතුමා:** අවසරයි ආර්යයන් වහන්ස, එදත් ආර්යයන් වහන්සේගේ දේශනාවේ කියවුණු සියුම් කරුණක් ගැන. අංශු කම්පන ස්වභාවය කියන කරුණ ගැන කියල. ඒක පැහැදිලි කරල අන්තිමට කීව අංශුවකුත් නැහැ කියල එතන නම් කරන ලද්දේ නාමයයි කීව වගේම 'ඕඝ තරණ' සූත්‍රයේ පාරුව අතහරින්න කියන්නෙත් ඒ කියූ කරුණාව විය යුතුයි. ආර්යයන් වහන්ස ආනන්ද ස්වාමීන් වහන්සේට වැරදුණොත් නිවන් දකින්න ගිහිල්ල පළවෙනි සංගායනාවට ඉන්න ඕන නිසයි. සංගායනවාට ඉන්න ඕන කියන සියල්ල අතහැරිය තැන තමයි නිවන් දැක්කෙ එතන තමයි ආර්යයන් වහන්සේ හැමදාම කියන වචනයෙන් විස්තර කරන්න බැරි තැනකට පත්වෙන්නෙ.

**ආර්යයන් වහන්සේ:** ඔව්. ඇත්තටම එහෙම කියනව නම් දැන් මේ කියපු විග්‍රහය කවුරුහරි කරේ තියා ගත්තොත් එයාගෙ නිවන වැහෙන්නේ ඕක නිසයි. හේතුව තමයි ඔය කතා කරන හැම එකක්ම සංඥාවක් වෙනව. ඕක තවත් එයාට 'ස්පාක්' එකක් වෙනව, මෙතන අභ්‍යන්තර පරිවර්තනය කියන්නේ ආරෝපණය දියවෙන්න ඕන. හැබැයි මේ ඇසෙන්, කනෙන්, නාසයෙන්, දිවෙන්, කයෙන්, මනෙන් එන ආරම්මණ හැම තිස්සෙම කරන්නෙ අභිසංස්කරණයක්. මේකත් දැනුමක් වෙනව කියන්නෙ භයානකයි. ඒකට හේතුව තමයි ඒකෙන් අර අභ්‍යන්තර අවබෝධයට පත්වීම තුළ මේක දැනෙන්න ගත්තහම මේක තේරෙන්න ගත්තහම, මේක එදිනෙදා කටයුතු කරන කොට මෙයාට මේ මොනවහරි දෙයක් ඉලිප්පිල එනකොට මේක මතුවෙනව. මතුවෙන කොට, මෙයාට මෙතන තේරුමක් නැහැ කියල අන්න එතන යහපත සිද්ධ වෙනව. හැබැයි මෙයා මේක දැනුමට අරගෙන මේක ලොකු ආභරණයක් කර ගත්තොත් අර පාරුව කරේ තියාගත්ත වගේ තමයි. ඒකම තමා එයාට නැතිකර ගන්න බැරිවෙන්නෙ. ඒකට හේතුව තමා මෙතන එහෙම දේකුත්

නැහැ. ඒ කියන්නේ මේක අවසානයේ අපට 'මනෝ සෙන්සර්' එකෙන් සිතුවිල්ලක් ආවත් දෙයක් කරගන නිවන කියල ගත්තොත් සිතුවිල්ලක් තමයි. මෙතන අපි හිතන කිසිම දෙයක් නැහැ මෙතන අපට මනසිකාරය අවශ්‍යයි. මේක අවබෝධ කරන්න. ඒක නිසා අපි මනසිකාරය භාවිත කරනව. 'ඡන්දං ජනේති වායමතී' වීර්යං ආරාභති චිත්තං පග්ගංභාති පජහතී" නිවනටත් ඡන්දයක් තියෙනව මහණෙනි කියලා කියනව. හැබැයි ඒ ඡන්දයත් අන්තිමට අතහැරෙනවා. අවසානයේ මෙතන එහෙමත් දෙයක් නෑ.

**අර ආරෝපණය දියවෙන තැන අර අභ්‍යන්තර සිහියට හසුවෙන කොට, තමන්ට හැම දේකම දෙයක් නැති බව සිහියට අසුවෙන කොට කම්පන දියවීගන යනව සිහියට හසුවන කොට, ඇත්තටම මේ 'මනෝ සෙන්සර්' එකෙවත් සිතුවිල්ලකවත් එයාට දෙයක් හමුවෙන් නැහැ. ඒ කියන්නෙ මොන සිතුවිල්ල ආවත්, ඒ එක සිතුවිල්ලකවත් හිමිකාරයෙක් කෙනෙක් නැහැ.** 'සිස්ටම් එකෙන් දුවන එකක් විතරයි' ඒකෙන් බලගැන්වීමක් සිද්ධ වෙන් නැහැ. අර 'සිස්ටම්' එක 'සෙන්සස්' විදියට දැකල, ඒකෙ ආරෝපණය නැති වෙනව කියන එක තමයි අර අංශු කම්පනය තුළ බලය නැති වෙනව කියන්නෙ. දැන් අංශු කම්පනය තුළ බලයක් තිබුණොත් නෙ. මේ අංශුව බලයක් තිබුණොත් දිගටම යනව. අර බලය නැති වුණාට පස්සෙ, හැබැයි බලය නැති වුණාට පස්සෙ ඒකෙ භරයක් නෑ. ඒක තමයි ඔය ඔබට දැනෙන්නෙ. කිසිම භරයක් නැහැ. 'නිබ්බිදන්ති විරාගන්ති නිරෝධන්ති පටිනිස්සභගානුපස්සී' කියන්නෙ. ඔන්න ඔය නිසාම තමයි ඕකෙමයි ආරෝපණ බලය තියෙන්නෙ. ඒකයි බුදුන් වහන්සේ 'රස පටිසංවේදී - රස රාසඝන පටිසංවේදී' කියල කීවෙ, ඒ කියන්නෙ ඡන්දරාගය දුරුවීම. ඡන්දරාගය කියන්නෙ ආරෝපණය. ආරෝපණ බලය තමයි මේකෙ දුරුවෙන්නෙ.

**උපාසක :** ආර්යයන් වහන්ස බොහෝ වෙලාවට සත්‍ය ඥානය හරහා මේක දැක්කම ඇත්තටම අපි විදර්ශනා කරන්නෙ අරමුණ නම්, ඒක අපට කරනව නෙවෙයි. කෙරවෙන තැනට පත්වෙනව සහ ඒක සිතීමකුත් නෙවෙයි ඇත්තටම සිහිය කියන දේ. දැන් අවසානයේ ආර්යයන් වහන්සේ කීවෙ ඔය අවබෝධය තුළ රාග, ද්වේෂ ක්ෂය වෙන

ආකාරය දකිමින් ඔය යන ගමන, එක තැනකට පස්සේ ඉබේ සිදුවන දෙයක් මිසක් හිතල කරන්න ගියොත් මාර්ගය වැරදෙනව කියන එක. එතනදි ආර්යයන් වහන්සේ සත්‍ය ඥානයම ඉතාමත් නිවැරදි ආකාරයෙන් පැහැදිලි කරගත යුතුයි නේද මෙතනට එන්න. සමහර වෙලාවට මොහොතකට ඒ අවබෝධය ඒ දැනීම එනව. ආපසු අපි වැටෙනව. සත්‍ය ඥානය යම් ගැටලුකාරී තැන් තිබුණොත්, 'කෘත්‍ය ඥානය' තුළ සමහර වෙලාවට වෙන දේ අපට තෝරා බේරා ගන්න බැරි ප්‍රශ්නයක් වෙනව නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මේක සම්පූර්ණයෙන්ම තියෙන්නේ සත්‍ය ඥානය මත. සම්පූර්ණයෙන්ම මේක ඒ කියන්නේ සක්කාය දෘෂ්ටිය ප්‍රහීන වෙන්නේ දර්ශනය මත පමණයි. සක්කාය දිට්ඨිය ප්‍රහීන වෙන්න වෙන ක්‍රමයක් නැහැ. කවදාවත් භාවනා කරල සක්කාය දිට්ඨිය ප්‍රහීන කරන්න බැහැ. ඒකයි බුදුන් වහන්සේ දේශනා කළේ. එහෙමනම් පටිච්ච සමුප්පාද ධර්මය මෙනෙහි කරන්න ඕන නැහැ. එහෙනම් පස්වග තවුසන්ට අර විදියටම පුළුවන් සක්කාය දිෂ්ටිය ප්‍රහීන කරන්න. කවදාවත් වෙන්නැහැ මේක නිසා තමයි 'සත්‍ය ඥානය' කෘත්‍ය ඥානය සතර සතිපට්ඨානයේවත් හම්බ වෙන්නෙ නැහැ **දර්ශනය නැත්නම්, දර්ශනය නැත්නම් සතර සතිපට්ඨානය වඩන්නත් බැහැ. ඒක අපිට හම්බ වෙනව. විනෙය්‍ය ලෝකේ අභිජ්ජා දෝමනස්සානං කායෙකායානුපස්සි විහරති' කියන කොට. මේ 'විනෙය්‍ය ලෝකේ' කියන්නේ ලෝකය ඇත්ත කරගන සතර සතිපට්ඨානය වඩන්න බැහැ කියන කොට, එහෙනම් ලෝකය කොතනින්ද නැතිවෙන්නේ, ලෝකය නැති වෙන්නෙ දර්ශනයෙන් පමණයි.** ඒක කියල ඉවරයි. ඒව සමීකරණය වගේ සූත්‍ර තියෙන්නෙ.

සතර සතිපට්ඨානයේ තියෙන්නෙ 'කෘත්‍ය ඥානය.' සත්‍ය ඥානය තියෙන කෙනාට බුදුන් වහන්සේ දේශනා කරනව, අනුපිළිවෙළින් යන නිවන් මගක් තියෙනව මහණෙනි කියල අනුපිළිවෙළින් යන නිවන් මග ප්‍රතිපදාවට එන්නේ අනුපුබ්බ සික්ඛා අනුපුබ්බ කිරියා අනුපුබ්බ ප්‍රතිඵදා' එතකොට මෙතන 'අනුපුබ්බ සික්ඛා' 'අනුපුබ්බ කිරියා' මේ අනුපිළිවෙළින් 'සත්‍ය කෘත්‍ය කෘත' 'තිපරිවට්ටං ද්වාදතාකාරං කියල තමයි එන්නෙ. ඒ පූර්වභාග ප්‍රතිඵදාව කතා කරන කොට සත්‍ය ඥානය

මයි තියෙන්නෙ. ඒ විතරක් නෙවේ බුදුන් වහන්සේ එක තැනක කියන්නෙ හිමාල පර්වතය උපමා කරල, ආනන්දය, හිමාල පර්වතයද ලොකු අතේ තියෙන ගල්කැටයද, අතේ තියෙන ගල්කැටය නොසැලකිය තරම් කුඩයි ස්වාමිනි. හිමාල පර්වතය කොයිතරම් විශාලද? එතකොට යමෙක් ඇත්තටම දර්ශන අවබෝධය තුළ තමයි සෝවාන් වෙන්නෙ. ඒ කියන්නෙ අනුසෝතයෙන් පටිසෝතයට එනව. අනුසෝතයෙන් පටිසෝතයට එන එකත් ලේසි නෑ. මේ සමහර අය හිතා ඉන්නෙ හරි ලේසියි. ඒ කියන්නෙ අපි ගත්තොත් එහෙම හිතලුවට නිවන් දකින්න බැහැ. අවබෝධයක් එන්න එපැයි. දැන් කවුරුහරි හිතනව ආ මෙතන මොකුත් නැහැනෙ. මොකුත් නැහැ කියල හිතන එයා ඉන්නව. මුකුත් නැත්නම් එයා නෑ කියලා එයා දන්නෙත් නැහැ. 'සක්කාය දිෂ්ටිය' ප්‍රහීන වෙලා නැහැ. ඇයි එයා ඉන්නවනෙ. ඒ කියන්නෙ මෙතන සක්කාය දිෂ්ටිය ප්‍රහීන වෙනකොට තමන් කියල කෙනෙක්වත් හම්බ වෙන්නෙ නැහැ.

මේක දැනුමට හරි ඒක සිද්ධවෙන්නෙ නැහැ. ඒ කියන්නෙ, අපි දන්නව සෝතාපත්ති අංගවල මොනවද තියෙන්නෙ? "සද්ධර්ම ශ්‍රවණය, කල්‍යාණ මිත්‍ර ඇසුර, ධම්මානු ධම්ම ප්‍රතිපදාව' මේකෙ මොනවද මේ කියන්නෙ. ඇයි මේ සද්ධර්ම ශ්‍රවණය අවශ්‍ය. ඇයි මේ කල්‍යාණ මිත්‍ර ඇසුර අවශ්‍ය, අපේ භාවනා පන්තිවල අය භාවනා කරල ඉවරයි. ඔක්කොම හරි, මොකවත් හරියන්නෑ. ඔබ රැවටෙනවනෙ. ඔබ අසරණ වෙනවනෙ. බුද්ධ දර්ශනය ගිලිහුණු සමාජය හරි අසරණයි. මෙතන බෞද්ධයෙක් නැහැ. බෞද්ධ කියන්නෙ භව නිරෝධය දකිනව. භව නිරෝධය දකින්නෙ දෙයක් නැති බව දකිනව දෙයක් නැති බව දකින්නෙ, මෙතන පර්යායක් තියෙනව. ඒකයි මේ කල්‍යාණ මිත්‍රයා මතමයි ආනන්ද මේ ශාසනය රැකෙන්නෙ කියන්නෙ. ඒ කියන්නෙ මේක හොඳටම තේරෙනව සබ්භාව්‍යව සූත්‍රයට ගියහම. මේ සූත්‍ර හැම එකේම මේ කතාව තියෙනව. කවුරුත් ගණන් ගන්නැති එකයි තියෙන්නෙ. 'දිට්ඨිංච අනුපග ම්ම සීලවා, උස්සනේන සම්පන්නෝ, කීවොත් දර්ශන සම්පන්න කෙනා තමයි 'සම්මා දිට්ඨියට' එන්නෙ. දර්ශනය තියෙන්න ඕන එහෙනම් සම්මා දිට්ඨියට එන්න. දර්ශනය නැත්නම් මාර්ගයකුත් නැහැ.

'සබ්බාසව සූත්‍රයට' ගියහම දස්සනා පහාතබ්බා සබ්බාසව සූත්‍රයෙම තියෙනව දස්සනා පහාතබ්බා කියන කොටස. හොඳට අධ්‍යයනය කරල

බලන්න. **දර්ශනයෙන් ප්‍රහාන වෙන කෙලෙස් වෙන කිසිවකින් ප්‍රහාන නොවේ. 'දස්සනා පහාතබ්බා' අධිවාසනා පහාතබ්බා, සංවරා පහාතබ්බා, විනෝදනා පහා තබ්බා, පටිසේවනා පහාතබ්බා, ඔහොම තමා. අවසානය දානවා භාවනා කොටස. ඒකත් අර සමථය නෙවේ. ඒ අර විදර්ශනාව, විදර්ශනාව කියන්නේ මෙතන දෙයක් නැති බව මෙනෙහි වෙන කොට උපදින සමාධිය 'ඛණික සමාධිය' සමාධි භාවේ තබ්බං කීවේ විදර්ශනා සමාධිය.** බුදුන් වහන්සේ වෙන සමාධි ගැන කතා කරන්නැහැ. ඒකට 'සමාධි භාවේ තබ්බං' කියන ඒ වචනෙත් අල්ලගන අන්තිමට සමථය වඩන එක. සමථය ඔන්න චුට්ටක් හිත විසුරුණාම සමාධියකට පත්කර ගන්න කරාට කමක් නැහැ. අර වෛද්‍යවරු ස්නායු පද්ධතියෙ රෝග යක් ආවම 'අබිං' වගේ ඒව පාවිච්චි කරනව. අර වේදනා නාශකයක් විදියට. හැබැයි 'අබිං' ගැහුවොත් මොකද වෙන්නෙ. ඒක ඉවරයි. ටිකක් කල් යනකොට ඉවරයි. තේරෙනව 'අබිං' ගහපු එක. එතකොට මොකද වෙන්නෙ. මේ වගේ වැඩක් තමා මේක. සමථය පොඩ්ඩක් වැඩුවට කමක් නැහැ. විසුරුණු හිත තැන්පත් කරගන්න. නැත්නම් 'අබිං' ගැහුවොත් ඉවරෙටම ඉවරයි. ඒක හිරවෙනව ඊට පස්සෙ විදර්ශනාව දන්නෙත් නැහැ. ඒක විදර්ශනා සමාධිය කියල හිතාගෙන බලන කොට, ඒක නිවන කියල හිතාන ඉන්නව.

මෙතනදි 'ධම්ම සංගීකරණය' අපි කියන්නෙ හැමෝටම බලන්න. 'ධම්ම සංගීකරණය' තමා 'ඩික්ෂනරිය.' ඔය සූත්‍ර හැම එකකම හැම වචනයක්ම තියෙන්නෙ ධම්ම සංගීකරණයෙ. 'ඩික්ෂනේරිය' වගේ තියෙන්නෙ. ඒකෙ තියෙනව අන්න ඔබට හොඳට බැලුවහම පිටු ගණනාවකට අහුවෙනව. සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස තුන් සංයෝජනයෝ දර්ශනයෙන්ම පමණක් ප්‍රහානය වේ. භාවනාවෙන් ප්‍රහානය නොවේ. ධර්මසංගීකරණය අරන් බලත හැකියි. භාවනාවෙන් ප්‍රහාණය වන කෙලෙස් මොනවද දර්ශනයෙන් ප්‍රහාණය වන කෙලෙස් මොනවද සක්කාය දිට්ඨි කෙසේ ප්‍රහාණය වෙනවද සීලබ්බත පරාමාස කෙසේ ප්‍රහාණය වෙනවද ඔය තියෙන්නෙ ඔබ හොඳට බුදුන් වහන්සේ පැහැදිලි කරල තියෙන්නෙ. දැන් කවුරු කීවත් නැතත් අපට වැඩක් නැහැනෙ. මේකෙ මෙහෙම දෙයක් ලියවිලා තියෙනවනෙ. අපිට ඕන මාර්ගයනෙ. අපිට ඕන සත්‍යනෙ. අපිට ඒ මාර්ගය තුළ ගිහිල්ල එයාට

ඒක සාක්සාත් වෙනව නම් එච්චරයි. කතන්දර වැඩක් නැහැනෙ. අපිටත් යම්කිසි දෙයක් දැනෙනව නේ.

බුදුන් වහන්සේ කියනව, ඇහුවත් පිළිගන්න එපා කීවත් පිළිගන්න එපා දැක්කත් පිළිගන්න එපා. 'මාපිටක සම්පදාය' පොතේ තිබුණත් පිළිග න්න එපා, මා කීවත් පිළිගන්න එපා. ඔය තියෙන්නෙ 'මහෝපදේශනා සූත්‍රයෙ' කාලාමවරුන්ට එහෙම කියන හැටි තියෙනව. මේක ප්‍රත්‍යක්ෂ නම් පමණක් පිළිගන්න. මේකෙ තියෙන ප්‍රශ්නය තමයි ප්‍රත්‍යක්ෂ නොවී කොහොමද බාර ගන්නෙ. ප්‍රත්‍යක්ෂ වෙන්න නම් රහත්වෙලා තියෙන්න එපායැ. නැහැ. **ඔබට මේක එදිනෙදා ප්‍රත්‍යක්ෂ වෙනව. ඔබට ඔබේ කෙලෙස් සංසිඳෙනව අත්දකින්න ලැබෙනව. ඒක සිහියට හසුවෙනව. ඒක ප්‍රත්‍යක්ෂ වෙනව. ඔබට ඔබේ කෙලෙස් සංසිඳෙනව. ඒක සිහියට අසුවෙන එක තමන්ට ප්‍රත්‍යක්ෂ වෙනව. ඒකයි බුදුන් වහන්සේ කීවේ ප්‍රත්‍යක්ෂ ධර්මයක් බාර ගන්න කියල. රාග, ද්වේෂ, මෝහ, කෙලෙස් සංසිඳෙන කොට මේ විදියට යනකොට ඒක අත්දකින කොට ඒක බාරගන්න ධර්මයට විනයට ගළපගන්න. ධර්මයට විනයට ගළපගන්න ගියාම මොකක්ද ඇතිවන ප්‍රශ්නය, ධර්මය කියන්නෙ දෙයක් නැති බව. 'පටිච්ච සමුප්පාදේසු ධම්මං' පටිච්ච සමුප්පාදය අවබෝධ වුණාම දෙයක් නැහැ ධර්මයට ගළපනව කීවෙ.** දැන් කවුරුන් හරි මොනවහරි ධර්මයක් දේශනා කරනව නම් ඒක 'පටිච්ච සමුප්පාද' ධර්මයට ගැළපුවාම එතන දෙයක් තියෙන්න බැහැ. සැප විඳින්නෙ හරි දුක් විඳින්නෙ හරි දෙයක් තිබ්බොත්, ඒක පටිච්ච සමුප්පාදයට ගැළපෙන් නැහැ. ඊට පස්සෙ රාග විනය ද්වේෂ විනය කියන්නේ, විනයට ගළපනවා කියන එකයි. ඇලෙන්නෙ ගැටෙන්නෙ දෙයක් තිබ්බොත් තමයි. ඇලෙන්නෙ, ගැටෙන්නෙ ඒකයි. රාග විනයට ද්වේශ විනයට ගළපනව කියන්නෙ.

ඉතින් මේ ධර්මය කොච්චර අභිඤ්ඤා දේශනා කළත් ආර්යයන් වහන්සේ මොන විදියට ධර්මය පැහැදිලි කළත් ආර්යයන් වහන්සේ බුදුන් වහන්සේට තියෙන බුද්ධ ගෞරවය තථාගතයන් වහන්සේගේ සූත්‍ර දේශනාවලට තියෙන ගෞරවය සම්පූර්ණයෙන් දීලනෙ කතා කරන්නෙ. මොකද හේතුව ඇත්තට මේ ඒකෙ තියෙනවනෙ ඒක. ඒක කවුරුහරි ලියලත් තියෙනවනෙ මේකෙ. එතකොට ඒක කිව්වම ඇතිනෙ. හැමෝම

පැටලිලා ඉන්නවනෙ. මේ හැමෝටම අග මුල මැද ගළපගන්න බැරුව ඉන්නවනෙ. ඇත්තම කීවොත් මේකෙ අවසානයේ ඵලයක් ලබන්න කෙනෙක් නැහැනෙ. මේකෙ කෙනා නැතිවෙනවනෙ. ඒකනෙ බුදුන් වහන්සේ නිහඬව පාදචාරිකාවෙ යන්නෙ ඒකනෙ. බුදුන් වහන්සේ ඔය ගහක් යට ඉඳගෙන දානෙ වලඳන්නෙ. ඒකනෙ සැරියුත් හාමුදුරුවො කියන්නෙ මම පාපිස්ස වගේ කියල. මේක 'මහේච්ඡයට' නෙවේ 'අල්පේච්ඡයට' කියන්නෙ. 'අල්පේච්ඡ' අයට කියන දහමක්. 'මහේච්ඡතාවයෙන් ගන්න බැහැනෙ. මේක මේ තියෙන මුදුන් මල්කඩ, අවසානයේදී මේ මනුෂ්‍යයා නිවන් දකින්න එපයි. ඒ උත්තරීතර තැන කිලිටු කරල හරියන් නැහැනෙ. මේ අසරණ මනුෂ්‍යයා දුකින් මිදෙන මගක් අපටත් ඕන දෙන්න.

දැන් මේක අපිට දිට්ඨි සංයුත්තයට ගියාම මරුන් බඹුන් මිනිසුන් දෙවියන් සහිත අසෘතවත් පෘථග්ජන මිථ්‍යා දෘෂ්ටික උන්මත්තක භූමියෙන් මිදුණෙ නැත්නම් මම 'සම්මා සම්බුද්ධ' යැයි නොකියම් කියලා 'සම්බෝධි සූත්‍රවල' පවා තියෙනව. ඒක තියෙනව සූත්‍රවල අපි කියන්නෙ එතකොට මේ 'උත්තරීතර බුද්ධ ස්වභාවය ඇත්තටම ඒ ස්වභාවයට තමා පත්වෙන්නේ. එතනම බුදුන් වහන්සේ එක වාක්‍යයකින් ඔක්කොම කවර් කරල තියෙනව. මරුන් බඹුන් මිනිසුන් දෙවියන් සහිත අසෘතවත් පෘථග්ජන මිථ්‍යාදෘෂ්ටික උන්මත්තක භූමියෙන් මිදිල තමයි මේ මාර්ග ඵල ලබන කෙනෙක් ලබන්නෙ. ඒක බුදුන් වහන්සේ කියන තව සූත්‍රවලත් මහණෙනි මම අසෘතවත් පෘථග්ජන මිථ්‍යාදෘෂ්ටික භූමියට යමක් කියයිද, ආර්ය භූමියට එය බොරුවක් කියනව. ඒ කියන්නේ බුදුන් වහන්සේ ඒ විදියට අස්තෘතවත් පෘථග්ජනයින්ට යමක් කියයිද, හැබැයි ආර්ය භූමියට ඒක අසත්‍යක් කියනව. ආර්ය භූමිය කියන්නේ ආර්යයන් වහන්සේලා. ආර්යයන් වහන්සේලාට මේක මේ පෘථග්ජන භූමියේ දෙවියන් මරුන් බඹුන් කතා නෑ. ආර්යයන් වහන්සේලා අඳුර ගන්න.

බුදුන් වහන්සේ උපක හම්බු වෙන කොට, උපක අහනව ස්වාමීනි ඔබ මනුෂ්‍යයෙක්ද? දෙවියෙක්ද? බ්‍රාහ්මයෙක්ද? ගන්ධබ්බයෙක්ද කියල. නැහැ මම මනුෂ්‍යයෙක් නොවේ, දෙවියෙක් නොවේ, බ්‍රාහ්මයෙක් නොවේ, ගන්ධබ්බයෙක් නොවේ. සත්වයෙක් පුද්ගලයෙක් නෙමේ නම් ස්වාමීනි ඔබ කවුරුන්ද? ඒකනෙ ඔතන තියෙන ප්‍රශ්නෙ. මම 'බුද්ධ' වෙමි. එතකොට

බුද්ධ කියන්නෙ සත්වයෙක් පුද්ගලයෙක් නෙවේ. මනුෂ්‍යයෙක් නොවේ. දෙවියෙක් නොවේ, බ්‍රහ්මයෙක් නොවේ. ගන්ධබ්බයෙක් නෙවේ. ඔය එක්කෙනෙක්වත් නොවේ, **ආර්යයන් වහන්සේලා කියන්නෙ සත්වයෙක් පුද්ගලයෙක් නෙවේ. 'අරියානන් දස්සාවි, අරිය ධම්මේසු කෝවිදො, අරිය ධම්මෝ විනයෝ' කියන තැන ඒව නෑ.** එහෙනම් ඔබ ආර්යයන් වහනසේ නමක් වෙන්න ඕනෑ නම් සත්ව පුද්ගල දෘෂ්ටිය අයින් කරන්න. එහෙම නැත්නම් ඔබට ආර්ය භූමියක් නැහැ. අපිට ඕන නිර්මල පිරිසිදු ධර්මය දේශනා කරන්න. මේ මනුෂ්‍යයාට එතන ගළපගන්න තැනක් නැතිවෙලා තියෙනව. එතන ගළපගන්න ප්‍රායෝගිකව අත්දැකීම් සහිතව ඒ විදර්ශනා ධුරය මතුකරල දෙන්න කෙනෙක් නැතිවෙලා තියෙනව. අන්න ඒ හිස්තැන පුරවන්නයි. මොකද හෙට උපදින ඒ පොඩි දරුවෙක් හෝ නිවැරදි මගට යන්න ඕන. ආර්ය භූමියට පරිසරය සෑදීමයි මේ බුද්ධෝත්පාද දේශනාවල අරමුණ වන්නේ. ආර්යයන් වහන්සේලාට සුදුසු පරිසරයක් තියෙන්න ඕන. සැබෑම උත්තරීතර ආර්යයන් වහන්සේලා බිහිවෙන්න ඕන. සැබෑම අනුත්තර ස්වභාවය අඳුනගන්න ඕන ඒ අල්පේච්ඡ ජීවිතය 'අල්පේච්ඡතාව' කියන්නෙ මොකක්ද? ඒ සත්ව පුද්ගල දෘෂ්ටිය අතෑරෙන ස්වභාවය මොකක්ද? එතන උතුම් තැනක තියෙන්නෙ.

වටිනා දහම් පර්යායක් අභිධර්ම දේශනා තුළින් සපයනව. ඒ වගේම කියන්න ඕන අර මතු කරපු කාරණාව, තමයි මේ දර්ශනය නැතුව කිසි කෙනෙක් කරන්න දෙයක් කිව්වට වැඩක් නැහැ. ඔබ හිත දකිනව කීවට ඔබට හිත දකින්න බැහැ. ඔබ දර්ශනය දැක්කොත් ඒ දර්ශනය තුළ ඔබ දකිනව. මේ කියන දේ. අන්න ඇත්ත දකින්න. දර්ශනය තුළින් ඔබ හඳුනා ගන්නව ඔබ දන්නව මෙතන ශබ්දයයි වර්ණයයි තියෙන්නෙ. ඔබ දන්නව මෙතන බිත්තියක් නැහැ කියල. ඔබට බිත්තිය දකින කොට අන්න දැකපු බවට සිහියකුත් තියෙනව. බිත්තිය දෙයක් වෙලාද නැද්ද කියල අභ්‍යන්තර සිහියටයි හසුවන්නෙ. එතනයි රහස තියෙන්නෙ. ඒ දෙයක් උනාද නැද්ද කියන එක කම්පන ස්වභාවයක්. ඒ දෙයක් වෙලා නම් එතන බිත්තිය දකින එක වෙනයි. ඒකට සිහියත් තියෙනව. පටලවා ගන්න එපා. ඒක ස්කන්ධ මට්ටම. බිත්තිය පේනව. බිත්තියට ගින්නක් තියෙනව නම් ඒක දෙයක් වගේ දැනෙනව. ඒකත් සිහියටයි හසුවන්නෙ.

මෙතන 'කුසලස්ස උපසම්පදාව' එහෙනම් අරමුණේ බැස ගත්තොත් 'අජ්ජෝ සාය තිට්ඨති යා රූපේ නන්දි තදුපාදානං භවෝ' දෙයක් කියල ගත්තොත් ඒ දෙයක් කියල ගන්නව කියන්නෙම, අර බැස ගත්ත කියන එකමයි. ඒක සිහියට හසුවෙනවා. 'කුසලස්ස උපසම්පදාව' කවදාවත් විඤ්ඤාණ මායාවක, ඒ කියන්නෙ මේ සිතිවිලිවල කුසලයක් තියෙන්නෙ විදියක් නැහැ. ඒක වෙන්නෙ නැහැ.

ඒ කියන්නෙ අපේ මේ සිතිවිලි නෙවේ කුසලය කියන්නෙ. **අර අභ්‍යන්තර දෙයක් නැති බව දැනෙන සිහිය, ඒකයි 'ඥාන සම්ප්‍රයුක්ත' කුසලය.** ඒ 'ඥාන සම්ප්‍රයුක්ත' මහා කුසලසින් හඳුනා ගන්න. මේ 'කුසලය' කියල, කිසිම වෙලාවක විඤ්ඤාණ මායාව සිතුවිල්ලට ගන්න එපා. 'සබ්බ පාපස්ස අකරණං' සියලු සිතුවිලි අකුසල්. ඒ කියන්නෙ විඤ්ඤාණ මායාව සත්‍යයක් නොවේ. ඒක මායාවක්. 'සබ්බ පාපස්ස අකරණං. කුසලස්ස උපසම්පදා' කියන්නෙ මේ සිතුවිලි විඤ්ඤාණ මායාවක් බව දැකීමයි. කුසලය සිහියට හසුවෙන්නෙ මේකට රැවටුණාද කියල සිහියට හසුවෙනවා, රැවටුන් නැත්නම් ඒකත් සිහියට අසුවෙනවා. 'සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා' අන්න එතන තමා 'උපසම්පදා ශීලය' තියෙන්නෙ. 'උපසම්පදා' අර අල්ල ගත්ත බැඳිච්ච උපාදාන නොවන 'ශීලය' මෙතනයි තියෙන්නෙ. 'කුසලස්ස උපසම්පදා' අන්න එහෙම වුණොත් 'සචිත්ත පරියෝදපනං' චිත්ත දමනය. සිද්ධ වෙන්නෙ. මොකද සිතට එන අරමුණේ සත්‍ය දකිනව. 'යථාභූතං පජානාති' කියන්නෙ යෝනිසෝ මනසිකාරය යථාභූත ඥානය කියන්නෙ, එන අරමුණේ සත්‍ය දැකල මිදෙනව කියන්නෙ එකම කතාව. **ස්කන්ධයේ උදයවැය දකිනව කියන්නෙ, උපාදානස්කන්ධයෙන් මිදෙනව කියන්නෙ ආර්යකාන්ත ශීලය කියන්නෙ, උදයවැය දකින ශීලය කියන්නෙ එකම කතාව.**

අරමුණ දෙයක් කරගන්නවද නැද්ද අරමුණ දෙයක් උනහම ඒක හසුවන්නෙ සිහියට. ඒ සිහියට අපි සිහියයි කියන්නැහැ. 'ඥානය' කියල කියනව. ඒකට හේතුව දර්ශන ඥානයෙන් ඒක එන්නෙ දෙයක් නැති බව. දර්ශනය දකින කෙනාට මේ එකම තැනක දෙයක් හම්බ වෙන්නෙ නැහැ. 'සෙන්සස්' ටික විතරයි පේන්නෙ. හැබැයි එකපාරටම

වෙන්නෙ නැහැ. ඒක නිසා අදියර කීපයක් තියෙනව. මුලින් 'සවිතක්ක සවිචාරං' අරමුණ බැසගත්තොත් අර සතර සම්‍යක් ප්‍රධාන වීර්ය තමයි තියෙන්නෙ. ඒ කියන්නෙ අනුප්පානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය උප්පානං පාපකානං අකුසලානං ධම්මානං ප්‍රහානාය ඡන්දං ජනේති වායමතී වීර්යයන් චිත්තං පග්ගංහාති  පජහාති එකම විදියට යනව. ඒකට ඡන්දයක් තියෙනව. අර ගලක් පෙරළෙනව වාගේ කතාවක් තියෙන්නෙ. එතකොට මේ එන අරමුණෝ සත්‍ය සැකල මිදෙනව කියන එක. මේ සතර සම්‍යක් ප්‍රධාන වීර්ය තියෙන්නෙ 'උපංපාපක සිත' කියන්නෙ මේ විඤ්ඤාණ මායාවෙන් දෙයක් කියල 'ගත්ත සිත.' ඒක දැකල ඒකෙන් මිදෙනව. 'අනුප්පානං පාපකානං අකුසලානං ධම්මානං ප්‍රහානාය' කියන්නේ එයාට මේ 'අනුප්පානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය' එතන ඉපදුණ සිතේ මෙතන දෙයක් කියල ගත්තොත් විඤ්ඤාණ මායාව දෙයක් කියල ගත්තොත් ඒකෙ සත්‍ය දැකල අන්න ඒක සිතට පෙන්නනව. බැස ගත්තොත් ඒකෙ සත්‍ය දැකල මිදෙනව. නැත්නම් ඒ සිත හටගන්න කලින් මෙයා ධර්මය දකිනව. ධර්මය දැකල ඊට පස්සෙ මෙයා මේ ධර්මය තුළින් දකින කොට මෙයාට හැම දෙයක්ම දෙයක් වෙන්නෑ. අර 'අනුප්පානං පාපකානං අකුසලාන ධම්මානං අනුප්පාදාය' ඒක මතුවෙන් නැහැ.

**ධර්මය දකින කොට අනුප්පානං කුසලානං ධම්මානං උප්පාදාය ඒ කියන්නෙ මෙයා සිහිය දියුණු කර ගන්නව, ඒ කියන්නෙ මෙයාට දෙයක් නැති බව මෙනෙහි වෙනව.** මෙනෙහි වෙන කොට එයාට අර කුසලසිත තමයි උපදින්නෙ. "උප්පානං අනුප්පානං කුසලානං ධම්මානං උප්පාදාය' ඊට පස්සෙ **'උප්පානං කුසලානං ධම්මානං ඨිථියා භියෝභාව වේපුල්ලයාය භාවනා පරිපූරාය' 'ඡන්දං ජනේති වායමති වීරියං ආරභති චිත්තං පග්ගංහාති පජාහති. අන්තිමේදි ඒ කියන්නෙ මේ ස්වභාවය එතන 'උපන් සිතේ' අරමුණ මෙයාට නිරායාසයෙන්ම සවිතක්ක ස්වභාවය නෙවේ අවිතක්ක ස්වභාවයෙන්. ඒ 'ඨිථියා භියෝභාව' ඒ කියන්නෙ එයාට එන එන හැම සිතම මිදිලා තියෙන්නෙ.** දෙයක් වෙන්නැහැ ගින්නක් නැහැ. සිත ඇතිවෙනව බිත්තිය කියලත් දන්නව. දරුවො කියලත් දන්නව. ගෙවල් කියලත් දන්නව. ඒකත් එක්ක කම්පනයක් නැහැ. සාමාන්‍ය විදියට කටයුතුත් කරනව කිසිම වෙනසකුත් නැහැ ගින්නකුත්

නැහැ. අන්න 'ධීපීයා භීයෝභාව' එතනත් ඡන්දයක් තියෙනව. ඒක සතුටින් පවත්වාගෙන යනව. භාවනා පරිපූරාය ඡන්ද ජනේති වායමතී එතන විදර්ශනා භාවනාවක් තියෙනව. එතන 'අලමරිය ඥාණ දර්ශනය' කියලත් කියනව. 'අධිගත සමාධිය' කියලත් කියනව. 'භාවනා පරිපූණය' කීවෙ ඒකයි. විදර්ශනා භාවනාව එතනින් තමා පරිපූර්ණ වෙන්නෙ. 'ඛණිත සමාධිය' එතන තියෙනව. ඒක තමා අරමුණෝ සත්‍ය දැකල මිදෙන තැන.

මේක අර අභිධර්මය පැත්තෙන් ගත්තම දෙයක් වගේ දැනෙන ගතිය. අර කම්පනය 'අබොප්පා චේතෝ විමුක්තිය' කියනව. අභ්‍යන්තරයේ සිහියට තමයි හසුවන්නේ කම්පනයක් කියල දෙයක් වගේ දැනෙන එක. සාමාන්‍ය විදියට පේනව ඇහෙනව දැනෙනව කතා බව කරනව. හැබැයි ඒවා එකක්වත් දෙයක් වෙලා නැහැ. හැබැයි බිත්තිය දකින කොට බිත්තිය දැකපු බවට සිහියක් තියෙනව. බිත්තිය කම්පනයක් දෙයක් වුණා නම්, ඒක අන්න සිහියට අසුවෙනව. ඒ කම්පනයම තමයි අර අංශුව මැද්දෙ තියෙන බලය කම්පන බලය. ඒක තියෙනකම්ම අසුවෙනව කියන්නේ කම්පනය ආත්ම සංඥාව කියන්නත් පුළුවන්, ඕක තියෙනව ආත්ම දෘෂ්ටිය තියෙනකම්. මෙතන කෙනෙක් ඉන්නව කියල හිතනකම් ඒක නැතිවෙන්නෙ නැහැ. ඉස්සෙල්ලම දෘෂ්ටිය කුඩුවෙන්න ඕන.

දෙයක් තිබ්බොත් තමයි මමත් ඉන්නෙ කියල අර දර්ශන ඥානය තියෙන්නෙ ඔන්න ඔතනයි. දෙයක් තිබ්බොත් මාත් ඉන්නව. දෙයක් නැත්නම් මමත් නැහැ. 'නේතං මම නේසෝ හමස්මිං නමේසෝ අත්තා' කියන තැනට එන්න ඕන. 'දර්ශන ඥානය' එතන කුඩුවෙල, ඔක්කොම සුද්ධ වෙලා යන්න ඕන. ශබ්ද කොහොමද හැදෙන්නෙ වර්ණ කොහොමද හැදෙන්නෙ ඒව එකතු වෙලා ආත්ම සංඥා හැදෙන්නෙ කොහොමද ආත්ම දෘෂ්ටිය කියන්නෙ මොකක්ද දෙයක් තිබ්බොත් ඒ දැනෙන එකම නේද මේ ආත්ම සංඥාව. ඒකම නේද මේ ආත්ම දෘෂ්ටිය. දෘෂ්ටිය තුළ මම ඉන්නව කියල හිතෙනව, අර සිතුවිල්ලත් තියෙනව.

තමන්ටම තමන්ගෙ අභ්‍යන්තරය හොඳට හසුවෙන්නත් ඕන. තමන් තමන්ගෙම කෙලෙස් දකිනව කියන්නෙ, අර කම්පනය අසුවෙනව. අර කම්පනය තව දියවෙවී යනව, අන්න ඒක ආසවඛ්‍යා ඥානය' අර කම්පනය අඩුවෙනව. ආසවඛ්‍යා ඥානය තියෙනව කියන්නෙ තමන්ගෙම

කෙලෙස් ක්ෂය වෙවී යනව අසුවෙනව. ඔය කම්පනය අනුව තමයි මානීය මක්කටෝ අතිමානීය කුක්කුරෝ කියල කියන්නෙ හුස්ම ගියොත්, මානය කියන්නෙ කම්පනය. කම්පනය වැඩි නම් අන්න කියනව ඝන සංඥාව, ඝන සංඥා කියන්නෙ කම්පනය වැඩී. අන්න ඒ අනුව මානය ටිකක් තිබුණොත් වඳුරෙක් වෙනව. තව ටිකක් වැඩි නම් බල්ලෙක් වෙනව. ඕක තමා ෆ්‍රීකොන්ස් එක අහුවෙන සිස්ටම් එක. ඔය දෘෂ්ටිගත අයගෙ අහුවෙන සිස්ටම් එක. දෙයක් තියෙනව නම් කම්පන ස්වභාවය අනුව මේ ෆ්‍රීකොන්ස් සිස්ටම් එක අහුවෙන එක. ඕක සකස් වෙන හැටි වෙනව කියනව. ඊට අමතරව මේක දියවෙන හැටි බුදුන් වහන්සේ පෙන්වා දෙනවා. මේක දියවෙන හැටි පෙන්නනව. මේ නිවන කරා යන හැටි. ඒ නිවන කරා යන හැටි ඔන්න ඔතනින් හොඳට අහුවෙනව. ඒ කම්පන වෙන ස්වභාවය අභ්‍යන්තර සිහියට අහුවෙන්නෙ. ඒ නිසා අපි මෙහෙම කටින් කීවට ඔබට හරියන් නැහැ. ඔබට දැනෙන්නම ඕන. දැනිල ඔබට 'ආසවඛ්‍ය ඥානය' තියෙන්නම ඕන. ත්‍රිවිද්‍යා නැතුව නිවන් දකින්නෙ නැහැ. දර්ශනයට ඕන පුබ්බේ නිවාසානුස්සති ඥානය පෙරසිත් හැදෙන හැටි දකින්න ඕන. එහෙම වුණොත් තමයි මේ මොහොතෙ සිත හටගෙන නිරුද්ධ වන හැටි දකින්නෙ. ඔය ඔක්කොම ශුද්ධ වෙලා තියෙන්න ඕන.

**'අවුත්වා සම්භූතං වුත්වානං භවිස්සති' කියල මේ මොහොතෙම හටගෙන නිරුද්ධ වන සිත එයා දකින්න ඕන. එහෙම දකින කෙනාට උත්පත්තියත් මරණයත් නැහැ. මෙතන තියෙන්නෙ ශබ්ද වර්ණ ටිකක් විතරයි. මේකෙ 'සිස්ටම්' එක හොඳට පේන්න ඕන.** හැබැයි 'සිස්ටම්' එක පෙනිල නිවන් දකින්නෙත් නෑ. ඊට පස්සෙ, අභ්‍යන්තර 'සිස්ටම්' එක පේන කෙනාට දියවෙන එක දැනෙනව. 'ආසවඛ්‍ය ඥානය' පුබ්බේනිවාසානුස්සති ඥානය පෙර විසූ කඳ පිළිවෙළ දැක්කා. ඒක නිසා චුතූපපාත ඥානය ඇතිවෙන්නෙ, ඒක නැතිව 'චුතූපපාත ඥානය' ඇතිවෙන්නෙත් නැහැ. මේ මොහොතෙ සිත දැක්කා, දෙයක් නැති බව දැක්කා. ඒක දැකපු කෙනාට තමයි ආසවඛ්‍යය ඥානය අසුවෙන්නෙ. එහෙම නැතුව ඒක අසුවෙන්නෙත් නැහැ. මේ එකකට එකක් සම්බන්ධයි. ත්‍රිවිද්‍යා නැතුව නිවන් දකින්නෙත් නැහැ. එතකොට ආසවඛ්‍යය ඤානය තුළ දැන් මේ එකක්වත් මේ විදියට පිළිවෙළට තියන්න බැරි වුණත් කෙනෙක්ගේ අභ්‍යන්තරයට කම්පනයක් නොවන ස්වභාවය අසුවෙලා

නිවන් දකින අය ඉන්නවා. එයාට මේ දැනුම නැහැ. මෙතන විග්‍රහ කරන්න බැහැ. දන්න කෙනා කතා කරන ඒවත් එහෙම තේරෙනවා. කොච්චර ප්‍රමාණයක් කම්පනය වෙනවද නැද්ද කියලා. සමහරවිට අර කියන පිළිවෙළට කියා ගන්න බැහැ. නමුත් දැන් අභ්‍යන්තර කම්පනය දියවෙවී යන ස්වභාවය තුළ මෙයා යනව. එයා මාර්ගයට පිළිපන්නයි. එයා නිවන් මග යනවා. ධර්මය විග්‍රහ කරගන්න බැහැ. නමුත් සුනීත සෝපාකලා ඒ කාලේ, ඒ වගේ දේවල් අපිට ධර්මය තුළ අහන්න ලැබෙනව.

මෙතනදි අභ්‍යන්තරයට සිහිය අසුවන ස්වභාවය තමයි තමන්ගෙම රාග, ද්වේෂ, මෝහ ස්වභාවය. විශේෂයෙන්ම මාන්නය. මොකද 'දස සංයෝජන'වලත් අන්තිමට අහුවෙන්නෙ සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ, රූප රාග, අරූප රාග, මාන උද්ධච්ච, අවිද්‍යා. එතකොට මේ 'මාන්නය' කියන එක ඇත්තටම මේ ඕකකොම එකම කතාව. අභ්‍යන්තර දෙයක් වගේ දැනෙන එකම තමා මාන්නය. මාන්නය කීවත් එකයි. රාග, ද්වේෂ, මෝහ කීවත් එකයි. ඔක්කොම එකම කතාව තියෙන්නෙ. දැනෙන ගතියට මේකෙ තියෙන්නෙ. මම මේ ඉන්නව වගේ දැනෙනව. තව පැත්තකින් දෙයක් වගේ දැනෙනව. දෙයක් වගේ දැනන එකමයි. මම මගේ දැනෙන්නෙ. වචන ගොඩක් විතරයි. ඇත්තටම මෙතන නැතිවෙලා තියෙන්නෙ අවිද්‍යාව. අවිද්‍යාව කියන්නේ දෙයක් වගේ දැනෙන එකමයි. ශබ්දවල දෙයක් තිබුණොත් නැහැ. වර්ණවල දෙයක් තිබුණොත් නැහැ. මේ ඔක්කොම සිතිවිලි හටගන්නෙ ශබ්ද වර්ණවලින්නෙ. ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස තව විදියකට ගත්තොත් 'ස්පාක්' වලින්නෙ. 'ස්පාක්'වල දෙයක් නැහැනෙ අන්තිමටම දුරුවෙලා තියෙන්නෙ. ස්පාක් එක අවිද්‍යාව, දෙයක් කියල දැනෙන එකක අවිද්‍යාව. ඇයි 'ස්පාක්' වෙන දේ. දෙයක් හම්බ වෙන්නෑ. දෙයක් කියන්නෙම ආරෝපණය. ආරෝපණය තියෙනකම් 'සසර ඕඝය' තියෙනව. අවිද්‍යාව තියෙනකම් ෆ්‍රීකොන්ස් එකට අහුවෙනවා. ෆ්‍රීකොන්ස් එක එතනින් ඉවරයි. අහුවෙන්නෙත් නැහැ. අංශු කම්පනයත් ඉවරයි. සේරම ඉවරයි. අන්න අභ්‍යන්තර කම්පන දියවෙලා යන ස්වභාවය. ඒක තමයි ඤානයට හසුවෙන්නෙ. 'ඤායස්ස අධිගමාය' කියන්නෙ මේකමයි. තමන්ම හරියට මේ සිරස දෙරණ වගේ රේඩියෝ චේව් එකක් හරියට ටියුන් කරනව වගේ වැඩක්, රේඩියෝ එක අපට ටියුන් කරන්න බැහැ.

ඇයි ඒ අපිට 'සෙන්සර්' එකක් නැහැ ඒක අල්ලන්න. **හැබැයි අපිට මේ ආත්ම සංඥාව ශූන්‍ය කරන්න පුළුවන්. ඒක තුළ අපි මෙතන කම්පනය වන ස්වභාවය ශූන්‍ය කරනව කියන්නෙ ආයි කොහෙවත් කම්පනය ඉවරයි ඔක්කොම කුඩුවෙලා.** මේකම තමයි කතාවෙ තියෙන්නෙ. මට හිතෙනවා මේක දැනට ප්‍රමාණවත්. තෙරුවන් සරණයි.

**උපාසකතුමා:** උන්වහන්සේ මේ කැපකිරීම කරන්නේ ඇත්තටම අවුරුදු දෙදහස් පන්සියයක් ගිහිල්ලත් නිය පිටට ගත් පස්පිඩක පොඩි ප්‍රමාණයක් තරම්වත් අවස්ථාවක්, එම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නා ලෙස ඉල්ලනවා. අද දිනත් ඔබවහන්සේගේ දෙපා නමදිනව සියලුදෙනා වෙනුවෙන්. ඒ දැක්වූ කල්‍යාණ මිත්‍රත්වයට සහ ඒ පැහැදිලි කිරීම බුද්ධ දේශනාවේ පර්යායන් ඒ ආකාරයෙන්ම අපට දැනෙන හැඟෙන වචනවලින්. හැබැයි ඒ වචනවලින්මයි අපි රැවටෙන්නෙ. මොකද භාෂාව පොහොසත් නැහැ. අවබෝධය ප්‍රකාශ කරන්න. ඒ භාෂාවට එහා ගිහිල්ල ඉන්න ඔබවහන්සේ ප්‍රකාශ කරන දේ අවබෝධ කර ගත්තොත් අපිටත් නිවන තියෙන්නෙ එතැනයි. ඉතින් අද දිනට සියලුදෙනා වෙනුවෙන් ඔබ වහන්සේගේ දෙපා නමදිනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ආරණ්‍ය සේනාසන කටයුතු වෙනුවෙන් දායක වමට දැන් ඔබටත් අවස්ථාව උදා වී ඇත.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 100800597511

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

කුසට අහරක් හිතට සරණක් යන තේමාව යටතේ
අසරණයින්ට පිහිට වීම උදෙසා මෙම සත්කාරය දියත් කර ඇත.
ඒ වෙනුවෙන් ඔබටත් දායක විය හැක.

මෙත්මල් අරණ සමාජ සේවා පදනම

ගිණුම් අංක : 100800598542

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
11. The true dhamma has awakend, volume 2
12. The true dhamma has awakend, volume 3
13. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
14. ආර්ය කමටහන්
15. ලොවම දෙදරයි
16. සූත්‍ර දේශනා 01
17. සූත්‍ර දේශනා 02
18. මේ ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීම
19. නොපෙනෙන සත්‍යය